
# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ නිකිණි පුර පසළොස්වක පෝදා 2022 අගෝස්තු 11 බ්‍රහස්පතින්දා BUDUSARANA THURSDAY AUGUST 11, 2022
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 09 පත්‍රය, පිටු 36 ආරම්භය 1965 - 06 - 13 මිල රු.50.00



# සම්බුදු සසුන සුරැකීමේ මුල් පියවර තැබූ නිකිණි පෝදා

**සම්බුද්ධ ශාසන ඉතිහාසයට සහ ලංකා ශාසන ඉතිහාසයට එක්වන සදඅනුස්මරණීය ඓතිහාසික සිදුවීම් කිහිපයකට ම මුල් වූ දිනයකි නිකිණි පුර පසළොස්වක පොහොය දිනය.**

ප්‍රථම ධර්ම සංගායනාව ආරම්භ කිරීම, ආනන්ද හිමි රහත් භාවයට පත්වීම, පෙරවස් මඟහැරී ගිය භික්ෂූන් වහන්සේ පසුවස් එළඹිය යුතු දිනය ලෙස බුදුරදුන් විසින් නම් කරනු ලැබීම, බුදුරදුන්ගේ ලලාට ධාතු නිධන් කර සේරුවිල දාගැබ තැනවීම ආරම්භ කිරීම, පුරාතන අරියවංස දේශනා උත්සවය සිදු කිරීම සහ මහනුවර ඇසළ මහා පෙරහරේ අවසන් රන්දෝලි මහා පෙරහර වීථි සංචාරය කිරීම යන කරුණු නිකිණි පොහොය හා සම්බන්ධව වැදගත් වන සිදුවීම් ය.

### දැඩි වැළපීමක්

මහා කාශ්‍යප මහරහතන් වහන්සේ පන්සියයක් පමණ වූ භික්ෂූන් වහන්සේ ද සමඟ පාවා නුවර සිට කුසිනාරා නුවර කරා දිවෙන දීර්ඝ වූ මාර්ගයට පිවිසුනහ. එහිදී ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණය පිළිබඳ වූ පුවත උන්වහන්සේලාට සැළ වුණි. ඒ සමගම එහි සිටි මාර්ගඵල නොලැබූ භික්ෂූන් වහන්සේ අතරින් ද ඇතැමෙක් ඉතා දැඩි සේ වැළපෙමින් හිසෙහි අත් බැඳ හඬා වැටුනහ. උන්වහන්සේගේ මුවින් මහ හඬින් මෙවන් වදන් පෙළක් කියවුණි.

"ඉතා ඉක්මණින් භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑ සේක. ඉතා ඉක්මණින් සුගතයන් වහන්සේ පිරිනිවන් පෑ සේක. ඉතා ඉක්මනින් ලෝකයෙහි ඇස අතුරුදහන් වූයේ ය."

සිඳලූ දෙයක් බිමට වැටෙන්නාක් මෙන් සමහරෙක් බිම වැටුනහ. ඉදිරියට පෙරලුනහ. පසුපසට පෙරලුනහ. එහි සිටි වීතරාගී භික්ෂූන් වහන්සේ මනා සිහියෙන් හා නුවණින් යුතුව මෙම සිදුවීම ඉවසූහ. ඉක්බිතිව මහා කාශ්‍යප මහරහතන් වහන්සේ මෙකී භික්ෂූන් වහන්සේ අමතා මෙසේ වදාළහ.


ඇවැත්නි, කම් නැත. ශෝක නො කරවු. නොවැළපෙවු. ප්‍රියමනාප වූ සියල්ලෙන් ම වෙනස්වීම, වෙන්වීම, වෙනත් ආකාරයක දෙයක් සිදුවීම වන්නේ ය, යන මෙය භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දේ නොවේ ද? යමක්, උපන්නේ ද, හට ගත්තේ ද, ලෞකික වූයේද, නැසෙනසුලු වේ ද, එය ඒකාන්තයෙන් නොනැසේවා'යි, යන මෙය කොහි ලැබිය හැකි වේ ද? ලැබිය හැකි නොවේ ම ය.

### විනය විරෝධී ප්‍රකාශය

සුභද්‍ර නම් වූ මහලුව පැවිදි වූවෙක් එදා මෙම පිරිස අතර සිටියේ ය. ඉක්බිතිව එම පැවිද්දා භික්ෂූන් වහන්සේ අමතා මෙසේ කීය.

ඇවැත්නි, කම් නැත. ශෝක නො කරවු. නො වැළපෙවු. අපි ඒ මහා ශ්‍රමණයාගෙන් මනාව මිදුනෝ වෙමු. මෙය තොපට කැප ය. මෙය තොපට නො කැප යැයි කීමෙන් උපද්‍රවයට ද පත් කරන ලද්දෝ වෙමු. දැන් අපි යමක් කැමති නම් එය කරන්නෙමු. යමක් නො කැමැත්තෙමු නම් එය නො කරන්නෙමු.

මෙම දැඩි විනය විරෝධී ප්‍රකාශය හමුවේ මහා කාශ්‍යප මහරහතන් වහන්සේ තීරණය කළේ අධර්මය බැබළීමටත්, ධර්මය බැහැර කරනු ලැබීමටත් පෙර, අවිනය බැබළීමටත් විනය බැහැර කරනු ලැබීමටත් පෙර, අධර්මවාදීන් බලවත්වීමටත් ධර්මවාදීන් දුබලවීමටත් පෙර, අවිනයවාදීන් බලවත්වීමටත් විනයවාදීන් දුබලවීමටත් පෙර ධර්මය ද, විනය ද සංගායනා කළ යුතු බව යි.



ඌරුගමුවේ අස්සජී හිමි

### දුර්වල පුද්ගලයන් රැසක්

සුභද්‍ර වැනි දුර්වල පුද්ගලයකු ගේ ඒකපුද්ගල ප්‍රකාශයක් පමණක් ම සංගායනාවක් පැවැත්වීම කෙරෙහි හේතු නොවී ය. සුභද්‍ර හා සමාන ආකල්පවලින් යුතු පසුතලයක පිහිටා සිට ක්‍රියා කළ දුර්වල පුද්ගලයන් රැසක් හා ඔවුන් හා අනුගත ව සිටි අනුගාමිකයින් රැසක් ද එකල සිටියහ. දේවදත්ත, සාතිය, අස්සජි , පුනබ්බසුක, සුනක්ඛත්ත, ඡන්න යනාදී භික්ෂූහු බුදුරදුන් ධරමානයෙහි දී ම ධර්මවිනය තම තම රුචි අරුචිකම් අනුව විග්‍රහ කිරීමට පෙළඹුණහ.

බුදුරජාණන් වහන්සේ හමුවේ ඒවා යටපත් වුව ද සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු පශ්චිම ජනතාවගේ අවබෝධය සඳහා ධර්ම විනය සුරක්ෂිත කොට තැබීම ශාසනභාරධාරී මහතෙරුන් වහන්සේලාගේ වගකීමක් ව පැවතිණ. ඒ අනුව තෘතීය මහා ශ්‍රාවක, මහා කාශ්‍යප මහරහතන් වහන්සේ දුර්මත නිරාකරණය පිණිසත්, බුදුරජාණන් වහන්සේ ඒ ඒ ස්ථානවල දී දේශනා කළ නා නා වර්ගයනට අයත් ධර්ම කොට්ඨාසයන් ක්‍රමානුකූලව සකස් කොට බොහෝ කල් පවත්වා ගැනීම පිණිසත් ධර්ම සංගායනාවක අවශ්‍යතාව තීරණය කළහ.

ධර්ම සංගායනාවට සහභාගි වීම සඳහා මහා කාශ්‍යප මහරහතන් වහන්සේ එකුන් පන්සිය නමක් (499) මහ රහතන් වහන්සේ එක්රැස් කළ හ. ඉක්බිති මහා කාශ්‍යප මහ තෙරණුවෝ භික්ෂූන් වහන්සේගේ ද අනුමැතියෙන් ආනන්ද තෙරණුවන් ද සංගායනාවට තෝරා ගත්හ. ආනන්ද තෙරුන්ගෙන් තොරව සංගායනාව සිදු කළ නොහැකි බැවිනි. ඒ සමඟම ධර්ම සංගායනාවට භික්ෂූන් වහන්සේලා පන්සිය නමක් වූ හ. එබැවින් මෙය පංචසතිකා විනය සංගීතිය නම් විය.

### අලංකාර මණ්ඩපයක්

සංගායනාව පැවැත්වීමට රජගහනුවර තෝරාගත් අතර අජාසත් මහරජුගේ පාලනය යටතේ පැවති හෙයින් එහි රාජකීය බලය හා ආරක්ෂාව ද නො අඩුව තහවුරුව පැවතිණ. අජාසත් මහ රජු විසින් වේභාර පර්වත ප්‍රාන්තයෙහි සප්තපර්ණි ගුහාද්වාරයෙහි විශ්ව කර්මයා විසින් නිමවන ලද්දක් වැනි වූ මණ්ඩපයක් කරවන ලදී. එය රාජ භවනයක ශ්‍රී විභූතිය යටපත් කරන්නා වූ දෙව් විමනකට අපහාස කරන්නාක් වැනි වූ සිරියෙන් යුත් ශ්‍රී නිකේතනයක් හා සමාන සියල්ල එක් රැස් කළ මණ්ඩපයක් විය.

### ආනන්ද හිමි රහත් බවට

ධර්ම සංගායනාවට පෙර දින ආනන්ද තෙරණුවෝ මෙසේ කල්පනා කළහ. " හෙට සංගායනාව ය. මම රහත් නො වූයේ සංගායනාවට යන්නෙම් නම් එය මට නිසි නොවෙයි." මෙම කරුණ සලකා බැලූ ආනන්ද තෙරණුවෝ රාත්‍රියෙහි බොහෝ වේලාවක් කායගතාසතිය හෙවත් කය පිළිබඳ වූ සිහියෙන් කාලය ගත කළහ. රාත්‍රිය පහන්වන වේලාවෙහි සැතපෙමි යි, සිතා ශරීරය හැර වූහ. පාදයෝ පොළොවෙන් මිදුණහ. හිස ද කොට්ටයට නොපැමිණියේ ය. මේ අතරෙහි සිත උපාදාන නොකොට ආශ්‍රවයන්ගෙන් මිදුණේ ය. ඉන්පසුව සතර ඉරියව්වෙන් තොරව ආනන්ද තෙරණුවෝ රහත් භාවයට පත්වූවාහු ම සංගායනාවට වැඩම කළ සේක.

### පළමුව විනය

එසේ ආනන්ද මහරහතන් වහන්සේගේ ද වැඩමවීමෙන් පසුව මහා කාශ්‍යප මහරහතන් වහන්සේ පිරිස ඇමතූහ. "ඇවැත්නි, ධර්මය ද විනය ද යන දෙකෙන් පළමුව කුමක් සංගායනා කරමු ද?" එයට මහරහතන් වහන්සේ දුන් පිළිතුර මෙසේ විය.

භන්තෙ මහා කස්සප , විනයො නාම බුද්ධසාසනස්ස ආයු, විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති, තස්මා පඨමං විනයං සංගායාම.

ස්වාමීනි, මහා කාශ්‍යප තෙරුන් වහන්ස, විනය නම් බුද්ධ ශාසනයේ ආයුෂය'යි. විනය පවත්නා කල්හි ශාසනය ද පවතියි. එම නිසා පළමුව විනය සංගායනා කරමු.

පසුව පළමුව උපාලි තෙරුන් වහන්සේගෙන් විනය පිළිබඳව ද, ආනන්ද තෙරුන් වහන්සේගෙන් ධර්මය පිළිබඳ ව ද විමසීය. ඊළඟට සිදු වූයේ බුද්ධානුබුද්ධක සික්ඛාපද කථාව සහ බ්‍රහ්මදණ්ඩ කථාව යි.

### භාණක පරම්පරා

මෙසේ නිකිණි පොහොය දිනෙක ආරම්භ වී සත් මසක් මුළුල්ලේ පැවැති ප්‍රථම ධර්ම සංගායනාව අවසානයේ දී ස්ථාවර කර ගත් ධර්මය මතු අනාගතය සඳහා, කට පාඩමින් සුරක්ෂිත කර ගැනීම භාණක භික්ෂු පරම්පරාවනට පවරා දුනි. ඒ අනුව දීඝනිකාය , ආනන්ද තෙරුන්ට හා ඒ ආශ්‍රිත නිශ්‍රිතයන්ටත්, මජ්ඣිම නිකාය පිරිනිවි සැරියුත් තෙරුන්ගේ ආශ්‍රිත නිශ්‍රිතයන්ටත්, සංයුක්ත නිකාය මහා කාශ්‍යප තෙරුන්ට හා ආශ්‍රිත නිශ්‍රිතයන්ටත්, අංගුත්තර නිකාය අනුරුද්ධ තෙරුන්ට හා ආශ්‍රිත නිශ්‍රිතයන්ටත්, ඛුද්දක නිකාය පොදුවේ සෑම භික්ෂූන් වහන්සේ නමකටමත් පැවරුණි.

ත්‍රිපිටකය ලක්දිව ග්‍රන්ථාරූඪ වන තෙක් ම බුදුදහම විරාත් කාලයක් පවත්වාගෙන ඒම සඳහා හේතු වූයේ මෙම භාණක භික්ෂු පරම්පරා ක්‍රමයයි. මේ අනුව බුදුදහම ක්‍රමානුකූල පදනමක් මත ස්ථාවර වූයේ නිකිණි පොහොය දිනෙක ඇරඹි ප්‍රථම ධර්ම සංගායනාවෙන් පසුවයි.

# අනපේක්ෂිත සිදුවීම් කුඩා දරුවාට ද පොදුයි

## ඉවසීම දරාගැනීම පුරුදු කරන්න

**දරුවා සිල්වත් කරලීම මව්පියන් සතු මූලික වගකීමකි. සිල්වන්තයා තුළ ඇත්තේ ආදරණීය බවයි. මමත්වයෙන් තොර පරාර්ථකාමී ආකල්පයි. හැඟීම් මත පදනම් නොවූ විනිවිද දකින විචාරපූර්වකත්වයයි. මෙවැනි ප්‍රතිපත්ති මව්පිය චර්යාව තුළ ගොඩනැඟීම තුළින් දරුවා සුපසන් ව සමාජගත කිරීමට මව්පියන්ට හැකි වේ.**

සාම ජාතකයේ එන සාම කුමාරයා බෝධිසත්ව ගුණෝපේත උතුමෙකි. මව පියාගේ දෙනෙත් අන්ධ වීම දුකට මෙන් ම සතුටට ද කාරණයක් බව සාම කුමරු සිතයි. එසේ සිතන්නේ තමන්ට මව්පියන්ට සැලකීමට අවස්ථාවක් සැලසී ඇති නිසා ය. දරුවා මව්පියන්ට සැලකිය යුතු ය. නූතන දරුවාට මෙය අවබෝධ කරලීම වඩාත් වැදගත් වේ. මවට පියාට උපස්ථාන කිරීම ද මංගල කාරණාවක් වේ.

මව්පියන් දරුවන්ට තමන් විඳි දුක් ලබාදීමට අකැමැති ය. තමන්ට වඩා සුරලොවක් දරුවන්ට ලැබීමට අපේක්ෂා කරයි. දරුවාට දුක තේරුම් කළ යුතු ය. දුක අවබෝධ වීමට ඉඩ ලබාදිය යුතු ය. ජීවිතයක ඇති කටුකත්වය, අමිහිරි බව දරුවා විසින් ම තේරුම් ගැනීම යථාර්ථවාදී වේ. අවබෝධයකින් තේරුම් ගත් ජීවිත රටේ ජීවනාලියට මඟ කියන්නෝ වෙති. එවැනි වටපිටාවකට දරුවා යොමු කිරීම සාධනීය කාරණාවකි.

බරණැස් නුවර රජ මුව දඩයමේ ගොස් මුවන්ට විදි හී පාරක් සාම කුමරුට වැදී සාම කුමරු අනතුරට ලක් වූ පසු මව්පියන්ගේ උතුම් ප්‍රාර්ථනා මහිමයෙන් සාම කුමරුට යළි ජීවිත භාග්‍ය උදාවීය.

සාම ජාතකය තුළ බරණැස් රජු මුව දඩයමේ ගොස් මුවන්ට විදි හී පහර සාම කුමරුට වදින්නේ ය. ඒ සිතාමතා නොකළ දෙයකි. අනපේක්ෂිත සිදුවීමකි. දරුවාට ද අනපේක්ෂිත සිදුවීම්වලට මුහුණ දීමට සිදුවේ. නොහිතන අවස්ථාවක නොසිතූ දෙයක් සිදුවිය හැකි ය.

එවැනි අවස්ථාවකට මුහුණ දීමට දරුවාට කායික, මානසික ශක්තිය හා ඉවසීම, දරාගැනීම යන මානසික ගුණාංග පුරුදු පුහුණු කර තිබිය යුතු ය. එවැනි ගුණාංග ඇති දරුවන් සමාජගතවීම තුළ රටේ අවශ්‍යතාවන්ට අවැසි දරු පරපුරක් බිහිකිරීමේ අවකාශය නිර්මාණය වේ.

සාම කුමරුගේ චරිතය මෛත්‍රිය මූලික වූවකි. දස පුණ්‍ය ක්‍රියාවලට ප්‍රමුඛස්ථානය ලබා දේ. දරුවා තුළ ද මූලිකව නිර්මාණය කළ යුත්තේ මෛත්‍රියයි. මානසික අභ්‍යාසයක් ලෙස එය දරුවන් තුළ ගොඩනැංවිය යුතු ය. තමන්ට අනුන්ට හා හැම දෙනාට මෙත් වැඩීම තුළ කායික මානසික නිරවද්‍යතාවක් ගොඩනැඟේ. වෛරී මූලික හැඟීම්, තවත් කෙනකු පීඩාවට පත් කිරීම යන හැඟීම්, මරා ගැනීම්, ගහ ගැනීම් වැනි ක්‍රියාදාමයන්වලට දරුවන් පෙළඹුණු අවස්ථා වර්තමානයේ ප්‍රබලව දැකිය හැකි ය.

දරුවා අරගලකාරී මානසික ස්වභාවයෙන් මුදවා ගැනීමට දරුවා දහම් අධ්‍යාපනයට යොමු කිරීම,

විහාරස්ථාන ඇසුර භාවනා ආදී කටයුතුවලට යොමු කිරීම,

වෙහෙර මලුව ඇමදීම ආදී කටයුතුවලට යොමු කිරීම.

ආදී කොටගත් දස පුණ්‍ය ක්‍රියාවලින් පිරිපුන් චර්යාවලට ළමයා හුරුකිරීම ළමා පරපුරේ ස්වර්ණමයභාවය ඇති කිරීමට හේතු වේ.

විශේෂයෙන් වර්තමානය තුළ දුරකථන හා සමාජ මාධ්‍ය වැනි කාරණා මූලික කරගෙන කුඩා කල සිටම දරුවා හැඟීම්වලට ඉඩ දී ක්‍රියා කරන අයුරු ඒ තුළ ළමා ජීවිතය විනාශයට යන අයුරු ද බොහෝ සිදුවීම් ඔස්සේ අපට දැකගත හැකි ය. මේවා වළ කාලීමට නම් මව්පියන් නිවැරැදි විය යුතු සේ ම දරුවා ද නිවැරැදි මාර්ගයට ගත යුතු ය.

දරුවා නිවැරැදි මාර්ගයට ගැනීමට නම් ළමයාට ඉදිරිය දෙස දූර දර්ශීව බැලීමට හුරු කළ යුතු ය. විචක්ෂණ බව ඇති කළ යුතු ය. සිතාමතා ක්‍රියා කරන මඟ කයා දිය යුතු ය. පන්සිල්, අටසිල් රැකීමට දරුවා පෙළඹවිය යුතු ය. දස පුණ්‍ය ක්‍රියා හා සිල් රැකීමට දරුවා පෙළඹවිය යුතු ය.



දංකොටුව වෑකඩ ජාතික පාසලේ ආචාර්ය
ශාස්ත්‍රපති
**බඩල්ගම සුමේධ තිස්ස හිමි**



## පාණදුර - ගොරකාන ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරස්ථ පුණ්‍ය භූමියේ ඉදිකෙරෙන

ගර්භය තුළට පිවිසිය හැකි ඓතිහාසික

# ගොරකාන "සීවලි මහා සෑයට" ඔබත් දායක වන්න

ගොරකාන - සීවලි මහා සෑයේ පාදමේ මූලික බිම් සැකසීමේ වැඩ සඳහා පමණක් වැය වන රු.5,000,000/- ( ලක්ෂ පනහ ) ක මුදල වෙනුවෙන් තනි හෝ සමූහ වශයෙන් දායකත්වයක් දැරීමට කැමති පින්වත් දනපතියන්ට, ධනපතියන්ට, ව්‍යාපාරිකයන්ට ඉදිරිපත් විය හැක.

| ගිණුමේ නම : සීවලි මහා සෑය අරමුදල | |
|---|---|
| සම්පත් බැංකුව ගිණුම<br>1151 6100 4890 | ලංකා බැංකුව ගිණුම<br>8 5 5 7 7 4 3 9 |
| මහජන බැංකුව ගිණුම<br>148-2-001-6-0038551 | සෙලාන් බැංකුව ගිණුම<br>0400-13126762-101 |




### විහාරස්ථානයට පැමිණෙන ගමන් මාර්ගය.

පාණදුර පරණ පාර (මාර්ග අංක 100 හෝ 183) බස් මාර්ගයේ පැමිණ "ගොරකාන" බස් නැවතුමෙන් බැස, ගොරකාන - ' කීල්ස් ' ආයතනය අසල ඇති ශ්‍රී ධම්මානන්ද මාවතෙන් හැරී විහාරස්ථානයට පැමිණෙන්න.
(පැමිණීමට පෙර දුරකථන මගින් ස්වාමීන්වහන්සේ වැඩසිටින වෙලාවක් ලබාගන්නේ නම් ස්තූතිවන්ත වෙමු.)



මෙම උතුම් පුණ්‍ය ක්‍රියාවට දායකවී පින්කැමැත්තෝ කුසල් වඩවා ගනිත්වා !!!

පින්වත් ඔබගේ පුණ්‍යාධාර "සීවලි මහා සෑය අරමුදල" නමින් දක්වා ඇති බැංකු ගිණුමකට බැර කළ හැකිය. එලෙස බැංකු ගිණුමකට ඔබේ පුණ්‍යාධාරය බැර කොට ඇති බව සනාථ කිරීම පිණිස එම බැංකු ලදුපත හෝ එහි පැහැදිළි පිටපතක් සමග, ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පැහැදිළි අකුරින් ලියා පහත ලිපිනයට තැපැල් කරන්න. එහි විනිවිදභාවය සඳහා පුණ්‍යානුමෝදනා පතක් තැපැල් මගින් ඔබ වෙත එවනු ලැබේ. විහාරස්ථානයට පැමිණෙන පින්වතුන් හට "සීවලි මහා සෑය අරමුදල - කායභාලයය" ට පුණ්‍යාධාර ලබාදිය හැක.

*තෙරුවන් සරණයි !*

සීවලි මහා සෑය අරමුදල
ආරම්භය : ශ්‍රී බු.ව. 2563 / ව්‍ය.ව. 2020


**සියලු විමසීම් :**

ගරු සභාපති,
පූජ්‍ය ලියන්ගහවත්තේ නන්ද ස්ථවිර,
සීවලි මහා සෑය අරමුදල,
ශ්‍රී ගංගාතිලක පුරාණ විහාරය,
ශ්‍රී ධම්මානන්ද මාවත,
ගොරකාන,
කෙහෙල්වත්ත 12550.

විහාරස්ථානය : ☎ - 038 22 97 914
සභාපති හිමි : 071 250 44 46

ස්වාමීන්වහන්සේ පමණක් (බොහෝවිට) පන්සලේ වැඩවසන බැවින් බැහැරට වැඩසිටින අවස්ථාවලදී දුරකථන ඇමතුම් ලබාදීමේදී සැලකිලිමත් වීමට කාරුණික වන්න.

# සිත දෙස බලන්න මොහොතක් වෙන් කරන්න



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද
පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ
උයන්ගොඩ
මෛත්‍රීමූර්ති
මහා නා හිමි**

**ළඟ මිස දුර නොබලන තාක් අනුවණයා, වෛර සිතිවිලිම වර්ධනය කරමින් අවස්ථාව එළඹෙන තුරු බලා සිටිනු ඇත. මෙයින් සිදුවන්නේ තමා නොදැනුවත්ව ම තමන් මුළාවට පත් වීමයි.**

වෛරී සිත දවන්නේ අනුන් නොව තමන් බව වටහා ගත යුතුව ඇත. මේ සඳහා තම ජීවිතය දෙස ආපසු හැරී බැලීම වැදගත් ය. ගෙවුණු ජීවිතයේ අන්‍යයන් ගැන මොන තරම් වෛරී සිතිවිලි පහළ වී තිබුණා ද? එයින් සිදුවුණේ යහපතක් ද? අයහපතක් ද? මෛත්‍රියෙන් කටයුතු කළා නම් ඉන් ලැබෙන සැනසීම මොන තරම් ද? අපගේ ප්‍රශ්න විසඳා ගැනීමට ඒ මෛත්‍රී සිතිවිලි මොනතරම් ශක්තියක් වනවා ද? මෙසේ කල්පනා කරන, නුවණින් විමසන පුද්ගලයාට වෛරී සිතිවිලිවලින් බැහැරව මෛත්‍රී සිතිවිලි වැඩීම පහසුවනු ඇත.

තමන්ට කෙනෙක් වෛර කරනවා නම්, පෙරළා තමන් ද ඒ පුද්ගලයාට වෛර කරනවා නම් එහි කෙළවරක් දකින්නේ කෙලෙස ද? ඉපදෙමින් මැරෙමින් යන සසර ගමන පුරාම දිගින් දිගටම එකිනෙකාට වෛර කරමින්, පළිගනිමින්, දුක් වේදනා පිරුණු ගමනක් යනවා මිස සැපතක් නම් නොලැබෙන්නේය. බෞද්ධ සාහිත්‍යයෙහි එන කාල
යක්ෂණියගේ කතාව මෙයට හොඳ උදාහරණයකි. ඇය එකම ආත්ම භාවයක වඳ ස්ත්‍රියකි. ඇය දරුවන් නො ලද හෙයින් සැමියා තවත් විවාහයක් කර ගත්තේ ය. ගැබ්ගත් අලුත් බිරිය ගැන ඊර්ෂ්‍යාවෙන්, ක්‍රෝධයකින්, වෛරයෙන් ඒ දරු ගැබ විනාශ කරවන්නට ඇය ක්‍රියා කළා ය.

මේ සිදුවීම පදනම් කර ගනිමින් ඒ කාන්තාවන් දෙදෙනා අතර ඇති වූ වෛරය කිකිළියක සහ බැළලියක ලෙස ඉපදුණු ආත්ම භවයේ දී මතුව ආවේ ය. කිකිළිය දමන බිත්තර සියල්ල බැළලිය විසින් කාදමනු ලැබුවාය . ඊළඟ ආත්ම භවයක ඔවුන් මුව දෙනක හා දිවි දෙනක ව ඉපදිණි. දිවිදෙන මුවදෙනගේ පැටවුන් සියල්ල කා දැමුවා ය. ඊළඟ භවයෙ දී මුව දෙන
යක්ෂණියක වී ඉපදිණි. දිවිදෙන මනුෂ්‍ය ස්ත්‍රියක් ව ඉපදිණි. පෙර භවයේ තම පැටවුන් කා දැමීමේ වරදට වෛර සිතින් දුන් දඬුවම මනුෂ්‍ය ස්ත්‍රියගේ දරුවන් දෙදෙනා විනාශ කිරීමයි.

මේ නොසන්සිඳුණු වෛරය සංසාරගතව ක්‍රියාත්මක වූ ආකාරයයි. තුන්වැනි දරුවා ද විනාශ කරන්නට සැරසුණ ද බුදුරදුන්ගේ මහා කරුණාව නිසා වෛරය සංසිඳවා ගන්නට හැකි විය.

බුද්ධිමත් ව ජීවත්වන අයකුගේ ප්‍රධාන වැදගත් ලක්ෂණයක් විය යුත්තේ තමන් කරන කියන දෑ පිළිබඳ ඉතා හොඳින් නැවත නැවත සිතා බලා කටයුතු කිරීමයි. විශේෂයෙන් මෙහි දී සැලකිය යුතු වන්නේ තමන් කරන කියන දේට මුල් වන සිතිවිලිවල ස්වභාවය හඳුනා ගැනීමයි. හොඳ නරක සිතිවිලිවල ස්වභාවයත්, ඒවායේ ප්‍රතිඵලත් අප නිවැරැදිව තේරුම් ගත යුතු ය. හරි – වැරැදි තේරුම් නොගෙන සසර ගමන දුක් ගොඩකට පත්වූ ජීවිත මොනතරම් ද?

එක්තරා, වෛද්‍යවරයකු ඇස් රෝගයකින් පෙළුණු ස්ත්‍රියකට ප්‍රතිකාර කළේ සුව වූ පසුව ඇය තමාගේ සේවිකාවක බවට පත්වන බව පැවැසූ නිසා ය. පොරොන්දු වූ පරිදි ඇය ක්‍රියා නොකළ නිසා වෛද්‍යවරයාගේ සිතට තරහ ආයේ ය. ඔහුට ස්ත්‍රියගෙන් පළිගැනීමට සිතිණි. ඒ දූෂිත සිතින් යුතුව හෙතෙම විෂ බෙහෙතක් පිළියෙළ කර එයින් ස්ත්‍රියගේ ඇස් දෙකම අන්ධ කළේ ය. එහි ප්‍රතිඵල වශයෙන් ඔහුට සසර දී විවිධ දුක් විඳීමට සිදුවූ අතර පැවිදිව රහත් වූ ආත්ම භාවයෙහි දී ඇස් දෙකම අන්ධ විය. ඒ තරම් බරපතළ ලෙස විපාක විඳීමට සිදුවූයේ නරක, නපුරු සිතින් එම ස්ත්‍රියගේ ඇස් අන්ධ කළ හෙයිනි. නරක සිත් උපදවාගෙන පාපී ක්‍රියා කළ හොත් ඒවායේ දුක් විපාක විඳින්නට සිදුවන්නේ අපටම ය.

අන්‍යයන්ට දොස් නඟන්නට කැමැති වුව ද දොස් අසන්නට බොහෝ අය කැමැති නැත. නින්දා අපහාස, ඇණුම් බැනුම් ඉදිරියේ නිහඬ වනවා වෙනුවට පෙරළා අනෙකාට ද එලෙසම පිළිතුරු දෙන්නට ඇතැම් අය ලජ්ජා නොවෙති.

බණ පොතේ සඳහන් වන ආකාරයට එය කෙළවලින් සොටුවලින්, මළ මුත්‍රවලින් අපිරිසුදු වූ තැනක් පිරිසුදු කරන්නට ඒ අයුරින්ම කෙළ, සොටු, මළ මූත්‍රා යොදා ගැනීමක් හා සමාන ය. එහි අවසන් ඵලය කුමක් වේ ද? සිතා ගැන්ම ම පිළිකුල් ය. වෛරී සිතිවිලි ද එවැනි ය. ඔවුනොවුන්ට වෛර කරන්නෝ මේ ජීවිතයේ දී ම මානසික රෝගීහු වෙති. කායික රෝගීහු ද වෙති. සංසාරගත ව ද රෝගීහු වෙති. අනුන්ගේ සම්පත් දැක, දියුණුව, උසස්කම් දැක, කීර්තිය දැක ඒ දෙස වපර ඇසින් බලා ඒ ගැනම සිතමින් වෛරී සිතිවිලි ඇති කර ගන්නවා නම්, ඒ හැම මොහොතක් පාසා ම සිත මොනතරම් ගිනියම් වනවා ද? තමන් වෛර නොකරන්නා සේ ම තමන්ට වෛර කරන අය ගැන ද අනුකම්පා සිතින් බලන්න. ඔහු මානසික රෝගියකු ලෙස සිතන්න.

පිළිගත්ත ද, නොපිළිගත්ත ද වෛර කිරීමේ වරද ඔහුට කියා දෙන්න.

මිනිසුන් ලෙස අප හැම දෙනා තුළම විවිධ දුර්වලකම් විවිධ මට්ටමින් පවතී. ඊර්ෂ්‍යාව , ක්‍රෝධය, වෛරය, පලිගැනීම, ආශාව යන මේ සිතිවිලි සැමට පොදු ය. ගැටලු උපදින්නේ මේවායේ දුර්විපාක අවබෝධ කර නොගැනීම නිසා ය.

ලෞකික වින්දනයක් ම සොයමින් ඒ පසුපස ම හඹායන අප අතර වන තරගකාරිත්වය, අතෘප්තිකර ආශාව හෙවත් අසීමිත තණ්හාව ඉහත කී නරක සිතිවිලි උපදින්නට මූලික හේතුවයි. එහි ප්‍රතිඵලය දුක් කන්දරාවක උරුමයයි.

සිතෙහි ඉපදී සිතම දවන, ගත වෙහෙසන මේ දුර්විපාක හඳුනාගැනීම සතුටුදායක ජීවිතයකට අත්‍යවශ්‍ය ය. ඒ සතුරු සිතිවිලි අයින් කර ගන්නට අප උත්සාහ කළ යුතු ය. සතුරාටත් කරුණාව දක්වන්නට උත්සාහ කරන්න.

අන්‍යයන් තමන්ට වෛර කරන්නේ, ඊර්ෂ්‍යා කරන්නේ ඔවුන්ට තමන්ගේ සිත පිළිබඳ ඇති අනවබෝධය නිසා ය. නින්දා අපහාස ගැන සිත සිතා ඔවුන් විවේචනය කරන්නට සූදානම් නොවන්න. ඒ තුළ තම සිතෙහි ද වැඩෙන්නේ වෛරය ම ය. එය දුක්ඛදායක බව වේදනාත්මක බව, තේරුම් ගන්න. වෛරයෙන් වෛරය නොසංසිඳේ යනු නොවෙනස් වන සදාතනික ධර්මතාවකි. අඩුම තරමේ වෛර කරන්නාට කිසිදු ප්‍රතිචාරයක් නොදක්වා, සිටින්නට හැකි නම් එය ද අගය කරමු.

බුදුරදුහු පෙන්වා දුන් ආකාරයට අපගේ සිතුම් පැතුම් හා හැසිරීම් රටාව වෙනස් කර ගත යුතුව ඇත. පුද්ගලයා නැමැති නෙළුම විකසිත වන්නේ මිනිස් සමාජය නැමැති පොකුණෙහි ය. මවු කුසේ පිළිසිඳ ගැනීමේ පටන් උපත, වැඩිවියට පත්වීම, මහලුවීම, මරණය යන මේ සියල්ල සිදුවන්නේ මේ මඩ සහිත පොකුණ තුළ ය. ඒ තුළ දී අධ්‍යාපනයත්, දිනුම්, පැරදුම්, වාසි අවාසි, නින්දා ප්‍රශංසා යනාදි සියල්ලට ම අප මුහුණ දිය යුතු ය. මේ මඩ සහිත පොකුණ යනු කෙලෙස්වලින් දූෂිත වූ ලෝකයයි. ප්‍රශ්නවලින් පිරුණු මේ කෙලෙස් ලෝකයෙහි ඇලී ගැලී සිටීම අඳුරින් අඳුරට යාමකි. දුකින් දුකට පත්වීමකි. වරදින් තවත් වරදකට යෑමකි. අපිරිසුදු මඬගොඩින් මිදී මඩ වතුරෙන් ද උඩට මතුවී ගිය නෙළුමක් මෙන් මේ සමාජය ඉක්මවා යා යුතුය. එනම් අනුසෝතගාමී නොවී පටිසෝතගාමී විය යුතු ය. වෛර කරන්නන් අතර වෛර නොකර සුව සේ වාසය කළ යුතු ය.

අපගේ සතුටට හා දුකට, මුල්වන්නේ සිත ය. හිමිදිරි උදයේත්, රාත්‍රී නින්දට යන්නට පෙරත් තම සිත දෙස බලන්න මොහොතක් වෙන් කර ගන්න. ප්‍රසන්න මනසකින් අලුත් දිනයට පා තබන්න.



# නිකිණි සුපුන් සඳ දුටු සඳ සිහිවන

# දරමිටි පෝදා අතීත කතාව

**වියැළුණු ඉපනැලි හා ඉරිතැළුණු වැව් තාවුලු සිපගෙන එන සුළඟ නියඟයේ අසිරිය කියයි. සියවසකට එපිට දුර්ග මංමාවත් දිගේ ගොන් කුර හඬත් සමඟ හැඬවුණු මිණිගෙඩි නාදය තවමත් ඒ සුළඟේ මුසුව ඇත. රජරට කොත්කැරළි අතරින් නිකිණි සඳ මෝරන විට අද ජීවිතයේ සැඳෑ සුවය විඳින අයගේ මතකය දරමිටි පෝය තෙක් ගෙනයනු නිසැක ය.**

12වැනි සියවසින් පසු රජරට ශිෂ්ඨාචාරය බිඳවැටී රාජධානිය නිරිතදිගට සංක්‍රමණය විය. එතැන් සිට සියවස් ගණනාවක් තිස්සේ අනුරාධපුරයේ සිද්ධස්ථාන අභාවයට ගියේ ය. මුලදී දකුණු ඉන්දීය ආක්‍රමණ හා වෙනත් පරසතුරු උවදුරු නිසාත්, පසු කාලයේ යුරෝපා ජාතින්ගේ ආක්‍රමණ නිසාත් අනුරාධපුරයේ සිද්ධස්ථාන අභාවයට ගියේ ප්‍රදේශයේ ජන ගහනය ද හීන වෙමිනි.

1869 වසර වනවිට නුවරකලාවියේ ම ඉතිරිව තිබුණේ බෞද්ධ විහාරස්ථාන 113කි. අනුරාධපුර පූජා නගරයේ විහාරස්ථාන දෙකකි. ඒ ශ්‍රී මහා බෝධී ස්ථානයත් රුවන්මැලි මහා සෑයත් ය. මේ පරිහාණි කාල වකවානුවේදීත් ජනීජනයා මහ බෝ මලුව රැක ගැනීමට භික්ෂූන් වහන්සේ හා එක්වූහ.

විශේෂයෙන් බෝමලුවේ ආරක්ෂක රාජකාරියේ නියැළි විහාර ගම්වාසීහු ද, අවට පදිංචිකරුවෝ මෙන් ම, අවට ගම්වැසියෝ ද බෝ මලුවට රැකවරණය දෙන්නට දිවා රෑ කැපවූහ. අගෝස්තු මාසය රජරට නියං සමය වේ. ඒ වනවිට වැව් අමුණු සිඳී වියළී යයි. කෙත්වතු පාළුවන සමයකි. ජල හිඟය ද උත්සන්න වෙයි. සිසිලසක් ඇත්තේ බෝ මලුවේ පමණි. ආහාර හා ජල හිඟයට මුණපාන්නත් අතර වන සතුන් ද වේ. මේ සතා සිව්පාවා අතර කෑම් බීම් සොයා ගම්වදින අලි ඇතුන් බෝ මලුවට ද කඩාපනිති. ඔවුන්ගේ ප්‍රියතම ආහාරයක් වන්නේ බෝ දලු ය.

බෝ මලුව ස්ථර තුනකි. ඒ වැලිමලුව, මැද මළුව හා උඩමලුව වශයෙනි. අද මෙන් එදා වැලි මලුව වටා ප්‍රාකාරයක් නොවිණි. අද දක්නට ඇති ගල් ප්‍රාකාරය වැලි මලුව වටා ඉදිකරනු ලැබුවේ මහ නුවර යුගයේ දී රාජ්‍ය අනුග්‍රහය ලැබූ ඉලුපැන්දෙනියේ අත්ථදස්සී හිමියන්ගේ මූලිකත්වයෙනි. ඊට හේතුව ද අලි ඇතුන්ගෙන් බෝමලුව රැක ගැනීම ය.

වන අලි බෝ මලුවට කරන හානිය වැළැක්වීමට රජරට ගැමියෝ රෑ නොනිදා බෝ මලුවේ මුර කළහ. එහි දී ඔවුන්ට අවැසි වූ ප්‍රධාන ද්‍රව්‍යයක් වූයේ ගිනිමැල දැල්වීමට දර ලී ය. දුර ඈත සිටින ගැමියෝ ද මේ අවශ්‍යතාව හොඳින් දැන සිටියෝ ය. එහෙත් අද මෙන් බර වාහනවලින් දර කඳු පිටින් පටවා ගෙන යාමේ හැකියාවක් එදා නොවිණි. එමෙන් ම සිතූ සැණින් අනුරාධපුර පූජා නගරයට පිවිසීමේ ගමන් පහසුව ද නොවිණි. මං මාවත්, වන දුර්ග , ගිරි දුර්ග, ජල දුර්ගවලින් පමණක් නොව අලි කොටි වලසුන්ගෙන් ද ගහන ය. ඒ නිසා බෝ මලුව වන්දනාවේ එන්නන්හට වන්දනා නඩ වශයෙන් ගොනුවී දින ගණනක් තිස්සේ පිය නැඟීමට සිදුවේ.

අගෝස්තුව වන විට ගොවිතැන් බත් කිරීම සිදු නොවේ. ජනයා එකලට යොමුව සිටින්නේ කෙත්වතු, හේන් හා වගාබිම් අස්වැද්දවීම හා පොදු වැඩකටයුතු වෙනුවෙනි. ඔවුන් පින් දහම් කිරීමට හා වන්දනාවේ යාමට ද රුචි මේ සමයට ය. ශ්‍රද්ධ නගරයේ වන්දනාවේ යාම ද ඔවුන්ගේ විනෝදාස්වාදය හා කාන්සිය මාන්සිය නැති කිරීමේ මහත් බලාපොරොත්තු ඉටු කර ගැනීමකි.

අඹරාව බැඳි ගොන් කරත්ත මේ ගමනට සූදානම් කර ගැනේ. අඹරාව යනු වියන ලද පොල් අතුවලින් කරත්තයට සකසා ගන්නා අර්ධකවාකාර වහළයයි. මේ සමය පූජාව සඳහා මල් සොයා ගැනීම පවා දුෂ්කර සෘතුවක් බැවින් කොළපත් සහිතව පුවක් මල් ගැලේ ඉදිරියේ එල්ලා ගන්නා අතර සුළු වශයෙන් කනබොන දෑ වතුර හා ගවයින්ට පිදුරු කට්ටයක් වැනි දෑ ද ගැල පිටුපස එල්ලාගැනීම මේ සංචාරකයින්ගේ පුරුද්ද ය.

මේ ගැලේ පුරවා ගන්නා බඩු බාහිරාදිය තුළ වැදගත්ම දෙය දරමිටි වෙයි. ඒ සඳහා හොඳින් අවිලෙන එළිය හා රශ්මිය විහිදෙන වීර, සේරු හා දෙමට ආදී දෘඪ දැව ගස් වර්ගවලින් දර කඩාගෙන මිටි බැඳගනී. රාත්‍රී එළියට හා ආරක්ෂාවට හුලු අත්තක් සදා ගන්නේ දෙමට දර කීරි එකතු කර ගැනීමෙනි.

පසුදා පූජා නගරයෙන් එළිවන්නට කල්වේලා බලා ගමන පිටත් වන්නේ පේවී, සුදු වස්ත්‍ර ද පොදි බැඳගෙන ය. කාන්තාවන් හා කුඩා දරුවන් කරත්තයේ ඇතුළට නඟින අතර පිරිමි පුද්ගලයෝ පසුපසින් ගමන් කරති. රෑ බෝවන විට වන ගොමු මැදින් කෑකෝගසමින්, ගී සින්දු කියමින් ගමන් කරන පිරිස බෝ සමිඳුගේ ගුණ ද ගායනා කරති. මේ එවන් එක් සීපදයකි.

**අහසේ පුන් සඳ සේ බැබළෙන බෝ**
**අහසේ ගුණ නුවණින් පැතිරුණු බෝ**
**හිරුගේ සවනක් රැස් විහිදෙන බෝ**
**සොඳුැ සේ වඳිමු ජයසිරිමා බෝ**

අලුයම් කාලයට බසවක්කුලම වැව අසලට පැමිණෙන ගැල නවතා ගොන් බානට කන්න බොන්න මෙන් ම විවේකය දෙන වන්දනාකරුවෝ එතැන් සිට සූදානම් වී බෝ මලුවට යති. ඔවුන් හිසේ තබා ගෙන වන්දනා ගාථා කියා සාධු හඬින් මුමුණමින් රැගෙන යන දරමිටි බෝ මලුව වටා තැන්පත් කෙරේ. ඒ දවස බොහෝ විට නිකිණි පුර පසළොස්වක් පෝය දා ය. ඒ නිසාම නිකිණි පෝය රජරටට ''දරමිටි පෝය'' වෙයි.

බෝ මලුවේ ආගමික වතාවත් සිදුකර තමන්ට නිදුක් නීරෝගී භාවය හා ගමට රටට ආශිර්වාද කර ගොවිතැන් සශ්‍රීකවීමට බෝ සමිඳුන්ගේ පිහිට අයැද සිටීමට සැදැහැවත්හු වගබලා ගනිති. රාත්‍රී කාලයේ මලුවට නිතිපතා එකතුවන ගැමියෝ දර මිටි ගෙනා පිරිසට පින් දෙමින් ඒවා දල්වා ආලෝකය හා තාපය සපයා ගනිති.


බිනර පොහොය පසුවන තුරු මේ ව්‍යායාමය උත්තම පූජාවක් ලෙස එදා සිදු කෙරිණි. ඒ නිසා අදත් නිකිණි සරා සඳ මෝරන විට බෞද්ධයින්ට දරමිටි පෝය සිහියට නැගේ. එය බෝධි සංස්කෘතියටත් ඉතිහාසයටත් එක්වූ අපූර්ව සංසිද්ධියකි.

අව්, වැසි කුණාටු ආදි නොයෙකත් උපද්‍රව, පරසතුරු උවදුරු, රෝග වසංගත හා සාගතයන් ආදී දහසකුත් අභියෝග හමුවේ මෙලෙස අප හා ආරක්ෂා වූ සිරිමා බෝ සමිඳුන් ඒ සියලු අභියෝග පැරදවීමට අපට ශක්තිය දෙමින් අදත් මහ මෙවුනා උයනේ විරාජමාන ව වැඩ සිටී. ඒ බෝධි සංස්කෘතියේ මහිමය අවබෝධ කර ගන්නට නිකිණි පුර පොහොය අපට වටිනාම මංසන්ධියකි.

බෞද්ධ ඉතිහාසයේ නිකිණි පෝය වෙනුවෙන් සටහන්වූ සුවිශේෂී අංග ලෙස ප්‍රථම සංගායනාවත්, ආනන්ද මහ තෙරුන්ගේ රහත් අවබෝධයත් වැදගත් ය. අජාසත්ත රජුගේ දායකත්වයෙන් රජගහ නුවර දී ප්‍රථම ධර්ම සංගායනාව පවත්වා ඇත්තේ ද නිකිණි පොහොය දින බව සඳහන් වෙයි. බුදුන් වහන්සේගේ ලලාට ධාතුන් වහන්සේ නිදන් කර සේරුවිල චෛත්‍ය තැනීම ආරම්භ කිරීම ද මේදින සිදුවූවකි. පෙරවස් මඟ හැර ගිය භික්ෂූන් වහන්සේ පසුවස් සමාදන්වීම නිකිණි පුර පසළොස්වක පොහොය දින සිදුවේ



අනුරාධපුර ලංකාරාමාධිකාරී
උතුරු මධ්‍යම දිසාවේ ප්‍රධාන
අධිකරණ සංඝනායක
**රැළපනාවේ ධම්මජෝති හිමි**



# මහී නදී තෙර අසබඩ දුප්පතුන්ගේ ජීවිත අනතුර නොදත් ධනියගෝපාල



**සෝචති පුත්තෙහි පුත්තිමා**
**ගෝමියෝ ගොහි තථෙව සොචති**
**උපධීහි නරස්ස සොචනා**
**නහී සො සොචති සො නිරූපධී**

**දරුවන් ඇති තැනැත්තා දරුවන් නිසා ශෝක වෙයි. ගවයන් ඇති තැනැත්තා ගවයන් නිසා ශෝක වෙයි. මිනිසා විසින් රැස් කරන ලෞකික සම්පත් ශෝකය පිණිස පවතී.ලෞකික රැස්කිරීම් නැති තන්හි ශෝකයක් නැත.**

## ධනිය ගෝපාල සූත්‍රය



මොරටුව ලුනාව උයන
පාරේ බෝධිරාජාරාමාධිපති
කොළඹ විශ්ව විද්‍යාලයේ
මහාචාර්ය

**අගලකඩ සිරිසුමන හිමි**

සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායෙහි සුත්ත නිපාතයට අයත් ධනිය ගෝපාල සූත්‍රය ඇසුරින් කාරණා කීපයක් සාකච්ඡා කිරීම මෙහි අරමුණයි.

අතීතයේ භාරතීය ජනතාවගේ වටිනාම සම්පත වූයේ ගවයායි. වර්තමානයේ පවා එය වෙනස් වී නැත. විශාඛාව දීග යද්දී පියා ඇයට ද දායාද කළේ ද ගව රංචුවකි. ගොවිතැන ප්‍රධාන කර ගත් ජනතාවගේ ප්‍රධාන මිතුරා ගවයා වන අතර, කිරිවලින් ස්වයංපෝෂිතවීම ද ඒ තුළින් සිදු විය.

බුද්ධ කාලයෙහි දඹදිව විසූ ධනිය ගෝපාල විශාල ගව රංචුවක හිමිකරුවෙකි. දඹදිව පංච මහා ගංගාවන්ගෙන් එකක් වන මහී ගංගාව අසබඩ ඔහු තම ගව රංචුව සමඟ ජීවත් විය.

එක් දිනක් සවස් යාමයේ සතර දිගින් අහස කළුවර කොට විශාල ධාරානිපාත වර්ෂාවක පෙර නිමිති පහළ විය. එවිට ධනිය ගෝපාල ඉක්මනින් තම කටයුතුවල නිරත විය. සේවකයින් යොදවා ප්‍රමාණවත් දර, ගොඩ ගසා ගත්තේ ය. දෙනුන්ගෙන් කල් තියාම කිරි දොවා ගත්තේ ය. වසු පැටවුන් කණුවල බැඳ ගවයින් කොටුව තුළට ගාල් කර ගත්තේ ය.

අවශ්‍ය ආහාර පාන සකසා ගත්තේ ය. හුළු එළි දල්වා අඳුර මකා මැසි මදුරුවන්ගෙන් ආරක්ෂාව සලසා ගත්තේ ය. තමාගේ රූමත් බිරිඳත්, දරුවනුත් අසලම රඳවා ගත්තේ ය. සියලු ආරක්ෂාව ඇත. කිසිදු බියක් ධනිය ගෝපාලගේ සිතට නොදැනුනේ ය. ඒ නිසා ඇති තරම් වහින්නයි ඔහු වැස්සට ආරාධනා කළේ ය.

මේ ආරාධනාව පද්‍යයක ස්වරූපයෙන් සූත්‍රයෙහි දැක්වෙයි.

**පක්කෝදනෝ දුද්ද ඛීරෝහමස්මි**
**අනුතීරෙ මහියා සමාන වාසො**
**ඡන්නාකුටි ආහිතො ගිනි**
**අථ වෙ පත්ථයසි පවස්ස දෙව**

මෙහි අදහස වන්නේ,

පිසින ලද බත් ඇත්තෙමි. දොවා ගන්නා ලද කිරි ඇත්තෙමි. නදී තෙර අසල පිරිවර හා සමඟ වසමි, කුටිය සෙවිළිකර ඇත. ගින්න ද දල්වා ඇත. මේඝය, දැන් ඇති තරම් වැහැපන්.

සැබැවින්ම ධනිය ගෝපාල ගැයූ ගීයෙහි අර්ථවත් වන්නේ කුරිරු ධනවාදියකුගේ ආත්මාර්ථකාමී සිතිවිලි නොවේද? ඔහුට වැස්ස කෙතරම් ආස්වාදයක් වන්නේ ද? ඒත් මහී නදී තෙර අසබඩ වසන දුප්පත් ජනයාගේ ජීවිතවල අනතුර ධනිය ගෝපාලට දකින්නට නොහැකි විය.

තමා සියලු සම්පතින් ඉසුරුමත්ව ඇති බැවින් අන්‍යයන්ට කවර හානියක් වුව ද තමාට කම් නැත. එදාටත් වඩා මේ සිතිවිලි අදට කෙතරම් ගැළපේ ද? වැටකඩොලු, තාප්ප ප්‍රාකාරාදියෙන් තනි වී සියලු සැප, සියලු ආරක්ෂාවන් ලබමින් ධනිය ගෝපාල මෙන් සිතන්නෝ මේ සමාජයේ කොපමණ වෙත් ද?

මහ මඟ එදා වේල සරිකර ගත නොහැකිව වෙහෙසෙන දුගී කම්කරුවාගේ වේදනාව නොදන්නෝ කොතෙකුත් වෙත්ද? ඔවුනට ලැබෙන්නට ඇති දේ පවා වංචා කරමින් තම සුඛ විහරණය සඳහා යොදා ගන්නා උසස් නිලධාරී පැළැන්තියක් අපට නැත්ද? ඉහළ ජනයාගේ සුඛ විහරණය වෙනුවෙන් මංමාවත්වල වෙහෙසෙන්නෝ කොතෙක් වෙත්ද?

ධනිය ගෝපාලගේ මේ ධනවාදී සිතිවිලි ඇසුරින් නූතන කවියකු වන පරාක්‍රම කොඩිතුවක්කු අර්ථවත් නිර්මාණයක් කළේ ය. එය කාලයක් උසස් පෙළ විභාගයට ද නිර්දේශව තිබුණි. මෙම කවියා කොතරම් ප්‍රතිභාපූර්ණ ලෙස නූතන සමාජ විවරණය පිණිස මෙය යොදා ගෙන ඇත්දැයි බලන්න.

**ධනිය ගෝපාල තොප**
**කුරිරු ධනවාදියෙකි**
**කන්ද උඩ මාලිගේ සිටි ඔබට**
**කන්ද යට අපේ පැල නොපෙනේ ය.**

**අම්මා තව ආවෙ නැහැ ගස් කපනව කිරි කට්ටියේ**
**උදේ රැයින් තාත්තා ගියෙ කුලී වැඩක් සොයා ගන්ට**
**දොළ ගැලුවොත් හෙට උදේට කොහොමද ඉස්කෝලෙ යන්නේ**
**ගස් තෙමුණොත් නම වැටෙන්නෙ නෑ අම්මට හෙට දීනේට**
**පුංචි පැලේ මං තනි වුණු වෙලාවේ**
**පමා වෙලා වැහැපන් වැහි වලාවේ**

කන්ද උඩ මාලිගයේ සියලු රැකවරණ ද, ආහාර ද, රූමත් බිරිඳක ද සමග වෙසෙන ධනිය ගෝපාලට වැස්ස ආශිර්වාදයක් වන විට පහත ගං තීරයේ සිය දහසක් දුගී ජනයාගේ ඛේදවාචකයේ දෝංකාරය මේ ඔස්සේ අපට කියැවෙයි.

කෙසේ වෙතත්, ධනිය ගෝපාල කන්ද මුදුනේ මෙසේ ගයද්දී බුදුපියාණන් වහන්සේ මහී ගඟ අසල මදක් නුදුරින් රුක් සෙවනක වැඩ සිටියහ. ඒ බව ධනිය ගෝපාල දැන සිටියේ නැත.

බුදුරදුන් එතැනට වැඩියේ ධනිය ගෝපාලයන්ගේ මේ කුරිරු සිතිවිලි නසා සසරින් නිදහස් කර ගන්නට මඟ හෙළිකර දීම සඳහා ය.

ධනිය ගෝපාලයන් තම පද්‍යයෙන් "මේඝයට වැහැපන්" යන ආරාධනා කරද්දී එය බුදුරදුන්ගේ කන වැකුණි. එවිට බුදුහු එයට පිළිතුරක් ලෙස පද්‍යයක් වදාළහ.

**"අක්කොධනෝ විගත ඛිලෝහමස්මි**
**අනුතිරෙ මහියා ඒක රත්ති වාසො**
**විවටා කුටි නිබ්බුතො ගින**
**අථ බෙ පත්ථයසි පවස්ස දෙව"**

මෙහි අදහස මෙසේ ය.

"ක්‍රෝධය තුරන්කර ඇත. ක්ලේශ බන්ධනයන් නැමැති සසරෙහි බැඳ තබන සියලු කණු උදුරා දමා ඇත. මහී ගං තෙරෙහි එක් රැයක් පමණක් වෙසෙමි. භවය නැමැති කුටිය වසා සිටින කෙලෙස් පියස්ස නැති බැවින් විවෘත ය. අකුසල් ගින්න නිවා දමා ඇත.

ඉතා ගැඹුරු ධර්මයක් රැගෙන එන බුදුරදුන්ගේ මේ පිළිතුරින් ධනිය ගෝපාල විස්මයට පත්විය. ඔහු එයින් කුල්මත් විය. එහෙත් ධනිය ගෝපාලට පිළිතුරු දුන් කවියා කවුදැයි එක්වරම හඳුනා ගන්නට නොහැකි විය.

එහෙයින් තව තවත් රසවත් පද්‍ය අසමින් සතුටු වන්නට ධනිය ගෝපාල කල්පනා කළේ ය. මෙසේ පද්‍ය ගණනාවක් ම ඔහු ගායනා කළේ ය. ඒ සියල්ලට ම බුදුහු පිළිතුරු දුන්හ.

ධනිය ගෝපාලගේ අවසන් පද්‍යයෙන් කියවුනේ "දරුවන් ඇති තැනැත්තා දරුවන්ගෙන් සතුටු වෙයි. ගව සම්පත ඇති තැනැත්තා ගව සම්පතින් සතුටු වෙයි. මිනිසාට ඇති සැපත, සම්පත් පිරී පැවතීමයි. සම්පත් නැති තැනැත්තාට සතුටින් ජීවත් විය නොහැකි ය."

මෙය ඕනෑම පුහුදුන් කෙනකුගේ කල්පනාව විය හැකි ය. දරුවන්, ගවයන් ඇති තැනැත්තා එයින් සතුටක් ම විඳී. එමෙන්ම කාම සම්පත්, ඥාති සම්පත්, ඉඳුරන් පිනවන විවිධ සම්පත්, අනෙකුත් විවිධ රැස් කිරීම් නිසා තමාට තෘප්තියෙන් ජීවත් විය හැකියි. ඒවා නැති කල්හි සතුටක් නැත. ධර්මයෙන් බැහැර වූ ලෞකික සිතුම් පැතුම් අනුව මේ අදහස නිවැරැදි ය.

එහෙත් ධර්මානුකූලව විග්‍රහ කර බැලීමේ දී මේ සියල්ල වේදනාව ම ඇති කරවන්නේ නැත්ද? එබැවින් තථාගතයන් වහන්සේ අප මාතෘකා කළ ගාථාවෙන් ධනිය ගෝපාලට පිළිතුරු දී වදාළහ.

එයට අනුව දරුවන් ඇත්තා දරුවන් නිසාම ශෝකයට පත් වෙයි. පීඩාවට පත් වෙයි. බැඳීම් ඇති වෙයි. ගවයන් ඇත්තා ද එසේ ම ය. ආශාවෙන් රැස් කළ සියල්ල වැනසී යන විට ශෝකයම ඇති වෙයි. එබැවින් උපධි නැති තැන එනම්, රැස් කිරීමක් නැති තැන දුකක් ද නැත.

මේ දේශනාව ඇසූ ධනිය ගෝපාලගේ සිත නිදහස් වුණි. යථාවබෝධයට පත් වුණි. බිරිඳ සමඟ අඳුරේ ම තථාගතයන් වහන්සේ සරණ ගොස් බුදු සව්වන් බවට පත් වූහ. සසර දුක් කෙළවර කොට උතුම් නිවනට පත්වූහ.

ලෞකික සිතුම් පැතුම්වලින් මිදී මොහොතක් මේ ගැන සිතා බලන්න.

# ලෝ අම්බලමේ ඉඳලා එනවා මේ ජීවිතයේ කෝ ස්ථිරතා



කැලණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අංශයේ අංශාධිපති
පෑලියගොඩ විද්‍යාලංකාර
පිරුවන්හි ආචාර්ය,
මහාචාර්ය
**මල්වානේ
චන්ද්‍රරතන හිමි**

**ලෝකයේ බිහිවූ සත්වයින් අතර මිනිසාට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. එයට හේතු වී ඇත්තේ අන් සත්වයින්ට වඩා දියුණු වූ ප්‍රඥාවක් හා සුවිශේෂ චින්තන හැකියාවක් මිනිසාට තිබෙන හෙයිනි.**

ලෝකයේ ප්‍රඥාවන්තයින් අතර ශ්‍රේෂ්ඨතම උත්තමයන් වහන්සේ බුදුන් වහන්සේ ය. සත්වයාගේ සසර ගමන පිළිබඳ නිවැරැදි චින්තනයක් ඇති කළේ ද බුදුන් වහන්සේ ය. උන්වහන්සේ අවබෝධ කොට ගත් ඥාන අතර පුබ්බේනිවාසානුස්සති, චුතූපපාත හා ආසවක්ඛය යන ඥානයන් විශේෂ වේ.

සත්ත්වයාගේ පූර්ව භවයන් පිළිබඳ ඥානයත්, මරණින් පසු නැවත භවයක සම්භවය වීම පිළිබඳ ඥානයත්, ආශ්‍රවයන් ප්‍රහීණ කිරීමෙන් සසර ගමන නවතින බව දත් ඥානයත් යන ලෝකෝත්තර ඥාන ලබා ගත් බුදුන් වහන්සේ ඒ පිළිබඳ ලෝක සත්වයාට මැනවින් අවබෝධ කරමින් දේශනා පැවැත්වූහ. ඉපදෙමින් මැරෙමින් යන සංසාර ගමනේ අපි මේ රැඳී සිටින්නේ එක් නවාතැන් පළක ය.

එය වරෙක අම්බලමක් සේ ය. අම්බලමක නවාතැන් ගත් මිනිසා තම බඩු බාහිරාදිය රැගෙන නැවතත් අම්බලමකට ගමන් කරයි. සසර ගමනෙහි යෙදී සිටින මිනිසා මේ ලබා ගත් මිනිසත් භවය එක්තරා අම්බලමකි. මෙම ලෝක යථාර්ථය සැමවිට ම සාහිත්‍යකරුවන් සිය නිර්මාණයන් සඳහා වස්තු විෂයය කොට ගෙන ඇත.

1957 දී ජීවිත සටන චිත්‍රපටයට ඩී. ටී. ප්‍රනාන්දු විසින් රචිත ඉන්දියානු ගායිකාවක වන ජික්කි විසින් ගායනා කරන ලද පහත ගී පදවැල මෙම යථාර්ථය මැනවින් කියා පායි.

**ලෝ අම්බලමේ ඉඳලා එනවා**
**නිසි පාර සොයා ආගන්තුකයා**
**දෙයි මාන බලා කරුමේ පහරා**
**මේ ජීවිතයේ කෝ ස්ථිරතා**

එහි දී කවියා මිනිස් ජීවිතයෙහි ඇති අස්ථිර භාවය පිළිබඳ තම ශ්‍රාවකයාගේ අවධානය යොමු කරවයි.

ජීවිතය නම් අම්බලමට පැමිණි මිනිසා සැමවිට ම යා යුතු මාර්ගය විමසමින් සිටියි. කෙසේ වෙතත් තමා අතීත භවයන්හි රැස්කර ගත් කර්ම ශක්තිය මඟහැර යන්නට කිසිවකුටත් නොහැකි ය. එම නිසා කර්මයට අනුව ජීවිතය ඉදිරියට සසර ගමනෙහි ගලාගෙන යන අයුරු කවියා මැනවින් ඉදිරිපත් කරයි.

**පිනි බිංදු වගේ බිඳී යාවි සැනින්**
**මේ නිසරු කලේ අපි ආලේ කළා**
**කරුමේ කළේ මේ කිමදෝ අනේ..... අහෝ...**
**කරුමේ කළේ මේ කිමදෝ අනේ**
**මේ මාව දමාලා යන්නේ කොහේ**

ජීවිතය නම් තණ අග පිනි බිඳුවක් වැනි ය. එය කොයි මොහොතක ගිලිහී බිමට වැටේ දැයි කිසිවකුටත් කිව නොහැකි ය. එහෙත් සැණෙකින් බිම ඇද වැටීම නම් ස්ථිර ය. ජීවිතයක ස්වභාවයත් එසේ ය.

මෙම පද පේළි ජීවිත සටන සිනමාපටයේ කතාවට අදාළව රචනා වුව ද සමස්තයක් වශයෙන් පාඨක අවධානය යොමු වී ඇත්තේ ජීවිතයේ අස්ථිර භාවයට ය.

**ගිනි දැල්ල නඟින්නා සොහොන පුරා**
**ගිනි කන්ද නඟී ආකාසෙ පුරා**
**ගිනි දැල්වීලා ආවේ හර්දේ පලා**
**පව්කාර මගේ පව් පල දේ අහෝ**
**පව්කාර මගේ පව් පල දේ අහෝ**
**මේ ජීවිතයේ කෝ ස්ථිරතා**

**ජීවිතය නම් අම්බලමට පැමිණි මිනිසා සැමවිට ම යා යුතු මාර්ගය විමසමින් සිටියි. කෙසේ වෙතත් තමා අතීත භවයන්හි රැස්කර ගත් කර්ම ශක්තිය මඟහැර යන්නට කිසිවකුටත් නොහැකි ය.**



ජීවිතයක අවසානය සොහොන් කොතේ දී හෝ සොහොන් බිමේ දී හෝ සිදු වන ලෝකයේ හැම විටම පොදු සංසිද්ධියකි. එහිදී භෞතික සියල්ල ම සොහොන් කොතේ ගිනිසිළුවෙන් හළු වී යයි. එසේම තවත් වරෙක සොහොන් බිමේ පස්වලට හසුවී භෞතික සියල්ල ම පස් බවට පත්වෙයි .

එසේ වුව ද සොහොන් කොතේ ගිනිවලට අළු කළ නොහැකි යමක් සෑම මානවයකු ම තම ජීවිතයේ එක් රැස් කොට ගෙන ඇත. එය සොහොන් බිමේ පස්වලට ද යට කළ නොහැකි ය.

එනම් තමා සිය ජීවිත කාලය තුළ රැස් කොට ගත් පින් -පව් දෙක ය. ඒවා මරණින් පසු කාටවත් පැටවිය නොහැකි ය. තමා පසුපස ගමන් කරන කර්ම ශක්තිය බවට පත්වේ. ගොනා පසුපස ගමන් කරන කරත්ත රෝදය සේ රැස්කර ගත් පවත්, තමා අත් නොහැර යන සෙවණැල්ල මෙන් රැස්කර ගත් පිනත් පසුපසින් එන බව ධම්මපද පාලියේ යමක වග්ගයේ මුල්ම ගාථා දෙකෙන් බුදුන් වහන්සේ දේශනා කළහ

**සංසාර දුකින් මිරිකීම තමා**
**ලෝකේහි සොබා ධර්මේ නියමා**
**මරණෙට ආ දා යා යුතුයි..... ඔව්**
**මරණෙට ආ දා යායුතුයි**
**ධර්මේ නමුත් සැනසෙන්නේ කෙසේ**

කවියා තම සදාදරණීය ශ්‍රාවකයාට එම ගීත පාදයෙන් අවබෝධ කිරීමට මහන්සි ගන්නේ සසර යනු දුකින් පිරුණු මාවතක් බව ය. එසේ වීමට හේතු වන්නේ සසර ගමනේ තමා සිදුකර ගත් අකුසල පාප කර්මයන් ය. එසේ අකුසල පාපකර්ම සිදු කළහොත් සසර ගමන හැමවිට ම දුක්ඛාන්තයක් බවට පරිවර්තනය වේ. මෙහිදී කවියා ධ්වනිත කරන සමුදයාර්ථය වන්නේ ජීවිත කාලය තුළ පුණ්‍ය කර්ම -කුසල කර්ම සිදුකළ හොත් ඔවුන්ගේ සාංසාරික ගමන් මඟ සුවදායක වන බව ය. මානව ජීවිතයක් ලැබීම යනු පූර්ව ජන්මවල සිදු කළ කුසල කර්මවල ඵලවිපාකයන් ය.

එකී පුණ්‍ය කර්මවල විපාක වශයෙන් ලබා ගත් මානව ජීවිතය තුළ උදාර සැප සම්පත් ළඟා කර ගත හැකි ය. එසේ මානව ජීවිතයේ මිහිර විඳිමින් ජීවත්වන මිනිසුන් අප සමාජය තුළ කොතෙකුත් දැකිය හැකි ය. එසේම සසර කළ අකුසල කර්ම හේතුවෙන් අතිශය දුක්ඛ දෝමනස්සයන්ට හසුවන අවාසනාවන්ත චරිත ද බහුල වශයෙන් වර්තමාන සමාජය තුළ දැකිය හැකි ය.

කෙසේ වෙතත් මෙවැනි ගීත සම්පාදනය කිරීමෙන් බලාපොරොත්තු වූයේ සසර ගමනෙහි දුක්ඛ දෝමනස්සයන් මෙන් ම සුඛ සෝමනස්සයන් පිළිබඳ අවධානය යොමු කොට එයින් යහපත් මානව ජීවිතයට අදාළ කුසල පක්ෂය කෙරෙහි අවධානය යොමු කරවීමයි.

එබැවින්, මෙම සමාජය සාධු සම්මත යහපත් සමාජයක් බවට පත් කිරීම කවියාගේ ඒකායන පරමාර්ථය වී ඇති බව පෙනේ .

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

## නිකිණි පුර පසළොස්වක 2022-08-11

## සත්පුරුෂ ගුණ

පින්බර නිකිණි පුන් පෝ දිනය අදයි. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්ම සඳහා මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ මැදිහත්වීමෙන් ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීම ආරම්භ වූයේ අදවන් පෝ දිනක දී ය. එය සිහිපත් කරමින් ධර්මානුකූල දිවි පැවැත්ම තව තවත් ඔපවත් කර ගන්නට සියලු බෞද්ධයෝ උත්සුක විය යුතු ව තිබේ.

විශේෂයෙන් මේ අප ගත කරන්නේ වස්සාන සමයයි. වසරේ අනෙකුත් කාලවලට වඩා වෙහෙර විහාරස්ථාන ඇසුරු කරමින් දහම් මඟ යන්නට මෙකල බෞද්ධයාට ඉඩකඩ ලැබේ. ඒ භික්ෂූන් වහන්සේ ද විහාරස්ථානයෙහි ම වැඩ සිටිමින් තමන් වහන්සේගේ සේ ම, ගිහියන්ගේ ද ආධ්‍යාත්මික දියුණුව වෙනුවෙන් කටයුතු කරන්නට කැප වී සිටින බැවිනි. ධර්මානු ධර්ම පටිපන්න භික්ෂූන් වහන්සේ ගිහියාට කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමකි. උන්වහන්සේ නිරතුරුව උත්සාහ ගන්නේ ගිහියා පවින් වළකාගෙන යහපතෙහි යෙදවීමට ය. එදිනෙදා අත්දකින අනේකවිධ කටුක, දුක්බර ජීවන ගැටලු හමුවේ ඒවා නිරාකරණය කර ගන්නට, ජීවිතයේ යථාර්ථය අවබෝධ කරමින් ලෝ දහමට කම්පා නොවී ජීවත් වන්නට උන්වහන්සේ අවවාද ලබා දෙති.

ඒ අතරම ධර්ම මාර්ගය පෙන්වා දෙමින් මේ දුක් සහිත සසර මඟ නවතාලීමේ මාර්ගයට පිවිසෙන මාවත පෙන්වා දෙති. ඒ සත්පුරුෂ කල්‍යාණ මිත්‍රයන් වහන්සේ හමුවී නිරන්තර අවවාද අනුශාසනා ලබා ගන්නා පුද්ගලයා ද නිතැතින් සත්පුරුෂයකු වනු ඇත. එවිට බෞද්ධයන් ලෙස අප බලාපොරොත්තු වන මේ ජීවිතයත්, පරලොව ජීවිතයත් සුඛිත මුදිත කර ගන්නට මඟ සලසා ගන්නට හැකි වනු ඇත.

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක මේ ලෝකයෙහි ජීවත්වන පුද්ගලයන් තිදෙනකු පිළිබඳ දේශනා කොට වදාළහ. එක් අයෙක් අන්ධ ය. ඔහුගේ මැසස පෙනුණ ද මනස අඳුරු ය. සම්පත් ළඟා කර ගැනීමෙහි ඔහු අනුවණ ය. කුසල්, අකුසල්, වැරැද්ද, නිවැරැද් ද, උසස් පහත් බව, හොඳ - නරක වෙන්කොට දැන ගන්නට ද ඔහුට නුවණැස නැත.

අනෙක් පුද්ගලයා එක් ඇසක් ඇති පුද්ගලයා ය. ඔහු සම්පත් දියුණු කර ගැනීමෙහි නුවණැති ය. එහෙත් හොඳ, නරක, වැරැද්ද නිවැරැද්ද වෙන් කොට ගන්නට නුනුවණ ය.

තෙවැන්නා දෑසම පෙනෙන පුද්ගලයා ය. ඔහු නොලද සම්පත් ලැබීමට ද ලද සම්පත් දියුණුවට ද නුවණැති ය. එසේම හොඳ නරක, කුසල් - අකුසල්, වරද - නිවරද වෙන් කොට දැන ගනී.

මෙහිදී නුවණැස නැති අන්ධයාට සම්පත් නැත. හේ පින් ද නොකරයි. දෙලොව ම පරාජය ලබයි.

දෙවැන්නා, එක් ඇසක් පෙනෙන්නා කාමභෝගීය. හේ සොරකමින්, බොරුවෙන්, වංචාවෙන් ධනය රැස් කරන්නට දක්ෂ ය. හේ නිරයට ගොස් වැනසෙන්නෙකි.

තෙවැන්නා, දෑසම පෙනෙන පුද්ගලයා ධන සම්පත් උපයන්නේ දැහැමෙනි. උතුම් කල්පනාවෙන් යුතු ය. මනස නිරවුල් ය. උත්සාහය වීර්යය ඇත. යහපත් ජීවිතයක් ගත කරයි. මේ අපේ සමාජයේ ජීවත්වන පිරිස් ය.

මොවුන් හඳුනා ගැනීමෙන් පසු අන්ධ පුද්ගලයාත්, එක් ඇසක් පෙනෙන්නාත් දුරින් ම දුරු කළ යුතු ය. දෑස ම පෙනෙන උසස් පුද්ගලයා ම ඇසුරු කළ යුතු ය, යනුවෙන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ.

මේ අනුව විමසමින් අනුන් ගැන තක්සේරු කරනවා සේ ම තමන් ද ඒ අතරින් කවරකුගේ තැනට වැටෙනවා ද යන්න තමන් ගැන ම විමසා තීරණය කළ යුතු ය. සත්පුරුෂයෙක් නම් ඒ ගුණ තවත් වැඩිදියුණු කර ගන්නට, අසත් පුරුෂයෙක් නම් ඒ ගතිගුණ දුරු කර යහපත් තැනට එන්නට මේ වස්සාන සමයේ හෝ අධිටන් කර ගත යුතු ය.

අපගේ කල්‍යාණ මිත්‍රයන් වහන්සේගෙන් ඒ සඳහා අවශ්‍ය අවවාද අනුශාසනා ලබන්න නොපැකිළිවිය යුතු ය.



# චතුරාර්ය සත්‍යය අවබෝධයට ඇති එකම මඟ අරිඅටඟි මඟයි

නමො තස්ස භගවතො
අරහතො සම්මා සම්බුද්ධස්ස

පාතුරහොසි මගධෙසු පුබ්බෙ
ධම්මො අසුද්ධො සමලෙහි චින්තිතො
අවාපුරෙතං අමතස්ස ද්වාරං
සුණන්තු ධම්මං විමලෙනානු බුද්ධං

සෙලෙ යථා පබබ්බකමුද්ධ නිට්ඨිතො
යථාපි පස්සෙ ජනතං සමන්තතො
තථූපමං ධම්මමයං සුමෙධ
පාසාද මාරුය්හ සමන්තචක්ඛු
සොකාවතිණ්ණං ජනතං අපෙතසොකො
අවෙක්ඛස්සු ජාතිජරාභිභූතං



අස්ගිරි මහා සංඝ සභාවේ
මහෝපාධ්‍යාය
රාජකීය පණ්ඩිත
ත්‍රිපිටකාචාර්ය විනයකීර්ති ශ්‍රී
සුමංගල
**අමුණුපුර පියරතන**
**නා හිමි**

පින්වතුනි,

**සුගත තථාගත අප සම්මා සම්බුදුරජාණන් වහන්සේට උතුම් චතුරාර්ය සත්‍යධර්ම අවබෝධ කිරීමෙන් සම්මා සම්බුද්ධත්වයට පත් වී මෙම ධර්මය දේශනා කිරීම පිළිබඳ පරිවිතර්ක චේතනාවක් පහළ විය. එම චේතනාව දැන ගත් සහම්පතී බ්‍රහ්මයා බඹලොවින් වහා අවුත් බෝමැඩ විදුරසුන් මත වැඩසිටිනා බුදුරදුන් ඉදිරියේ පෙනී සිට ධර්මය දේශනා කරන්නට ආරාධනා කළහ.**

බුදුරජාණන් වහන්සේ කවරකුට ප්‍රථමයෙන් ධර්මය දේශනා කරන්නේ දැයි බලන සේක් පෙරදී ඇදුරු වූ ආලාරකාලාම, උද්දකරාම කළුරිය කර ඇති බැවින් බරණැස ඉසිපතන මිගදායේ සිටින පස්වග මහණුන් දැකීමට උරුවෙල් ජනපදයේ සිට බරණැස ඉසිපතනයට යන මඟට පිළිපන් සේක.

මෙසේ වඩින බුදුරජාණන් වහන්සේට උපක නම් ආජීවකයා හමු වී බුදුරදුන්ගේ ප්‍රසන්න ශරීරයට හා ශාන්ත දාන්ත ඉඳුරන්ට පැහැදුණේය.

ආජීවකයා බුදුරදුන් පිළිබඳ ව කෙටි විස්තරයක් ඇසූ විට බුදුහු මම අරහං නම් වෙමි, මම අනුත්තර නම් වෙමි. ආදී වශයෙන් ඉතා කෙටියෙන් හඳුන්වා දී බරණැස ඉසිපතනයට වැඩි සේක.

බරණැස ඉසිපතනයට වඩින බුදුරදුන් දැක පස්වග මහණුන් වහන්සේ මුලදී කතිකා කරගත් පරිදි සත්කාර සම්මාන නොකරන්නට අදිටන් කළ නමුත් බුදුරදුන් පස්වග මහණුන් සමීපයට ළංවත් ම තම තමන්ගේ කැමැත්තෙන් ම ආගන්තුක සත්කාර වශයෙන් සියල්ල ඉෂ්ට සිද්ධ කළහ.

මෙසේ ආගන්තුක සත්කාරයෙන් පසුව පස්වග මහණුන් වහන්සේට සම්මා සම්බුද්ධත්වය පිළිබඳ සැකය දුරු කොට "දෙවමෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන නසෙවිතබ්බා යොචායං

කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො, ගම්මො, පොථුජ්ජනිකො

අනරියො අනත්ථසංහිතො, යොචායං අත්තකිලමථානුයොගො

දුක්ඛො අනරියො අනත්ථ සංහිතො, යනාදී නයින් අප සම්මා සම්බුදු රජාණන් වහන්සේ සිය නැණින් දැන වදාළ අන්ත දෙකින් තොර වූ ආර්ය මාර්ගය හෙවත් ප්‍රතිපදාව දුක්ඛාදී චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කර ගන්නට එකම මාර්ගය වන්නේ යැයි දේශනාව ආරම්භ කළ සේක.

කාමසුඛල්ලිකානු යෝගය පුද්ගලයාට මෙන්ම සමාජයට ද අහිතකර වන්නේ ය. ඇස්, කන්, නාසාදී ඉඳුරන් තමා සතු වුව ද රූපාදී අරමුණු ගත යුත්තේ බාහිර ලෝකයෙන් බැවින් අන්තගාමී සුඛ විහරණයේ දී පොදු සමාජ අයිතියක් බලෙන් සතුකර ගැනීමේ ප්‍රවණතාවක් ඇතිවන අතර, විශාල සමාජ පීඩනයක් ද ඇති වන්නේ ය.

කාම තණ්හාවේ ආදීනව අපමණ වන අතර, එයින් වළකින්නේ නම්, අපායගාමී කාම මිථ්‍යාචාරාදී අකුසල සිදුවන්නේ නැත. කාම දාහයෙන් තැවෙන්නාට මෙලොව දී ම මහා දුක් වේදනා විඳින්නට සිදුවන අතර, මරණින් මතු සතර අපායේ උපදින්නට සිදු වන්නේ ය.

මෙම අන්ත දෙකම අනර්ථකාමී නම් අප අනුගමනය කළ යුත්තේ මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. ජාති, ජරා, ව්‍යාධි, මරණ යන ප්‍රධාන දුක් දොම්නස් ඇතුළුව සත්වයා විඳින දුක් දොම්නස් මෙතෙක් යැයි කිසිම කෙනකුට සීමා කරන්නට නොහැක.

සම්මා දිට්ඨියේ පටන් පිළිවෙළින් සම්මා සමාධිය දක්වා ආර්ය මාර්ගාංග ලෞකිකත්වයේ පටන් ගෝත්‍ර භූඤාණය දක්වා මෙන් ම සෝවාන් මාර්ගය. සකදාගාමී හා අනාගාමි මාර්ගයට හා අරහත් මාර්ග ඤාණයට ද බලපවතින්නේ ය. එමෙන්ම අධිශීල, අධිචිත්ත, අධිප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙන් පරිභාවිතව සක්කාය දිට්ඨි ආදී සංයෝජන පිළිවෙළින් මාර්ගාංග අනුව සිඳ බිඳ දමා අමා මහ නිවන් ප්‍රත්‍යක්ෂ කරන්නේ ය.

# මෘදු ගුණය ජීවිතයට ආභරණයකි



මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝසභික
හා උපාධ්‍යාය ධූරන්ධර
වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක
මහාචාර්ය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

**සෑම පුරපසළොස්වක දිනයක් ම තුළ අප විසින් කරණීයමෙත්ත සූත්‍රය ආශ්‍රයෙන් සිදු කෙරෙන ධර්ම කරුණු විමසා බැලීමේ දී අද දවසේ පැහැදිලි කර දීමට උත්සාහ වන්නේ මෙම සූත්‍රයේ එන සිව්වැනි කරුණ වන "මුදු" කියන මේ දහම් පදය යි. එක්වරම වඩාත් දුරට නොගියත් අපේ භාෂාවේ මෙම වචනය බහුල වශයෙන් භාවිත වෙනවා.**

මෙහි සාමාන්‍ය මිශ්‍ර සිංහල වචනය වන්නේ "මෘදු" යන වචනය යි. ඉතින් මෙහි සරල අදහස ගත්තොත් එයින් කියැවෙන්නේ මොළෙ ාක් ගතියයි. තැවෙන ගතියයි. විශේෂයෙන් යම් කරුණක් පිළිබඳ ඇතිකරගනු ලබන දැඩි ස්වභාවයෙන් වෙන් වූ ගතිය යි. අපේ සමාජයේ බහුල වශයෙන් මේ ගුණය නිතර ප්‍රදර්ශනය කරන්න සැබෑ මවුවරුන්, පියවරුන් මුල් තැනක් ගන්නවා. මෙහි දී මම සැබෑ යන වචනය යෙදුවේ දරුවෙකු ලොවට බිහි කළ පමණින් මවක් හෝ ඊට දායක වූ පමණින් පියෙක් කියා අප කිවුවත් එයම මාතෘත්වය හෙවත් මවු පදවිය දැරීමට හෝ පියපදවිය දැරීමට සුදුසුකමක් වන්නේ නැහැ.

හුණුවටයේ කථාව කියලා අපේ ප්‍රසිද්ධ සිංහල නාට්‍යයක් තිබෙනවා. ඒක හරිම ප්‍රසිද්ධ නාට්‍යයක්, මෙම නාට්‍යය බර්ටෝල්ට් බ්‍රෙස්ට් නම් ජර්මන් ජාතික නාට්‍ය කරුවාගේ කත්කන සබ එයැ ක්සරජකැ නම් නාට්‍යය සිංහලට නඟා රංගනයට පත් කළ එකක්. මෙහි එන එක කවියක පදයක් වන්නේ

***මවු ගුණය ඇති අය දරුවන් දිනිය යුතු වෙය.***

මෙහි කතුවරයා මවු ගුණය ලෙස අදහස් කර ඇත්තේ දරුවා පිළිබඳ දැක් වූ මෘදු ගුණය බව එම නාට්‍ය රංගනය බලන කවරකුට වුව ද පැහැදිලි වෙයි. මේ අනුව දඩබ්බර, රළුපරළු, ගොරෝසු ගතියෙන් තොරව කය, වචනය, සිත යන දොරටු තුනෙන් ම සිදු වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඇති වන සංවරයේ ස්වභාවය යි මේ. මෙතැන දක්නට ඇත්තේ මනාව හික්මුණු ශිලාචාර බවක්. මෙහි දී සිත ඇතුළත් වන්නේ කායික හා වාචසික සියලු ක්‍රියාකාරකම් සියල්ල සිත මුල් වී සිදු වන බව නිසා ය.

මුඛය නැතිනම් කටත්, ශරීරයෙන් පෙන්වන ඉරියව් යන අංශ දෙකෙන් ම අපේ සිතේ පවත්නා මේ මෘදු ගුණය ප්‍රකාශ වෙනවා. බහුල වශයෙන් ම මුඛයෙන් පිටවෙන වචන තුළ අපේ සිතේ පවත්නා වූ මොළොක් ගතියේ ස්වභාවය තහවුරු කර ගන්නට පුළුවනි.

කටෙන් අපි වචන පිටකරනවා. මේ වචනයේ ශක්තිය හොඳ නරක දෙකට ම එකසේ බලපානවා. මුඛය හෙවත් කට අපේ ශරීරාංග අතර ප්‍රධාන ඉන්ද්‍රියයක් ලෙස පෙන්වා දෙන්නට පුළුවනි. අපේ මුවින් පිට කෙරෙන වචන තමන්ට මෙන්ම එම වචන අසා ගෙන සිටින අයට ද එක සේ බලපානවා. ඒ වචනවල බලපෑම් ඇති කරන්නේ බාහිර ලෝකයට යි. ඒ වචනවල මෘදු ගුණය සවිමත් වූ තරමට එය තමන්ගේ වාසියට බලපානවා.

ඒ වචන වඩාත් බාහිර ලෝකයට ප්‍රිය වන්නේ එම වචනයේ ඇති මෘදු මොළොක් ස්වභාවය අනුව යි.

බුදුරජාණන් වහන්සේගේ දේශනාව අනුව මෙලොව උපදින සෑම අයෙක් ම එළිය දකින්නේ කටේ කෙටේරියක් ඇතිව බවට බණ පදයක් විස්තර වෙනවා. එහෙම කෙටේරියක් කටේ රඳවා ගෙන මෙලොව කිසිම බිළිඳෙක් උපදින්නේ නැහැ. එහෙම වුණත් මේ බුදුවදනින් කිය වෙන්නේ ඊට වඩා හාත්පසින් වෙනස් වූ අදහසක්.

කෙටේරිය යන ආයුධයේ ලක්ෂණය වන්නේ එහි දෙපැත්තට ම කැපෙන ස්වභාවය යි. මේ කටේ ඇති දෙපැත්ටම කැපෙන ගතිය ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ රුදුරු වචන වැල යි.

රුදුරු වචන භාවිත වන්නේ පුද්ගලයාගේ සිතෙන් මෘදු ගුණය බැහැර වූ තරමට යි. එය තමන්ට මෙන්ම බාහිර සමාජයටත් අහිතකර යි. මෙය ධර්මයේ සඳහන් වන්නේ දුබ්බාසිත වචනය ලෙස යි. එනම් දුර්වචන බව යි. එහි සුවච බව යන්න විරුද්ධාර්ථය යි. සුභාෂිතයක් වන්නේ සිතේ මෘදු ගුණය දියුණු කළ විට යි. එමෙන්ම දුර්වච බවක් ඇති වන්නේ බාල හෙවත් පහත් ගති ඇති නිස යි.

තවත් ආකාරයකින් මේ කරුණ ප්‍රකාශ කරන්නේ නම්, යම් අයකු තමන්ගේ යහපත් පැවැත්මට අවශ්‍ය කරන හිරි ඔතප් යන මේ ගුණ ධර්ම එනම් පවට හෙවත් අයහපත් කරුණු කාරණා පිළිබඳ ඇති කර ගත යුතු ලජ්ජාව හා භය යන සිතිවිලිවලින් තොර වූ තරමට ඒ පුද්ගලයා අඥබාල ගතිවලින් යුක්ත වෙනවා.

තිරිසන් ගත සතකුට පවා මේ මටසිලිටු මෘදු ගතියෙන් යුත් වචන තෙපළන විට එම සතා දක්වන්නේ අපරිමිත සබැඳියාවක්. ඇත්තෙන් ම පුද්ගලයා තුළින් මේ මෘදු ගුණය ඉවත් වන කරුණු කාරණා ද බොහොමයක් සමාජයේ අපට අත්විඳිය හැකියි.

අනුවණ පුද්ගලයා අතට විශාල ධනයක් හිමි වුණොත් එහු ඒ ධනයෙන් මත්වෙයි. මේ ආකාරයෙන් ම විවිධ බලයන් නිසා ද මත්වෙනවා. නිදසුනක් වශයෙන් අපට සමාජයේ අද පහසුවෙන් ම අත්විඳිය හැකි දේශපාලනය මෙහි දී හොඳම කරුණක්. මේ නිසා බොහෝ දෙනෙක් එයින් උඩඟු බවට පත් වී තමන්ගේ මුල අමතක වී ක්‍රියාකරනු දකින්නට පුළුවන්.

එසේ වන්නේ අන්කිසිවක් නිසා නොව අනුවණකම නිසා. එවැනි ලෞකික කරුණු කාරණා කෙරෙහි ගිජුවීමෙන් තමන්ගේ සන්තානයේ කාලාන්තරයක් තිස්සේ දියුණු කර ගත් මෘදු ගතියෙන් ගිලිහෙන්නේ අඥ බාල ගතිය නිස යි. එහෙම වුණත් නුවණැති පුද්ගලයා මේ මොන කරුණු ලාභ ප්‍රයෝජන තාන්න මාන්න හිමි වුවත් වැඩි දියුණු කර ගත් එම මෘදු ගුණය පහව යා නො දී වැඩි දියුණු කරග්නා අයුරු ද අපට මේ සමාජයෙන් කොතෙකුත් නිදසුන් වශයෙන් ලබා ගන්නට පුළුවන්.

ගමන් බිමන්, ඉඳුම් හිටුම්, නින්ද, ආදි මේ සෑම ඉරියව්වක් තුළින් මෘදු ගුණය සැබෑවට ම පවතින පුද්ගලයාගේ වෙනසක් දකින්නට පුළුවන්. එවැනි මෘදු ගුණය ඇති අයෙක් පොදු ප්‍රවාහනයකින් ගමන් කරනවා නම් තමන්ට වයසින් වැඩිහිටි අයෙක්, ගැබිණි මාතාවක් එවැනි බස්රථයකට හෝ නැඟුණු අවස්ථාවක තමන් අසුන් ගෙන සිටි අසුන ඉක්මනින් ම එවැනි අයට ලබා දෙනවා.

වැඩිහිටිකම, පූජනීයත්වය, ගරුබුහුමන් ලැබිය යුත අය දුටු සැණින් වඩාත් නිහතමානි ලෙස ඔවුන් පිළිබඳ ක්‍රියා කරනවා. පිරිසක් මැද කල්ගත කරන අවස්ථාවක, සමිතියක, ජනරාසියක කටයුතු කරන අවස්ථාවක වඩාත් විනීතව, සිත්ගන්නා ලෙස ක්‍රියා කිරීමට එවැනි අයට හොඳ පුරුද්දක් තිබෙනවා.

කිසියම් ක්‍රියාවක්, සතුට ප්‍රකාශ කිරීමක්, මංගල අවස්ථාවක් වැනි කරුණුවල දී පවා බාහිර සමාජයට එවැනි අවස්ථාවක ඇති වන ක්‍රියාකාරකම්වල දී වඩාත් විනිතව ශිලාචාර ලෙස ක්‍රියා කිරීමටත් වගබලා ගන්නවා. මෘදු ගතිය ඇති අය හැම විටම තමන්ගෙන් පිටස්තර වුවන්ගේ සිත් නොතැලෙන ලෙස කටයුතු කිරීමටත් උනන්දු වෙනවා.

අපි මහාත්ම ගතිගුණ ගැන බොහෝ විට කථා කරනවා. එහි දී මහත්මා ගුණයක් ලෙස සඳහන් කරනවා දයා දාක්ෂිණ්‍යය කියලා ගුණ දෙකක්. දයා කියලා එහි දී අදහස් කරන්නේ පරහිතකාමී කරුණා සහගත ස්වභාවයෙන් බාහිර සමාජය කෙරෙහි ක්‍රියාත්මක වීම යි.

දාක්ෂිණ්‍ය යන ගුණයෙන් අරුත් ගන්වන්නේ කිසියම් සමාජ සංවිධානයක, රැස්වීම් අවස්ථාවක, පොදු සාකච්ඡාවක දී හෝ කිසියම් යහපත් යෝජනාවක්, අදහසක් යම් කෙනෙක් ඉදිරිපත් කළාම ඊට එකඟ නො වී තමන්ගේ වෙනත් රළු පරළු ගති පෙන්වා ඇතැම් අය ක්‍රියා කිරීම.

එහිදී ඒ අයගේ අදහස වන්නේ තමන්ට වඩා හොඳ යහපත් යෝජනාවක් තවත් අයෙක් සමාජය ඉදිරියේ ප්‍රකාශ කළ විට ඊට ඊර්ෂ්‍යා සහිත බවෙන් යුක්තව විරුද්ධ වන ගතිය. මෙය සමාජයේ දකින්ට ලැබෙනවා.

එහිදි දක්නට ලැබෙන්නේ දාක්ෂිණ්‍ය ගුණයෙන් තොරවීම යි. තමන් නොදන්නා යහපත් දේ සමහර විට තමන්ට වඩා වයසින් බාල දරුවන්ගෙන් පවා අසා දැනගෙන නිහතමානිව කටයුතු කිරිමත් මෘදුගුණය ඇත්තන්ගේ තවත් සුවිශේෂ ලක්ෂණයක්.

ධර්ම සේනාපති සැරියුත් මහ රහතන් වහන්සේ එදින ම පැවිදි වූ සත් වයස් සපිරි දහර සාමණේර හිමිනමක විසින් පවා සුළු අඩුපාඩුවක් පෙන්වා දුන් අවස්ථාවේ එය මුදුනින් ම පිළිගැනිමට තරම් ක්‍රියා කළේ මේ උදාර මෘදු ගුණය නිසාය. ඉතින් මේ ගුණය බාල, මහලු, දැන උගත්, නූගත්, කොයි කවුරුත් විසින් ජීවිතයට හුරුපුරුදු කර ගත යුතු උදාර ගුණයක්. ජීවිතයට ලස්සන ආභරණයක්.



# සිත සකසා සැප ලබන්න



**තථාගතයන් වහන්සේගේ නිරන්තර සාකච්ඡාවට බඳුන් වූ කරුණු අතර මූලික ස්ථානයක් සිත පිළිබඳ යොමු වී ඇති ආකාරය ත්‍රිපිටක ධර්මය තුළින් අනාවරණය වේ. ධම්මපද පාළියෙහි චිත්ත වග්ගය ද සිත පිළිබඳ ඉතා සරලව අපිට තොරතුරු සපයන එක් ස්ථානයකි.**

විවිධ උපමා උපමේයයන් ද මේ සඳහා යොදා ගෙන ඇති අයුරු දැක ගත හැකි ය. එහි ඇති සැලීම් ස්වභාවය පමණක් නොව චපල බව පිළිබඳ ද තොරතුරු සඳහන් වේ.

එමෙන් ම නොරැකිය හැකි බව පමණකුදු නොව වංක බව පිළිබඳවත් එසේ ඇද ගැසෙන සිත වඩු කාර්මිකයකු ලීයක ඇද හරින්නාක් මෙන් සෘජු කර ගත යුතු ආකාරය ද දැක්වේ.

එසේම සිතෙහි ඇති සැළෙන බව දැක්වීම සඳහා දියෙන් ගොඩගත් මත්සයකුගේ හැසිරීම් රටාව අපේ අවධානයට ලක්කොට ඇත. මෙම වංකභාවයත්, සැළෙන ස්වභාවයත් අප විසින් සවිමත් කර ගතයුතු වන්නේ කෙලෙස් දුරලීමේ දුෂ්කර ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීම සඳහා බව ඉතා පැහැදිලි ය.

පුහුදුන් සත්වයින්ගේ නිරන්තර අපේක්ෂාව වන්නේ සැප කැමතිවීම මෙන් ම එම සැප ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක වීම ය. සැපයෙහි ස්වභාවය ලෞකික සහ ලෝකෝත්තර යනුවෙන් දෙයාකාර වේ. ලෞකික සැප අපේක්ෂාවෙන් නිරන්තරව උත්සාහ වන බොහෝ පිරිසක් වේ. “අස්සාදනීයත්වය” එහි ස්වභාවය වේ.

ලෝකෝත්තර සැපයෙහි සුවිශේෂත්වය වන්නේ අවින්දනීය බව ය. එය සැපයක් වන්නේ ද එනිසාම ය. කෙසේ නමුත් කිනම් සැපයක් සඳහා වුව ද අපේ සිතට හිමි වන්නේ ප්‍රමුඛතාවක් ම ය. ධම්මපද පාලියෙහි ඇතුළත් මෙම ගාථා ධර්මයෙන් පැහැදිලි කරනුයේ සිතෙහි ඇති මෙම ස්වභාවය පිළිබඳයි.

**දුන්නිග්ගහස්ස ලහුනෝ**
**යත්ථ කාම නිපාතිනෝ**
**චිත්තස්ස දමතෝ සාධු**
**චිත්තං දන්තං සුඛා වහං**

මෙහි ඇතුළත් “දුන්නිග්ගහස්ස” යන යෙදුම දමනය කිරීමට ඇති අසීරුතාවපැහැදිලි කරන්නකි.

සිත ඉතා දුෂ්කරව දමනය කරනවා මතු නොව එක් අරමුණක තබා ගැනීමේ නොහැකියාව ද පෙන්නුම් කෙරේ.

කෙසේ නමුත් සිතෙහි හීලෑ බව සඳහා ධර්මය ම හේතුවන අතර, ඒ සඳහා කිසිදු විකල්ප මාර්ගයක් නොගත හැකි වේ.

“ලහුනෝ” යන්න ක්ෂණිකව සිදුවන සිතෙහි හට ගැනීම හා බිඳීයාම ඉතා යුහුසුළුව සිදුවන අයුරු ප්‍රකාශ කරන්නකි. මරණ ධර්මය පිළිබඳ කරන විග්‍රහයන් හිදී ක්ෂණික මරණය ලෙස දක්වා ඇත්තේ ද මෙම කරුණම ය.

“යත්ථ කාම නිපාතිනෝ” මින් අදහස් වන්නේ ද සිත තමා කැමති අරමුණ කරා අප නොදැනුවත්ව ම ගමන් ගන්නා බවයි. සිත, සිත කැමති ඕනෑම තැනක රැඳිය හැකි බව මින් ප්‍රකාශ වන අතර, එහිදී උස් පහත්කම් හෝ නෑ නොනෑකම් විෂය වන්නේ නැත. කායිකව සිදු වන සිරගත කිරීමක දී වුව ද සිත තම රුචිකත්වයන් හා සමඟ නිදහස් ව හැසිරෙන අයුරු මින් පැහැදිලි කෙරේ. මෙබඳු වූ සිත හීකරු කර ගැනීම ම නොව දමනය කර ගැනීම කළ හැකි වන්නේ නම් “සුඛාවහං” ලොව්තුරා සැප සඳහා මං පෙත් විවර වන බව ධර්මයෙහි දැක්වේ.

මේ අනුව සැප අපේක්ෂා කරන්නන්ගේ වගකීම වන්නේ “චිත්තං දන්තං” යනුවෙන් දැක්වෙන පරිදි තම සිත මනාව හීකරු කර ගැනීම ය. බුද්ධ ධර්මය මනෝ මූලික ධර්මයක් වශයෙන් සමයාන්තරව සුවිශේෂී ඉගැන්වීමක් බවට පත්ව ඇත්තේ ද තම වගකීම තමා විසින් ම සම්පූර්ණ කොට ගෙන සැප ළඟා කර ගත යුතු වන නිසා විය යුතු ය.

එළඹ ඇති වස්සාන සමයෙහි ඉතිහාසය තථාගත ධරමාන කාලය දක්වා දිවෙන්නක් බව අපේ ධර්ම සාහිත්‍ය මඟින් අනාවරණය කරනු ලැබේ. එහි දැක්වෙන තොරතුරු අනුව අතීතයේ සිටම මෙම උතුම් පින්කම සඳහා භික්ෂු භික්ෂුණීන් ද මතු නොව දායක දායිකාවන් වශයෙන් ගිහි සමාජය ද දක්වා ඇත්තේ විශාල උනන්දුවකි.

භාග්‍යවතුන් වහන්සේ මේ සඳහා ශ්‍රාවක ශ්‍රාවිකාවන් උනන්දු කර ඇත්තේ තමන් වහන්සේ ද මෙම චාරිත්‍ර ධර්මයෙහි නිරත වෙමිනි. බරණැස ඉසිපතන මිගදාය කේන්ද්‍ර කොටගෙන ඇරඹුණ මෙම දීර්ඝ කාලීන ව්‍යායාමයෙහි නියැළෙන ලද්දේ, එය විනය ප්‍රඥප්තියක් වනවා මතු නොව ශාස්තෘ නියමයක් ලෙස ද සලකමින් ය.


ඒ අනුව ආරාධනා ලැබ හෝ නොලැබ මෙම උතුම් සිරිතෙහි නියැළීම සඳහා ඇතැම් විට භික්ෂූන් වහන්සේ ගව් ගණනක් යොදුන් ගණන් පා ගමනින් වැඩම කර ඇති අයුරු අපේ ධර්ම සාහිත්‍ය මඟින් වාර්තා කොට ඇත. එසේ ගමන් ගන්නා භික්ෂූන් මුහුණ දෙන ලද දේශගුණික සහ පාරිසරික ගැටලු පමණක් නොව ගෝචරස්ථාන පිළිබඳ දුෂ්කරතාවන් පිළිබඳව ද සඳහන් වේ.

එමෙන්ම අමනුෂ්‍ය උපද්‍රව ද මතු නොව විවිධ මනුෂ්‍ය උපද්‍රව ද විඳ දරා ගනිමින් මෙහි නියැළුණු ආකාරය සැබැවින්ම අනුවේදනීය වේ.

බුදුරදුන් තව්තිසාව ආදී දිව්‍ය ලෝකයන්හි පවා වස් වසා වැඩ සිටි අතර “යව” වැනි රළු ආහාරයන් ද වළඳමින් අති දුෂ්කරතාවන්ගෙන් යුතුව වේරංජාවේ දී වස්සාන සමයක් ගෙවාලු ආකාරය ද ප්‍රකට සිදුවීමකි.

කෙසේ නමුත් මෙම විශේෂිත කාල සීමාව තුළ දී කිසියම් මාර්ගඵලයකට පත්වීම දායක දායිකා අපේක්ෂාව වූයේ මතු නොව භික්ෂූන් වහන්සේගේ ව්‍යායාමය ද වූයේ වස්සානය නිම වීමට පෙර කෙසේ හෝ නිර්වාණ අවබෝධය ලබා ගැනීම ය.

තත් කාලීනව බොහෝ ශ්‍රාවකයන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් ලබන ලද කමටහන් ඇතිව මහත් වීර්යයෙන් යුතුව එම උතුම් සුවය අත්විඳීම සඳහා අධිෂ්ඨානශීලී වූහ.



කොළඹ 06, හැව්ලොක් සිටි, සාමවිහාරාධිපති
**අතපත්තුකන්දේ ආනන්ද හිමි**

ඉහත ගාථා ධර්මය දේශනා කොට ඇත්තේ ද වස්සාන සමයක සිදු වූ එබඳු සිදුවීමක් පාදක කොටගෙන ගත් එක්තරා භික්ෂුවක් අරමුණු කොටගෙන ය.

ධනවත්, සැදැහැවත් බවින් ද පරිපූර්ණ මාතිකමාතා නම් වූ උපාසිකාවක් වූවා ය. ඇය නිරන්තරයෙන් ම තම පුණ්‍ය මහිමයෙන් ලබන ලද ධනය පරිහරණය කරන ලද්දේ පරලොවට ද ගෙන යා හැකි අයුරින් ය.

බුද්ධාදී රත්නත්‍රය පිළිබඳ වූයේ අසීමිත විශ්වාසයක් ද මතු නොව ගෞරවාන්විත වූ පිළිගැනීමකි. එක්තරා වස්සාන සමයකට ආසන්නව සැට නමක් පමණ වූ භික්ෂු පිරිසක් එම ගමට වැඩමවන ලද්දේ, එම උපාසිකාව ඉතා මිහිරි අයුරින් දන් පැන් සකසා දෙමින් මහත් ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

භික්ෂු පිරිස පිළිබඳ අතිශය ‘ප්‍රසාදයට පත්ව සිටි මාතික මාතාවෝ එළඹෙන වස්සාන සමයෙහි වස් වසා වැඩ සිටීම සඳහා රමණීය වූ ආරාමයක් ද තනවා පූජා කළාය. එමතු ද නොව වස් විසීම සඳහා ආරාධනා කරනුයේ සිව්පසයෙන් පූජා පවත්වමින් සංඝෝපස්ථානයෙහි නියැළුනේ ද මහත් ශ්‍රද්ධාවෙන් යුතුව ය.

භික්ෂු පිරිසද එම උපාසිකාවගේ ශ්‍රද්ධා මහිමය තේරුම් ගෙන ඇයට ද අනුග්‍රයක් වශයෙන් වෙන් වෙන්ව අධිෂ්ඨානශීලී ව භාවනාවෙහි නියැළුණි. එක් දිනක් ආරාමයට ගිය මාතික මාතාවන්ට කිසිදු භික්ෂුවක් දක්නට නොලැබීමෙන් කැළඹුණ සිතැත්තී සීනුව නාද කරන්නී එක් එක් නම වෙන් වෙන් මාර්ගවලින් තනි තනිව පැමිණීම දැක විමතියට පත් වුණි, භික්ෂු පිරිස කිසියම් කරුණක් නිසා අසමගිව අසතුටින් වෙන්ව සිටිතැයි සැක සිතුවා මතු නොව විමසුම් කරන්නී ලද පිළිතුර වූයේ තමන් වහන්සේ සිදු කරන භාවනාව සඳහා ඇති විය හැකි බාධා අවම කිරීම සඳහා එක්ව නොවෙසෙන බවයි.

මේ අනුව භාවනාව පිළිබඳ කිසියම් අවබෝධයක් මෙන් ම රුචියක් ඇති කර ගත් එම උවැසිය තමන් ද එහි යෙදිය යුතු යැයි දිරිමත්ව කායගතාසති භාවනාවෙහි යෙදුණි. අනාගාමී ඵල සුවය ලබා ගැනීමට සමත් වූවා ය.

අනතුරුව වස් විසූ භික්ෂු පිරිස එතෙක් මගඵල ලාභී නොවන බව දැන රහත් භාවය ලබා ගැනීම සඳහා විවිධ අයුරින් උනන්දු කරවන ලද්දේ භික්ෂූහුද අධිෂ්ඨානශීලීව බවුන් වඩා රහත්භාවයට පත් වූහ.

බුදුරදුන් හමුවේ දී මාතික මාතාවගේ බහුවිධ ගුණයන් ද ප්‍රකාශ කළහ. මෙම සිදුවීම අසා සිටි එක්තරා භික්ෂුවක් එම ස්ථානය හා උපාසිකාව සොයා යන්නේ ඇයගේ අනුග්‍රහය ද නොඅඩුව ලබමින් භාවනාව සඳහා යොමු වූයේ නමුදු උපාසිකාවගේ පරසිත් දන්නා නුවණ පිළිබඳ දැන බියපත් ව බුදුරදුන් මුණ ගැසී තමන්ට මුහුණ දීමට සිදු වූ ගැටලුව ප්‍රකාශ කරන ලදී.

පුහුදුන් තම සිතට නැඟෙන විවිධ පාපී සිතිවිලි උපාසිකාව විසින් දැකිය හැකි යැයි සිතා පසුගාමී වූ එම භික්ෂුව දිරිමත් කළ තථාගතයන් වහන්සේ, සිත රැක ගැනීම දුෂ්කර වුව ද එම ව්‍යායාමය සැපය සඳහා හේතු වන බව දේශනා කරමින් හෙතෙම නැවතත් එම ස්ථානයටම යොමු කරන ලදහ.

අනතුරුව උපාසිකාවගේ අනුග්‍රහය ලබමින් දැඩි සේ භාවනාව සඳහා උත්සාහවත්ව ක්‍රියා කළ එම තෙරුන් රහත් භාවයට පත්වීමේ සිදුවීම උක්ත ගාථාව දේශනා කිරීම සඳහා හේතු වී ඇත.

# සසුන්ගත වීම අමතක කරවන වංචනික කෙලෙස් හඳුනා ගනිමු




දෙහිඅත්තකණ්ඩිය
කපුවත්ත ආරණ්‍ය සේනාසනයේ
ශාස්ත්‍රවේදී
**බිබිලේ ධම්මසිරි හිමි**

***නතාවතා ධමමධරෝ යාවතා බහුභාසතී
යෝ ච පුප්පම්පි සුත්වාන ධම්මං
කායේන පස්සති
සවේ ධම්මරෝ හෝති යෝ ධමමං නප්පමජ්ජතීත***

" මහණෙනි, මම යමෙක් බොහෝ කොට බණ උගෙන, බොහෝ කොට බණ කියයි ද? එහෙත් ඔහු ධර්මධර යැයි නොකියමි. යමෙක් එක් ගාථාවක් නමුත් උගෙන සත්‍යය පිළිබඳ දනී නම්, මේ තෙමේ ධර්මධර නම් වේ" යි වදාළ සේක.

එසේ දේශනා කිරීමට හේතුව මෙයයි. එකුදාත නම් ස්ථවිරයන් වහන්සේ නමක් එකම ධර්මයක් හොඳින් ප්‍රගුණ කළහ. වනයේ හුදකලාව වසන උන්වහන්සේ පෝය දිනයන්හි වනයේ සිටින දෙවියන්ට බණ දේශනා කරන්නාහ. දෙවි දේවතාවෝ ද වනය පුරාවට සාධු හඬ පතුරුවන්නාහ.



එක් දිනක් ත්‍රිපිටකධාරී ව ධර්මය උගත් දෙනමක් පැමිණ එකුදාත භික්ෂුවගෙන් විස්තර අසා දැනගෙන, අවසර ගෙන දෙවි දේවතාවන්ට බණ දේශනා කළහ. එක් නමක් පෙළ දහම කී අතර, අනෙක් නම එහි අරුත් පැවසී ය. බණ අවසන් විය. එක් දෙවිකෙනකුවත් සාධුකාර නොදුන්හ.

දෙවියන් ද මුහුණ බලා සාධුකාර දෙන බව පවසමින් ඒ දෙනම උරණව පිරිසත් සමඟ පිටව ගියහ.

බුදුරජාණන් වහන්සේට මෙම පුවත සැළ විය. ඉහත සඳහන් ගාථා රත්නය ඔවුන්ට දේශනා කොට හරි වැරැද්ද පහදා දුන් සේක. එදත් ධර්මය වරදවා ගත් බොහෝ දෙනා සිටියහ. එසේ නොමඟ ගිය ගිහි පැවැදි පිරිස් අදත් සිටිති.

වර්තමානයේ පොත පතින් ද විවිධ සන්නිවේදන මෙවලම් මඟින් ද වහ වහා කරුණු රැස් කරමින් ධර්ම කරුණු සියල්ල මතකයේ ගබඩා කර ගැනීමට අද බොහෝ ගිහි පැවිදි පිරිස් සමත් වී සිටිති. එය ප්‍රශංසනීය කරුණකි.

එහෙත් මින් බොහෝ දෙනා රැවටෙන්නේ තමන් ධර්මය හොඳින් දන්නා නිසා ධර්මාවබෝධයට පත් වී ඇතැයි මුළා වීමෙනි. දැනුම තිබූ පමණින් කෙලෙස් ප්‍රහාණය වීමේ ස්වභාවයක් නැත. ධර්මය දැන දැක ගැනීම තුළින් යථාර්ථය කරා ගමන් කළ හැකි බව අවබෝධ විය යුතු ය.

ධර්මධර වීමෙන් සියල්ල ඉෂ්ඨ සිද්ධ වී යැයි, වංචනික ලෙස තම සන්තානය තුළින් මතු වන කෙලෙස්වල ස්වභාවය දැන දැක ගන්නා බොහෝ දෙනා මේ උගුලට හසුවන්නේ නැත. ඔවුහු සියල්ල කරමින් ම කෙලෙස් මළ බැහැර කිරීමේ ප්‍රති පදාවෙහි ද යෙදෙති. එය ද ප්‍රශංසනීය ලෙස අගය කළ හැකි ය.

බුදු සසුන තුළ උතුම් වූ චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීමට නිවන් මඟ හඳුනා ගත යුතු ය. එසේ නොවුණ හොත් මෙම බුද්ධ ශාසනය ද අහිමි වනු ඇත. දහම් දැනුම තිබෙන පිරිස් අපේ රටේ වටිනා සම්පත් පුද්ගලයෝ වෙති. බුදුරජාණන් වහන්සේ පන්සාළිස් වසක් පුරාවට ධර්ම දේශනා කළේ විවිධ පුද්ගලයන්ට ය. ඒ ඒ පුද්ගලයාගේ ධර්මාවබෝධයට ප්‍රමාණවත් පරිදි ධර්මය දේශනා කළහ. එසේ දේශනා කළ ත්‍රිපිටක ධර්මය මතක තබා ගැනීම පමණක් නිවන් මඟට ප්‍රමාණවත් නොවේ. ඒ බව තහවුරු කරමින් සිදු කෙරෙන ධර්ම දේශනා ද විවිධ නාළිකා තුළින් ඇසෙන්නේ ය. එයත් ප්‍රශංසනීය කරුණකි.

බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ පහාරාද සූත්‍රයේ සඳහන් වන ආකාරයට මේ ගාම්භීර ධර්මයේ අනුපිළිවෙළක් ඇත. සාගරය ගැඹුර කරා ගමන් කරන්නේ අනු පිළිවෙළකට ය. එකවර ගැඹුරක් නැත. ඒ නිසා අසුරයෝ මහා සාගරයේ ඇලී වාසය කරති.

බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ශ්‍රාවක පිරිස මේ ධර්ම විනයට කැමැති වන්නේ ද පිළිවෙළින් ගැඹුරට ගමන් කරන ගාම්භීර ධර්මයක් නිසා බව භාග්‍යවතුන් වහන්සේ වදාළහ. එහෙත් මෙම ගැඹුරු ධර්මය තමන් තුළින් නොදැක දැනුම නැමැති මිරිඟුව තුළ හිරවී සිටින අය එදා ද මහණදම් කළහ.

සැවැත් නුවර සිටි යහළුවෝ දෙදෙනෙක් එකට මහණ වූහ. දෙදෙනාගෙන් සිටිය මහලු භික්ෂුව විදර්ශනාධූරය තෝරාගෙන නොබෝ කලකින් රහත් භාවයට පත් වූහ. ග්‍රන්ථ ධූරය තෝරා ගත් අනෙක් තරුණ භික්ෂුව ත්‍රිපිටකධාරී ධර්ම කථික වූහ. එම භික්ෂුව දිවා රාත්‍රී දෙකෙහිම පන්සියයක් භික්ෂූන්ට දහම් දෙසති. උන්වහන්සේ අටළොස් මහා ගනයට මහ ඇදුරු වූහ.

තම යහළු අනෙක් භික්ෂුව රහත් වූ බව නොදත් මෙම භික්ෂුවට මෙවැනි සිතිවිල්ලක් පහළ විය." මගේ යහළු භික්ෂුව දැන් කැළ යට වෙලා නිකන් ඉන්නවා. කිසිම දෙයක් ඉගෙන ගෙන ද නැත. පිටකය දන්නේ නැත. ගිහිල්ලා ප්‍රශ්නයක් දෙකක් අහන්න ඕන." කියල පවිටු සිතක් පහළ විය.

මේ සිතිවිල්ල අප භාග්‍යවතුන් වහන්සේ දැන ගත් සේක. ඔහු අකුසලයක් කර ගන්නා බව දැන අනුකම්පාවෙන් බුදුරජාණන් වහන්සේ එම ස්ථානයට වැඩම කළහ. ධර්ම කථික භික්ෂුවගෙන් ධ්‍යාන පිළිබඳ ඇසූ ප්‍රශ්න සියල්ලට ම දක්ෂ ලෙස පිළිතුරු දුනි. එහෙත් මාර්ගඵල පිළිබඳ ඇසූ එක ප්‍රශ්නයකටවත් පිළිතුරු දීගත නොහී නිරුත්තරව බලා සිටියේ ය.

විදර්ශක මහලු භික්ෂුවගෙන් මාර්ගඵල පිළිබඳ බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න කළහ. ඒ ප්‍රශ්න සියල්ලට ම මනා ලෙස පිළිතුරු දුන්හ. බුදුහිමියෝ අවස්ථා හතරක දී සාධුකාර දුන්හ.

බුදුරජාණන් වහන්සේ " මාගේ පුත්‍රයා මේ ශාසනයෙහිලා සැලකිය යුත්තේ, තමන් කැමැති සේ කිරි ගිතෙල් ඈ පස්ගෝ රස කන බොන ගව හිමියකු වැනි ය. ග්‍රන්ථ ධූරය පමණක් පුරණ මේ භික්ෂුව කුලියට හරක් බලන කුලීකාරයකු වගේ යැයි වදාළහ. ඒ බව " ගා පෝව ගාවෝ ගනයං පරේසං න භාගවා සාමඤ්ඤස්ස හෝතී" යන ධම්ම පදයේ එන යමක වර්ගයට අයත් ගාථා රත්නයකින් ද කියැවේ.

බුදුරජාණන් වහන්සේගේ ජීවමාන කාලයේ සිදුවූ මෙවැනි සිදුවීම්වලට සමාන සිදුවීම් වෙනත් ස්වරූපයකින් අද සිදුවන බව රහසක් නොවේ. එදා එවැනි අවස්ථාවක බුදුපියාණන්ගේ මහා කරුණාව ලැබුණි. එවැනි අය වෙතට අද කරුණාවක් දක්වන්නෝ කවරහු ද? සැබෑ කල්‍යාණ මිත්‍රයන්ගේ ඇසුර මේ සඳහා අවශ්‍ය වන බව ධර්ම මාර්ගය හඳුනාගෙන එහි ගමන් කරන බොහෝ දෙනා අදහස් කරති.

බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කළ ධර්මය වගේ දහමක් දේශනා කොට තම තමන්ගේ පෞද්ගලික මතවාද සමාජ ගත කිරීමට උත්සාහයක යෙදෙන බණ ද අද අසන්නට, දකින්නට ලැබේ. පුංචි පුංචි වචන එහාට මෙහාට කරමින් අලුත් අර්ථයක් ඉස්මතු කර ඒ තුළින් තම තමන්ගේ පටු අර්ථයන් සාධනය කර ගැනීමටත් කියන බණ ද ඇසෙයි. අත්තුක්කංසන, පරවම්බන යන කෙලෙස් ධර්මයන් ඉස්මතු කෙරෙන බණ ද ඇසෙයි. සිනහව, කුතුහලය, සැකය, විහිළුව, වැනි පහත් රුචියක් ඇති කරවීමට සමත් ධර්මය , අධර්මය මිශ්‍ර බණ ද අද මාධ්‍ය තුළින් ඇසෙයි.

මේ කිසිත් නොදත් බොහෝ අසරණ ශ්‍රාවක පිරිස් අතරමංවී සිටිති. බොහෝ පෘතග්ජන බෞද්ධ ශ්‍රද්ධාවන්ත පිරිස් වැරැදි මඟ බොහෝ දුර ගොස් ද සිටිති. තව සමහර දෙනෙක් කබලෙන් ළිපට වැටුණාක් මෙන් අන්ද මන්ද වී සිටිති.

බලය, කීර්තිය, ධනය වැනි අධර්මචාරී මනෝ මූලික සංකල්පයන් යහ ගුණ ධර්මයන් අභිබවා නැඟී සිටින සමාජයක් වර්තමානයේ නිර්මාණය වී ඇත. එය සත්‍යයකි.

එහෙත් තව අවුරුදු 2500 ක් හෝ මේ බුද්ධ ශාසනය පවතී යැයි බොදු ජනයා අතර විශ්වාසයක් පවතී. ඒ උතුම් බලාපොරොත්තුව ඉෂ්ඨ සිද්ධ කර ගැනීම සඳහා ජාතියේ මුරදේවතාවන් ලෙස කටයුතු කළ යුතු වන්නේ බුදුපියාණන් වහන්සේගේ බුද්ධ පුත්‍රයන් ය.

එහෙත් බුදුපියාණන් වහන්සේගේ බුද්ධ වචනයට අනුව භික්ෂුව ශ්‍රාවක ධර්මයෙහි පිහිටා නිවන් පසක් කර ගත යුතු ව ඇත. අවසාන බුද්ධ වචනයෙහි

"හන්දධානි භික්ඛවේ ආමන්තයාමිවෝ වය ධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේත"

සඳහන් වන්නේ ද අප්‍රමාදීව කටයුතු සම්පාදනය කර ගන්නා ලෙස ය. ඒ අනුව

"සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ච කරනත්තාය. ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජේත මං භන්තේ" කියමින් ශාසනයට ඇතුල් වන භික්ෂුවට ඒ ඉල්ලීම අමතක වී නම් එය තමන්ට තමන් කර ගන්නා විශාල අලාභයකි. ශාසනය රකිනවා ද? තමන් රැකෙනවා ද? මේ ද්වතාවයට පිළිතුරු තමන් තුළින් දැන දැක ගැනීමට නම් ප්‍රඥා ඇසම අවධි කළ යුතු ව ඇත.

***"ප්‍රඥ වන්තස්සායං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස"
බුද්ධ අනුශාසනාව පිළිපදිමු."***

# ගුණ ඇත්තන්ට දෙන දානයේ විපාකය ප්‍රමාණය කරන්න එපා



**අතීතයේ ලක්දිව කම්පුව නමින් ගමක් තිබුණා. හෙළදිව අවසන් මහරහතන් වහන්සේ යැයි ප්‍රසිද්ධ මාලෙය්‍යදේව හෙවත් මලියදේව තෙරුන් වහන්සේ ඒ ගම ඇසුරු කරගෙන දිනපතා පිණ්ඩපාත චාරිකාවේ වැඩම කළා.**

උන්වහන්සේ එක් දිනක් උදෑසනින් නැඟිට පාත්‍ර සිවුරු අරගෙන පහත හෙළාගත් ඇස් ඇතිව සිහියෙන් යුක්තව ගෙපිළි වෙළින් පිඬුසිගා වැඩියා. එසේ වඩින තෙරුන් වහන්සේ දුගී පවුල් කිහිපයක් ජීවත්වන පෙදෙසකටයි මේදින වැඩම කළේ. එහි ජීවත්වුණා ඉතා දිළිඳු වූ, අසරණ වූ මහලු කාන්තාවක්.

ඇය ඉතා අපහසුවෙන් සකසා ගත් කැඳ ස්වල්පයක් ආහාරයට ගැනීමට උදෙන්ම සූදානම් වී සිටියා. ඒ මැහැල්ල ඒ මොහොතෙහි ම ඈතින් වැඩම කරන මලියදේව තෙරුන් වහන්සේ දුටුවා. සමීපයට වැඩම කරන තෙක් පෙරමඟ බලා සිට ශ්‍රද්ධාවෙන් කැඳ කෝප්පය පිළිගැන්වූවා. ඇය බොහෝම සතුටට පත් වුණා. බත් උළුවලින් හා පිටිවලින් මිශ්‍ර වූ ඒ කැඳටික අරගෙන තෙරුන් වහන්සේ නිදහස් ස්ථානයකට වැඩම කළා.

මලියදේව තෙරුන් වහන්සේට පිණ්ඩපාතය නො ලැබුණ බව දැනගත් පුවඟුදිවයින් වැසි මිත්‍ර තෙරුන් වහන්සේ නමක් වූ තිස්ස තෙරුන් විසින් භික්ෂූන් වහන්සේ දෙනමක් පිණ්ඩපාතය රැගෙන උන්වහන්සේ වෙත එවා තිබුණා. මලියදේව තෙරුන් වහන්සේ ඒ දෙනම ගෙනා ආහාර පිළිගන්ට අකමැති වුණා.

දුප්පත්, අසරණ, මහලු කාන්තාව පිළිගැන්වූ කැඳටිකම ඇයට අනුකම්පා පිණිස වැළඳුවා. එය වළඳා අවසානයේ දිවසින් බලා වැඩම කර සිටි දෙනම අමතා, ‘පින්වත් ස්ථවිරයෙනි, මා වෙත අද කැඳ පිළිගැන් වූ අසරණ මැහැල්ල සැටකල්පයක් මුළුල්ලේ මෙහි විපාක විඳිනවා”යි ප්‍රකාශ කළා.

තෙරුන්ගේ කීම ඇසූ ඒ පිණ්ඩපාත භෝජනය ගෙනා රහත් තෙරුන් වහන්සේ දෙනමගෙන් එක් නමක් ප්‍රතිඋත්තර දෙමින් “ස්වාමිනි, දුර්භික්ෂ කාලයේ දී දුෂ්කර දෙයක් කළ මේ උපාසිකාව සැත්තෑ කල්පයක් සැප විඳින්නේ යැයි මට පෙනෙනවා” යි පවසා සිටියා. දෙවැනි තෙර නම ඒ බස් අසා, “මහතෙරණුවෝ ආනිශංස ස්වල්පයයි දුටුවේ. ඔබ වහන්සේත් ස්වල්පයයි දුටුවේ. මේ මැහැල්ල අසූකල්පයක් සැප විඳින බව මට පෙනෙනෙවා’යි කියා සිටියා. ඒ භික්ෂු දෙනම නැවත රේවත නම් මහතෙරුන් වෙත ගොස් සැක දුරු කර ගැන්ම සඳහා ඒ කාරණය නැවතත් විමසා බැලුවා. එහි දී උන්වහන්සේ අමතා “ස්වාමිනි, ගැටලුවක් තිබේ, මාලෙය්‍යදේව තෙරුන් වහන්සේට එක් මැහැල්ලක් කැඳ දානයක් පිළිගන්වා තිබෙනවා. උන්වහන්සේ එහි ආනිශංස වශයෙන් සැටකපක් සැප විඳින බව දකිනවා.

මම සැත්තෑකපක් යැයි ප්‍රකාශ කළා. ධම්මගුත්ත තෙරුන් වහන්සේ පවසන්නේ අසූකපක් ඒ මැහැල්ල කැඳ දානයේ විපාක විඳින බවයි. තුන්දෙනා වහන්සේ ම ස්වකීය ශක්ති ප්‍රමාණයෙන් ආනිශංස ප්‍රමාණය කරමින් දකිනවා. ඔබ වහන්සේට කෙතෙක් පෙනේ දැයි කිව මැනවැ”යි විමසා සිටියා. එවිට උන්වහන්සේ දෙනම ඇමතූ රේවත තෙරුන් වහන්සේ

“පින්වත් ස්ථවිරයෙනි,

මලියදේව තෙරුන් වහන්සේත්, තොප දෙදෙනා වහන්සේත්, අල්ප සංඛ්‍යාවක් ම යි දැක තිබෙන්නේ. ඒ මහලු කාන්තාව අනූකපක් සැප විඳීමට භාග්‍ය උදාකර ගෙන තිබෙන බව මට පෙනෙනවා” යි පවසා සිටියා.

මේ භික්ෂු දෙනම සාගරයට ඇතුල්ව එහි වැඩ වසන මහත් සෘද්ධි ඇති නාග තෙරුන් වෙත එළඹ මේ කාරණය තවදුරටත් පැහැදිලි කර ගැනීමේ අදහසින් ඉදිරිපත් කළා.

නාග තෙරුන් වහන්සේ ඒ දෙනම කේලාසපබ්බත විහාරයට යවා එහි වැඩ වසන උන්වහන්සේගේ ශිෂ්‍යවරයකු වූ සාමණේර නමකගෙන් විචාරා දැන ගන්නට සැලැස්වූවා.

ධම්මගුත්ත තෙරුන් වහන්සේත්, අනෙක් භික්ෂුවත් එහි ගොස් සාමණේර නමට ඒ සියල්ල කියා සිටියා. හැම දෙනාගේ ම කීම් ඇසූ, පිරිසුදු නුවණැති, දක්ෂ වූ සාමණේර නම මොහොතක් කල්පනා කොට බලා

“මේ දානය අප්‍රමේය වූ, කල්ප වශයෙන් ගණන් කළ නො හැකි කාලයක් විපාක දෙන්නක්.

එහෙත් මෙහි වරදක් තිබේ, එය පිළිගනු මැනවි. යම් කිසිවකු විසින් පිරිසුදු සිතින් අධික ගුණ ඇත්තන් කෙරෙහි දෙන ලද දානයාගේ විපාකය ප්‍රමාණ කරන්නට යන්න එපා, එය නො වටිනා වැඩක්, අශෝභන දෙයක්, සිත කිළුටු කරන දෙයක්”යැයි දක්වමින් ධර්මාවවාද කළා.

වැඩිමහලු වූ දෙදෙනා වහන්සේ ම එය මහත් ගෞරවයෙන් පිළිගත්තා.

දන්දීමෙන් පසු එහි විපාක කොතරම් දැයි ගණනය කිරීම හෝ ප්‍රමාණය කිරීම හෝ නො වටිනා බවත්, බෞද්ධ ඉගැන්වීම්වලට නො ගැළපෙන බවත්, නිවනට බාධා පමුණුවන බවත් මේ කතා පුවතින් පෙන්වා දෙනවා.

මෙය බෞද්ධ සැදැහැතියන්ටත්, දන් දෙන සෙසු ජන කොටස්වලටත් මහත් උපදේශයක් ලබාදෙන කතා පුවතක්. දුන් දෙයෙහි වටිනාකමත්, එයින් ලැබෙන විපාකත් ගණනය කිරීම නොවැදගත් දෙයක් බවයි මේ කතා පුවතින් පෙන්වා දෙන්නේ.

ඔබ දන් දී වියදම් වූ මුදල ගණනය කිරීමටවත්, ලැබෙන ආනිශංස ප්‍රමාණය කිරීමටවත්, මැන බැලීමටවත් නො යන්න. එය පින්කමක ඇති නො වැදගත්ම දෙයයි. මෙය ඉතා පැරැණි සිංහල බණ කථාවල සඳහන් වන වටිනා කතා පුවතකි.



දඹාන මාවරගල ආරණ්‍ය
සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ
අමරවංශ හිමි**

**මහණ දම් පිරීමට සුදුසු ස්ථානයක් සිල් මෑණියන් වහන්සේ නමක් සොයයි. පුණ්‍ය කර්මයට දායකවීමට කැමැති අයෙකු අමතන්න.**

**දු.ක. 071-0135290**

**පාසල් අධ්‍යාපනයේ නිරත දරුවෙකුට පාපැදියක් ලබාදිය හැකි පිංවත් මහත්මයෙකුගෙන් / මහත්මියකගෙන් උපකාරයක් අවශ්‍යයි.**

**0768492691 / 0775942252**

**මැදි වයසේ පසුවන සාමණේර හිමි නමක්**
ගුරුවරයෙකු හෝ වැඩ විසීම සඳහා විවේකී ස්ථානයක් සොයයි.

**072-3663639**

**පිනට දහමට ලැදි මහත්මියක් සමග තනි නොතනියට තමාගේ කෙනෙකු මෙන් සිටීමට අවු. 50 - 65 අතර කරුණාවන්ත මාතාවක් සොයමි.**

**0715989399**


**පැවිදි වීමට**
ආරණ්‍යයක පැවිදිව වත් පිළිවෙත් පුහුණුවී, භාවනාවට කැමති 60 පහළ දුසිරිතෙන් තොර අය විමසන්න.
075 - 3454571
077 - 2028290

## සුබෝපභෝගී වැඩිහිටි ආශ්‍රමය

බෞද්ධාගමික පරිසරයක් ඇති සුබෝපභෝගී වැඩිහිටි නිවාසය සඳහා වැඩිහිටියන්ට/ වැඩිහිටි නොවන අයට ගෞරවයෙන් කෙරෙන ආරාධනාවයි.
වෛද්‍ය/ හෙදි/ මනෝවිද්‍යා උපදේශන සහිතයි.
ප්‍රනීත ආහාර. නිසංසල පරිසරයකි.

**0716004411/ 0768679454**

## මනෝ විද්‍යා මෝහන ප්‍රතිකාර



මනෝ විද්‍යා මෝහන ප්‍රතිකාර – ඔබගේ කායික, මානසික හා ශාරීරික රෝග එක් ප්‍රතිකාර ක්‍රමයකින් නිට්ටාවටම සුවය.

**බස්නාහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක, මුළු දිවයිනටම සාම විනිසුරු, හෝමියෝපති වෛද්‍ය, මහාචාර්ය, මහාධම්ම රාජාධිරාජ ගුරු සිරිසුමන වංශාලංකාර කාරක සංඝ සභික**


**කැටියපේ ඤාණවිමල නාහිමි**

**0716908746 / 0716908749**

## ගැමුණු දඹදිව වන්දනා

**දින 08 සුබෝපභෝගී හා අර්ධ සුබෝපභෝගී චාරිකාව**

බුද්ධගයාව / බරණැස / නේපාලයේ ලුම්බිණිය / කුසිනාරා නුවර / සැවැත් නුවර / කපිලවස්තු පුර / විශාලා මහනුවර / සුජාතා ගම / රජගහ නුවර / නාලන්දාව / කෙසරියා ස්ථූපය / ඇතුළු සිද්ධස්ථාන



සියලුම ගමන් වායුසමනය කල සුබෝපභෝගී නවීන බස් රථ මගින් /සුබෝපභොගී නවාතැන් පහසුකම් /ලාංකීය ක්‍රමයට පිරිසිඳු ප්‍රණීත ආහාර හා බොතල් කල වතුර / රක්ෂණ ආවරණයක් (කොවිඩ් රක්ෂණය ඇතුලත්ව) / ගමන් බෑගයක් හා අත් බෑගයක් / කණ්ඩායම් ඡායාරූපයක් / DVD තැටියක් / ඉන්දියානු වීසා / නේපාල වීසා / ප්‍රවේශ පත්‍ර ගාස්තු

දුම්රිය ගමන් නැත , ඩොලර් අවශ්‍ය නොවන අතර , ලංකා මුදලින් සම්පූර්ණ චාරිකාව සිදු කරනු ලැබේ

**විශ්වාසය - ආරක්ෂාව - සුවපහසුව සපිරි අසිරිමත් වන්දනාවක්**

A/C කාමර සහිත සුබෝපභෝගී චාරිකාව : රු 195,000/-
අර්ධ සුබෝපභෝගී චාරිකාව : රු 180,000/-

2022 කණ්ඩායම් පිටත් වීම : අගෝස්තු සිට නොවැම්බර්

**අංකඃ 296/ඩී 2, දකුණු බටගම, කඳාන**
**0112232086 / 0714801656 / 0773779770**

## වසර දොළහක දුර්භික්ෂය ඇති වීම නිසා බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දේශනා කරන ලද සිල්පද භාවිතය නැති වීම

බැමිණිතියා සාගත කාලයේ ස්වාමින් වහන්සේලා බහුතරය දිවයින අතහැර යෑමත්, අවුරුදු දොළහක දුර්භික්ෂය නිසා ස්වාමින් වහන්සේ විශාල ප්‍රමාණයක් අපවත් වීමත්, වැඩවිසූ ස්වාමින් වහන්සේලා ආහාර හිඟයටත්, මිනීමස් අනුභව කරන්නන්ගේ තර්ජනයටත් මුහුණ දෙමින් උන්වහන්සේලා, කටපාඩමින් ගෙන ආ ත්‍රිපිටක ධර්මය ආදී ධර්මය ලේඛනගත කිරීමට ඉමහත් වෙහෙසක් දරා ඇත. බැමිණිතියා සාගතයේ ප්‍රතිඵලයක් ලෙස භික්ෂු සංස්ථාවෙහි ඓාවූල වෙනස්කම් නිර්මාණය විය. සාගතය අවසානයේ දී එතෙක් පැවති පිළිගැනීම වූ ප්‍රතිපත්ති ශාසනයට ප්‍රමුඛත්වය ලැබිය යුතුය යන අදහස යටපත්ව ශාස්ත්‍රීය අධ්‍යයනයන්ට, ලාංකේය සංඝ ශාසනයෙහි ප්‍රධාන තැන ලැබුණි. (මේ ගැන වැඩි විස්තර කවුඩාගම්මන රතනසාර හිමියන්ගේ බැමිණිතියා මහා සාගතය පොතේ ඇතුළත්ව ඇත. ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් එම පොතෙන් දැන්වීමට ඇතුළත් කිරීමට සකස්කර ගත් කොටසයි.)

එවකට රට පාලනය කළ වළගම්බා රජු, ස්වාමින් වහන්සේලාගේ පරිහරණයට ඉඩ කඩම් පූජා කිරීමත් තමන්ට උදවු කළ කොටසට වැඩියෙන් සැලකීමත් නිසා සංඝයා වහන්සේලා දෙකොටසට බෙදීමෙන් නිකාය භේදය සිදුවිය. එම වළගම්බා රජුගේ කාලයේ අවසන් වරට වැඩසිටියේ මලියදේව මහරහතන් වහන්සේ පමණි. ප්‍රතිපත්ති නොරැකීමෙන් එදා සිට ප්‍රතිපත්ති රැකීම අවම වීම නිසා දහම වනගත විය. එසේම බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මංගල ධර්ම දේශනාවේ දී දේශනා කළ සිල්පද ඉවත් වී වෙනත් සිල්පද භාවිත වී ඇත. එය අද දක්වා ම සිදු වේ. අපි දැනට භාවිතා කරන සිල්පදවලින් කය, වචනය සංවර කර ගැනීමට වත් ශීලයේ පිහිටීමට වත් නොහැකිය. ධර්මය ඉගෙන ගත්තත් ධර්මය අවබෝධ කර ගැනීමට නොහැක. දැන්වත් බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දේශනා කරන ලද ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන් වන ප්‍රතිපදාවේ ඇති සම්මා වාචා, හතරවන ප්‍රතිපදාවේ ඇති සම්මා කම්මන්ත සිල්පද භාවිතා කර කය, වචනය සංවර කරගෙන නිවන් මඟ අවබෝධ කර ගැනීමට බලමු.

වනගත වූ දහම් දැනුම සඳහා උපයෝගි වන දැන්වීමකි.

**පින්-පව්, කුසල්-අකුසල් ගැන දැනගැනීමට පහත සඳහන් පොත් කියවන්න.**
**ත්‍රිපිටකය හැදෑරීමට ඒ. පී. ද. සොයිසා මහතා සරල බසට නැගූ ත්‍රිපිටකය කියවන්න.**

- පින් සහ පව් කුසල් සහ අකුසල් - 120/-
- චිත්ත නියාම ධර්ම - 125/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දැනුම - 125/-
- සිත මනස සහ ආගම 80/-
- පින සහ කුසලය දෙකක්ද? එකක්ද? - 200/-
- සිහිවිලි සහ සිතින් සිතීම - 150/-
- කය වචන දෙකින් පින් - පව් සිතින් කුසල් - අකුසල් 250/-
- බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය - 350/-
- සිත ගැන දැනගන්න - 125/-
- පංච උපාදානස්කන්ධය 250/-
- සිතෙහි සතුට ඇතිකර ගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න - 125/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය සහ වචනින් පින් පව් - 100/-
- බැමිණිතියා මහා සාගතය ඉතිහාසය පිළිබඳ ගෞතම ශාස්ත්‍රවේ දී රාජකීය පණ්ඩිත කවුඩාගම රතනසාර හිමි - 550/-

**සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම**

661, 665, 675 පී.ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10. දුරකථනඃ (011) 2685369, 2686925 ෆැක්ස්ඃ 2674187

# මේ ආත්මයේ දී ම නිවන් දැකීමට නම් ...



**බෞද්ධයාගේ පරමාර්ථය නිවන් දැකීමයි. සසරින් එතෙරවීම හෙවත් සියලු ජාති ජරා මරණාදි සියලු දුක් නැතිකොට නිවන් සාක්ෂාත් කිරීම මතු සම්බුදු සසුනක දී නොව මේ සසුනේ දී ම, මේ ආත්ම භවයේ දී ම කළ යුතු නොවේ දැයි බොහෝ දෙනා විමසන බව පෙනේ.**

රාග, දෝස, මෝහා දියෙන් වෙළී ගැලී සිටින පෘථග්ජන පුද්ගලයා එම රාග, දෝස, මෝහයන් සහමුලින් නැසීම කළ යුතු වේ. එබැවින් නිවන් අවබෝධ කිරීම පිණිස සපුරාලිය යුතු කරුණු ගණනාවකි.

පළමුවෙන් නුවණැති විචක්ෂණ පුද්ගලයකු විය යුතු ය. එමෙන්ම සත් පුරුෂයකු විය යුතු ය. එබඳු තැනැත්තාට කරුණු පහක් දියුණු කර ගැනීමෙන් මේ ආත්මභවයේ දී ම උතුම් නිවන ලබා ගත හැකි බව බුද්ධ දේශනාවේ සඳහන් වෙයි.

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අග්‍ර දායකයා වූ අනේපිඬු මහා සිටාණන් සහ අග්‍ර දායිකාව වූ විශාඛා මහ උපාසිකාව අරබයා කළ ධර්ම දේශනාවක දී එම කරුණු පහ මෙසේ වදාළහ.

- ශ්‍රද්ධාව දියුණු කළ යුතු ය
- ශීලය දියුණු කළ යුතු ය
- ප්‍රඥාව දියුණු කළ යුතු ය
- ත්‍යාගය දියුණු කළ යුතු ය
- බහුශ්‍රැතභාවය දියුණු කළ යුතු ය

මේ කරුණු පහ වැඩි දියුණු කළ විචක්ෂණශීලී සත්පුරුෂයා මේ ආත්ම භාවයේ ම තම ජීවිතයේ උතුම් සාරය වන නිවන ලබා ගනියි.

මේ අනුව මේ ආත්මභාවයේ දී ම නිවන සාක්ෂාත් කිරීමට ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍යයි. ඒ කරුණු පහ විමසා බලමු.

## සැදැහැ සිත

නව අරහාදී බුදුගුණ, ස්වාක්ඛාතාදී දහම් ගුණ සය, සුප්‍රතිපන්නතාදී සඟගුණ නවය යන සුවිසි මහගුණ ඇදහීම හා කර්මය හා කර්ම ඵලය ඇදහීම ලෙස ශ්‍රද්ධාව හඳුන්වා දී ඇත.

තෙරුවන් සරණයාම බෞද්ධ ජීවිතයේ ප්‍රධාන ලක්ෂණයයි. ඔහු අවශ්‍යයෙන් ම බුදුගුණ, දහම් ගුණ සඟ ගුණ හොඳින් දැන ඉගෙන තහවුරු කර ගත යුතු ය. " රහසක් පව් නොකරන හෙයින් ද, කෙලෙස් අර නැසූ හෙයින් ද, දේව මනුෂ්‍ය බ්‍රහ්මාදීන්ගේ පූජාවන් ලැබීමට සුදුසු වන හෙයින් ද අරහං ගුණය මාගේ බුදුරජාණන් වහන්සේ තුළ පිහිටා ඇත. යනාදී ලෙසින් සුවිසි මහගුණ හැදෑරීමෙන් " ශ්‍රද්ධා" ගුණය වැඩි දියුණු කර ගත යුතු ය. ශ්‍රද්ධාවන්තයා හඳුනා ගත හැකි ලක්ෂණ 3 කි.

## සැදැහැවතුන් ම ඇසුරු කරන්න

සද්ධර්මය ශ්‍රවණය කිරීම හා මසුරු මල දුරු කොට දන් දීම ය.

භික්ෂූන් වහන්සේ වෙත පැමිණ වන්දනා මාන කිරීමෙන් ද, දහම් කරුණු විමසා දැන ගැනීමෙන් ද ශ්‍රද්ධාව වැඩි දියුණු කර ගත හැකිය. එමෙන් ම දානානිසංස සලකා තමන් සතු ධන ධාන්‍යාදිය පරිත්‍යාග කිරීමෙන් ද ශ්‍රද්ධා දී ගුණ ධර්ම වැඩේ. තෙරුවන් ගුණ පිළිබඳ හා කර්මය, කර්මඵල පිළිබඳ හොඳ අවබෝධයක් එමගින් ලැබෙන බැවිනි.

ආශ්‍රය පුද්ගලයාගේ සිතිවිලි, ක්‍රියා හා අදහස් හැඩගැස්වීමට බලපාන බැවින් ශ්‍රද්ධාව හීන පුද්ගලයන් ආශ්‍රය නොකොට ශ්‍රද්ධාවන්තයන් ම ඇසුරු කිරීම කළ යුතු වෙයි.

කර්මය පිළිබඳ විස්තරාත්මක දැනුමක් ලබා ගැනීම ශ්‍රද්ධාව වැඩි දියුණු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. කුසල කර්ම හා අකුසල කර්ම, කුසල විපාක හා අකුසල විපාක ආදිය ධර්මානුකූලව දැනගත යුතු වෙයි.

විචිකිච්ඡා හෙවත් සැකය ශ්‍රද්ධාව දුර්වල කරන බැවින් දහම් පත පොත කියවා හෝ ධර්ම දේශනාවලට සවන් දීමෙන් හෝ ධර්ම සාකච්ඡා මගින් හෝ නොපැහැදිලි කරුණු විසඳා ගැනීමට උත්සාහ කළ යුතු ය. බුත්සරණ, අමාවතුර, සද්ධර්මරත්නාවලිය, ජාතක පොත් වහන්සේ රචනා කළේ බෞද්ධයා තුළ ශ්‍රද්ධාව වර්ධනය කිරීමේ අරමුණෙනි. එම නිසා බණ පොත් කියැවීමත්, නිශ්ඵල ප්‍රබන්ධ කියැවීමෙන් වැළකීමෙන් මෙලොව දී ම නිවන් දැකීම අරමුණු කර ගත් ඔබ විසින් කළ යුතු ය.

> **“ භික්ෂූන් වහන්සේ වෙත පැමිණ වන්දනා මාන කිරීමෙන් ද, දහම් කරුණු විමසා දැන ගැනීමෙන් ද ශ්‍රද්ධාව වැඩි දියුණු කර ගත හැකිය. එමෙන් ම දානානිසංස සලකා තමන් සතු ධන ධාන්‍යාදිය පරිත්‍යාග කිරීමෙන් ද ශ්‍රද්ධා දී ගුණ ධර්ම වැඩේ. තෙරුවන් ගුණ පිළිබඳ හා කර්මය, කර්මඵල පිළිබඳ හොඳ අවබෝධයක් එමගින් ලැබෙන බැවිනි. ”**

## ශීලය වැඩීම

ශීලය යනු ප්‍රාණඝාතාදී අකුසලයන්ගෙන් වෙන් වීමේ දී හා වත් පිළිවෙත් පිරීමේ දී සිතේ ඇති වන චේතනා දී ධර්මය යි. ශීලය පිළිබඳ ප්‍රභේද රාශියක් ධර්ම ග්‍රන්ථවල විස්තර කර ඇත. ඒ අතුරෙන් චාරිත්‍ර ශීලය හා වාරිත්‍ර ශීලය යන දෙවැදෑරුම් ශීලය ගැන අවධානය යොමු කරන්නේ නම්, ඉහත විග්‍රහය තවදුරටත් අවබෝධ කර ගත හැක.

චාරිත්‍ර ශීලය නම්, වත් පිළිවෙත් පිරීමයි. මේ දේ මෙසේ කළ යුතු යැයි පිළිගත් සාරධර්ම කඩ නොකොට පිළිපැදීමයි.. පැවිද්දනට පිඩුසිගා යාමේ, බණ දෙසීමේ, ආරාමය තුළ සිටීමේ , විවිධ අවස්ථාවල දී පිළිපැදිය යුතු වත් 14ක් දක්වා ඇත. ගිහියනට ද සමාජය පිළිගත් සත් චාරිත්‍ර අනුගමනය කිරීම චාරිත්‍රශීලය වෙයි. නිවන් අරමුණු කර ගත් පුද්ගලයා තුළ මෙම චාරිත්‍ර හෙවත් ආචාරශීලය අනිවාර්ය වෙයි.

වාරිත්‍ර ශීලය යනු ප්‍රාණඝාතයෙන් වැළකීම ආදි වශයෙන් පංචශීලය යනාදියයි.

මුලින් සඳහන් කළ ශ්‍රද්ධාව ශීලය ආරක්ෂා වීමට හා පිරිසුදු වීමට හා වැඩි දියුණු වීමට මහෝපකාරී වෙයි. එදිනෙදා ජීවිතයේ දී පංචශීලය සමාදන්ව ආරක්ෂා කිරීම ද පොහොය දින අෂ්ටාංග ශීලය හෝ දසශීලය සමාදන්ව පිරිසුදුව ආරක්ෂා කිරීම තුළින් ද ශීලය වැඩි දියුණු කරගත හැකි ය.

## නුවණ දියුණු කරමු

" ප්‍රඥා" ව නම් ඇත්ත ඇති සැටියෙන් දැනීමයි. එනම් තත්වාවබෝධයයි. " සම්මාදිට්ඨි" යන්නෙන් කියැවෙන්නේ ද ප්‍රඥාවයි. සියලු සංස්කාර ධර්ම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් අවබෝධ කර ගත හැක්කේ ප්‍රඥාවෙනි. නිවන සඳහා ප්‍රඥාව අත්‍යවශ්‍ය වෙයි. විදර්ශනා ප්‍රඥාවෙන් මාර්ග ඵලාවබෝධය සිදු වේ.

ප්‍රඥාව වැඩි දියුණු කර ගැනීම සඳහා ධර්ම ශ්‍රවණය කළ යුතු ය. ධර්ම සාකච්ඡාවල නිතර නිරත විය යුතු ය. එසේම සමථභාවනාව හා විපස්සනා භාවනාව ද ප්‍රගුණ කළ යුතුය.

තමන් සතු වස්තුව පූජාවක් වශයෙන්, අනුග්‍රහයක් වශයෙන්, සංග්‍රහයක් වශයෙන් දීම පරිත්‍යාගයයි. ශ්‍රද්ධාවෙන්ම දන් දිය යුතු ය. යහපත් සේ පිළියෙළ කොට දිය යුතු ය. පොහොය දිනය ආදී සුදුසු කාලයෙහි දිය යුතු ය. දෙන වස්තුවෙහි ආශාව ඉතිරි කර නොගෙන දිය යුතු ය. තම සිතට හෝ අනුන්ගේ සිතකට පීඩාවක් ඇති නොවන සේ දිය යුතු ය. දන් දීමේ විපාකවන ආයු, වර්ණ, සැප, බල ප්‍රඥා යන අනුසස් දැන, ශක්ති පමණින් නිතර නිතර පිරිසුදු සිතින් දන් දෙමින් නිවන් පිළිවෙත පිරිය යුතු ය.

## ඇසූ පිරූ තැන් ඇතිබව

නිතර ධර්ම ශ්‍රවණය කිරීමෙන් බහුශ්‍රැත භාවය ඇති වෙයි. බහුශ්‍රැත භාවය වැඩි දියුණු කිරීම සඳහා නිතර නිතර ධර්ම ග්‍රන්ථ කියවීම, ධර්ම සාකච්ඡාවල නිරත වීම, ධර්ම කොට්ඨාස පාඩම් කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

මෙසේ සත්පුරුෂ වූ, විචක්ෂණශීලී පුද්ගලයා ශ්‍රද්ධා, ශීල, ප්‍රඥා, ත්‍යාග, සුඛ යන කරුණු පස වැඩි දියුණු කිරීමෙන් ම අනාථපිණ්ඩික විශාඛාදීන් මෙන් මේ ආත්මභවයේ දීම අමා මහ නිවන් සැපත පැමිණෙනු ඇත.



කොළඹ නව කෝරළයේ සහ
නව තොටමුණේ
ප්‍රධාන සංඝනායක
රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති
**පත්බේරියේ ශ්‍රී විමලඥාණ නා හිමි**

# පහමුණේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ

## මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ප්‍රධාන ලේඛකාධිකාරී පදවි ලබති

ඓතිහාසික සෝමාවතී රාජමහා විහාරාධිපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්භාව්‍ය භාෂා අධ්‍යයන අංශයේ වැඩබැලු අංශාධිපති, මල්වතු මහාවිහාර පාර්ශ්වයේ නියෝජ්‍ය සහ වැඩබලන ලේඛකාධිකාරී ආචාර්ය පහමුණේ ධර්මකීර්ති ශ්‍රී සරණංකර සුමංගල නාහිමිපාණන් වහන්සේ වල්ගොව්වාගොඩ ශ්‍රී මේධංකර විමලබුද්ධි නාහිමිපාණන් වහන්සේ අපවත් වීමෙන් පුරප්පාඩු වූ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ප්‍රධාන ලේඛකාධිකාරී පදවිය සඳහා අගෝස්තු මස හය වැනි දින අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහාවිහාර වංශික ස්‍යාමෝපාලි මහානිකායේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රමුඛ විංශත් වර්ගික කාරක මහා සංඝසභාව මඟින් පත් කොට වදාළ සේක.



මල්වතු මහාවිහාරයීය විංශත්වර්ගික කාරක මහා සංඝසභාවේ ලේඛකාධිකාරී පදවිය, අතිපූජ්‍ය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සියලු ලිපි ලේඛන සම්පාදනය කිරීම, රාජ්‍ය අධිකරණ කටයුතුවල දී මල්වතු විහාරය නියෝජනය කිරීම, වාර්ෂිකව තුන්සිය නමකට වැඩි ප්‍රමාණයක් සාමණේර හිමිවරුන් උපසම්පදාවට පමුණුවන මල්වතු මහාවිහාරයේ උපසම්පදා පූජෝත්සවය සංවිධානය කිරීම, නායක පදවි හා විහාරාධිපති පදවි පිරිනැමීම, සංඝසභා රැස්වීම් පැවැත්වීම ඇතුළු භාරධූර වගකීම් සමුදායක් පැවරී ඇති තනතුරකි.

2009 වර්ෂයේ දිඹුල්කුඹුරේ විමලධම්ම නාහිමියන් අනුනායක පදවියට පත් වීමෙන් පුරප්පාඩු වූ නියෝජ්‍ය ලේඛකාධිකාරී පදවියට පත් පහමුණේ නාහිමියන් වල්ගොව්වාගොඩ විමලබුද්ධි නාහිමියන් ගිලන්භාවයට පත් වීමෙන් පසු වැඩබලන ලේඛකාධිකාරී හිමියන් වශයෙන් දීර්ඝ කාලයක් කටයුතු කළහ. වන මැද පිහිටි සෝමාවතී රාජමහා විහාරය ඇතුළු තදනුබද්ධ විහාරස්ථානයන්හි නවෝදය පිණිස නාහිමිපාණන් වහන්සේ සිදු කළ මෙහෙවර සුවිශේෂී වෙයි.

දිමුතු පුන්සර කොළඹගේ


**ශ්‍රී පාදස්ථානයට ආසන්නව බුද්ධ ආධ්‍යාත්මික මධ්‍යස්ථානයකට සුදුසු බිම් කඩක් අවශ්‍යව ඇත.**
**පූජා කිරීමක් නම් වඩාත්ම සුදුසුයි.**
070-1355876, 070-3482734

**නොමිලේ !**
දිනපතා මේ රටේ ලක්‍ෂ කෝටි ගණනින් අහිංසක සතුන් මරනු ලබන්නේ භික්‍ෂු භික්‍ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසගේ මාංශ තෘෂ්ණාව සපිරීම සඳහාය. මාංශ අනුභවය සතර අපාදෙර විවර කරයි.
**නිර්මල අවිහිංසා ධර්මය නොමිලේ !**
**071-7679254**

**කාන්තා වැඩිහිටි තැනක සුළු වැඩ සඳහා කැමතියි.**
වැටුප් අවශ්‍ය නැත.
දිගටම රැඳී සිටීමට හැක.
ආරාමයක් උවත් හොඳයි.
**0715918194**

**වකුගඩුවක් අවශ්‍යයි**
දරුණු වකුගඩු රෝගියෙක් සඳහා O+/O වර්ගයේ වකුගඩුවක් ඉතා ඉක්මණින් අවශ්‍යව ඇත.
පරිත්‍යාගශීලියෙක් වේ නම් කාරුණිකව අමතන්න.
0787285381, 0765629209.

**වැඩිහිටි නිවාසයකට**
දෙමාපියන්ට (විශ්‍රාමික හා නොවන) පහසුකම් ඇත.
අලුත්ගම.
**0342296400**
**0778995369**

**අවුරුදු 73 ක රෝගියකු බලා ගැනීමට සුරාවෙන් හා දුම්පානයෙන් තොර අවුරුදු 50 - 60 අතර කාරුණික පිරිමි කෙනෙකු සොයයි.**
**සියලු විස්තර සඳහා අමතන්න.** 071-8264663

**අටමහ කුසලයකට ඇරයුම්**
මෙහෙණින් වහන්සේ නමක් උදෙසා ඉඩමක් පූජා කිරීමට කැමති පිංවතෙක් වේ නම් කතා කරන්න.
**077-4037812**

**අනුරාධපුර පූජා නගරයේ**
විහාරස්ථානයකට අවුරුදු 60 ට අඩු
**උපාසක මහතකු අවශ්‍යයි.**
විස්තර සඳහා විමසන්න.
**දුරකථන අංකය**
**025-2226887**

**අවුරුදු 48 ක මවකට 'O' පොසිටිව් වර්ගයේ වකුගඩුවක් අවශ්‍යයි.**
පින්වත් පරිත්‍යාගශීලීන් අමතන්න.
**077-5215341**
**075-8635341**

**නිට්ටඹුව - සෙවන වැඩිහිටි නිවාසයට වයස්ගත දෙමව්පියන් බඳවාගැනේ**
කුරවලාන - කහටෝවිට
ර. ලි. ප. W.V. 9115
**076-8394650, 071-1096862**

**තායිලන්තයෙන් ගෙන්වන ලද**
අඩි 3 උස අඩි 2 පළල පිත්තල ඉඳි පිළිමය හා අඩි 1 1/2 ක් උස අඩියක් පළල පිත්තල ඉඳිපිළිම හා අඩි 4 1/2 දිග අඩි 2 1/2 පළල ශ්‍රී පතුල විකිණීමට.
**071-8071009**

වසර 20 පැවිදි ජීවිතයක් හිමි වකුගඩුවක්ද දන් දී ඇති මෙහෙණින් වහන්සේට
**ආධ්‍යාත්මය වඩා ගැනීමට වැඩ සිටීමට අවශ්‍ය ඉඩමක් හෝ ස්ථානයක් පූජා කිරීමට හැකි පිංවතෙක්**
ඒ උතුම් පිංකමට දයක වන සේක්වා. සැමට උතුම් චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා !
072-3335290
077-1896009

**නුගේගොඩ ගංගොඩවිල වැවකට මායිම්ව දර්ශනීය වටපිටාවක පර්චස් 13 ක ඉඩමක් විකිණීමට තිබේ.**
**පන්සලකට, ආරණ්‍යයකට ඉතා සුදුසුයි.**
**හිමිනමක් සතු**
**විමසීම් :** 0716908749 / 0716908746

භාවනානුයෝගීව වැඩවසන මෙහෙණින් වහන්සේ නමකට දානය සකසා දීමට හැකි නිරෝගී
**උපස්ථායිකාවක් අවශ්‍යයි.**
දීමනාවක් දිය හැක.
**0743089029**

**නාරනාපිටිය ශ්‍රී පුණ්‍යවර්ධනාරාමයේ අඩුපාඩුවක් ලෙස පවතින කුඩාවට ධාන ශාලාවක් ඉදිකර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය සපයා පිං සිදු කරගන්න.**
**විහාරාධිපති හිමි**
0777327420 / 0718367744 / 0312246144

**වාද්දුව වැඩිහිටි පියස**
ආගමානුකූලව ජීවත්වීමට හැකි මනරම් පරිසරයක පිහිටි ලස්සන නිවහනකි. විශ්‍රාමික දෙමාපියන් බඳවාගැනේ. ආදරණීය රැකවරණය සහිත කාරුණික සේවය.
**0776307548**
**0383130300**
**0717290420**

**රැකියාවක් අපේක්ෂා කරමි**
වයස අවු. 45 වන මා කිසිම සතෙකුගේ මස් කැමෙන් හා මස් වෙළඳාමෙන් වැළකී පන්සිල් සුරකින පිරිමි අයෙක්මි. ආහාර හා නවාතැන් නොමිලේ ලබා දී කාලයට ගැළපෙන සාධාරණ වැටුපකට මා හට සුදුසු රැකියාවක් බලාපොරොත්තු වෙමි.
**078-4294631**

**වැදගත් පවුලකින්**
**සැදැහැවත් මව් දෙමව්පියන්ට දාව කුල දරුවකු මහණ කිරීමට අවශ්‍යයි.**
විහාරාධිපති මහාචාර්ය බස්නාහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක කැටියපේ ඤාණවිමල නාහිමි ශ්‍රී ඤාණවිමලාරාමය, දේවාල පාර, කටුබැද්ද, මොරටුව.
**විමසීම් :** 0716908749 / 0716908746

**බිතු කැටයම් (මියුරල්) දිය ඇළි අලුතෙන් චෛත්‍ය ඉදිකිරීම**
**පරණ චෛත්‍ය නැවත පිළිසකර කිරීම අටවිසි බුදු මැදුර මල් ආසන බුද්ධ ප්‍රතිමා, දේව ප්‍රතිමා, විහාර චිත්‍ර, වහල්කඩ ගන්ධාර කුලුන සියලු කලා වැඩ සාධාරණ මිලට ඉදිකිරීම දිවයින පුරා**
**කේ. ජගත්**
076-7825341

**උපසම්පදාන ස්වාමින්වහන්සේ නමක් පන්සලක් සොයයි.**
**උඩරට අමරපුර නිකායට අයත් උපසම්පදා ස්වාමින් වහන්සේ නමක් අමරපුර නිකායට අයත් වසාදැමූ හෝ අතහැර දැමූ පන්සලක් හෝ අලුතින් ඉදිකරන ලද පන්සලක් සොයයි.**
**ලියාපදිංචි නොකළ පන්සලක් නම් වඩාත් හොඳයි. ගම්පහ කුරුණෑගල අනුරාධපුර විශේෂයි.**
**070-3145466, 076-0599780**

**කවිබණ ධර්මදේශණා විරිදු**
Video අඩුම මිලට Recording කරවා YouTube, FaceBook හරහා හැමෝටම නැරඹීමට හැක.
**ස්වර්ණා මධුරාගි**
0773253010

**දහම් පාසල් ගුරුවරු අවශ්‍යයි**
**පාමංකඩ ගංගාරාම දහම් පාසල සඳහා**
**සියළුම ශ්‍රේණි සඳහා පුහුණු / නුපුහුණු ගුරුවරු / ගුරුවරියන් වහාම අවශ්‍යයි.**
පාමංකඩ, දෙහිවල, නුගේගොඩ අවට ප්‍රදේශයන්හි අය වඩාත් සුදුසුය.
*(එය අවශ්‍යම නොවේ)*
සැම ඉරිදා දිනකම උදෑසන 8 –11 අතර කාලය තුළ දහම් පාසලට පැමිණ අරබේකෙම මයුරවංශ හිමි හමුවන්න.
**(අමතන්න 071-3595705 හිමි)**
**ශ්‍රී ආදිච්චවංශ දහම් පාසල, ගංගාරාමය, නො. 06, ශ්‍රී සරණංකර පාර, පාමංකඩ.**

# උතුම් දළදා සමිඳු පුද දුන් අතීත රජ දවස පෙරහර අසිරිය

**සංඝමිත්තා මහරහත් තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අනුරාධපුරයට වැඩම කරවීමේ දී පෙරහර සම්බන්ධ වූ බව සඳහන් කර ඇත. එතැන් පටන් ලක්දිව පෙරහර ද ආරම්භ වන්නට ඇතයි සැලකේ. ධර්මාශෝක අධිරාජයා ද පැලලුප්නුවර සිට බුද්ධගයාවේ ශ්‍රී මහා බෝධිය දක්වා මාර්ගය සරසා පෙරහර පැවැත් වූ ආකාරයත් සඳහන්වේ.**



දුටුගැමුණු රජතුමා ද ද්‍රෝණයක් ධාතූන් වහන්සේ ස්වර්ණමාලී මහසෑය තුළ නිදන් කරන මොහොතේ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ බුද්ධ ශරීරයම සියැසින් දැක අසීමිත බුද්ධාලම්භන ප්‍රීතියට පත් වූ ආකාරය මහාවංශයේ සඳහන් වේ.

ඒ අනුවම පසුකාලීන කලාකරුවන් අනුරාධපුරයෙහි සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළා නොයෙක් පෙරහර ආදී උත්සව පැවැත් වූ ආකාරය ද සිතිය හැක. මේ අයුරින් පෙරහර බෞද්ධ සංස්කෘතියේ අංගයක් බවට පත් විය.

අද මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ වැඩවසන වාම ශ්‍රී දළදා වහන්සේ උදෙසා පවත්වන පෙරහර සුවිශේෂී ය. එදා ගුහසීහ රජු මරණයට පත්වීමෙන් අනතුරුව හේමමලා දන්තකුමරු දෙපළ දළදා වහන්සේ නොයෙක් උවදුරු මධ්‍යයේ ලංකාවට වැඩම කරවූහ. රා.ව. 301 දී කිත්සිරිමෙවන් රජුට දළදා වහන්සේ භාරදීමෙන් අනතුරුව රජතුමාට ඇතිවූ සැකය දුරලමින් දළදා වහන්සේ අහසට පැන නැඟ ප්‍රාතිහාර්යය පෑ ආකාරය දැකීමෙන් අසීමිත බුද්ධාලම්බන ප්‍රීතියට පත් රජතුමා දළදා වහන්සේ රජ ගෙදරට වැඩමවා සිංහාසනයේ වඩා හිඳුවා නොයෙක් පුද පෙරහර පවත්වමින් මුළු ලක්දිවම තුන්වතාවක් දළදා වහන්සේට පූජා කළ ආකාරය මහාවංසය ආදී ග්‍රන්ථයන් හි සඳහන් වේ.

එතැන් පටන් අභයගිරියෙහි ද දළදා වහන්සේ වඩා හිඳුවමින් රාජ්‍ය සංකේතය බවට පත් කළහ. සෑම රජ කෙනෙක් ම ස්වකීය මාලිගාවේ ම තබමින් පුද පූජා පවත්වමින් බුද්ධෝපස්ථානය කළ ආකාරය සඳහන් වේ. අනුරාධපුර යුගයෙන් පසු පොළොන්නරු යුගයේ ද විජයබා, පරාක්‍රමබාහු හා නිශ්ශංකමල්ල ආදී රජවරු ද ඒ ආකාරයෙන් ම දළදා වහන්සේ සඳහා පුද පෙරහර පැවැත් වූහ.

කාලිංග මාඝ චන්ද්‍රභාණු ආක්‍රමණ නිසා දඹදෙණියට රාජධානිය ගෙනගිය අතර, භික්ෂූන් වහන්සේ ද දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන් වහන්සේ කොත්මලේ පුසුල්පිටිය සමීපයෙහි සපුගහක සඟවා බුරුමයට ගියහ. 2 වන පරාක්‍රමබාහු රජතුමා ස්වකීය මාළිගාව සමීපටයහිම දළදා මාළිගාවක් සාධා නොයෙක් පුද පූජා පැවැත් වීය.

පරසතුරු ආක්‍රමණ හා රාජ්‍ය තුළ ඇති වූ ගැටුම් නිසා දළදා වහන්සේ රැගෙන ගම්පොලට ද, එයින් කෝට්ටේට ද ගෙනගිය අතර, සීතාවක රාජසිංහ රාජ්‍ය කාලය වන විට දළදා වහන්සේ රත්නපුරය කුරුවිට දෙල්ගමුව රාජමහා විහාරයේ කුරහන්ගල යට සඟවා තබමින් රහසිගතව පුද පූජා පැවැත් වීය.

පළමු රාජසිංහයන් නිසා ඇති වූ සම්බුද්ධ ශාසනයේ විනාශයත් නිසා එකදු උපසම්පදා භික්ෂුවක්වත් නැති විය. ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථ ද විනාශයට පත් විය. නැවත රා.ව. 1542 දී වික්‍රමබාහු රජතුමා කන්දඋඩරට සෙන්කඩගල



රාජධානිය පිහිටුවාගෙන රජ ගේ සමීපයෙහි දෙමහල් පෝය ගෙයක් බැඳවීය. ඒ සමීපයෙහි දාගැබෙහි පාත්‍රා ධාතූන් වහන්සේ නිදන් කොට පෝයමලු විහාරය නමින් නම් තැබීය. ඒ අවට වෙහෙර විහාර 86 ක් සාදවා උපසම්පදා භික්ෂූන් වහන්සේ 355 නමක් ඇති කොට ධර්මකීර්ති හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සම්බුද්ධ ශාසනයෙහි කටයුතු සැලැස් වීය. මේ පුවත මහාවංශයේ 92 පරිච්ඡේදයෙහි දැක්වේ.

පළමු විමලධර්මසූරිය රාජ්‍ය කාලයේ දී දෙල්ගමුවේ සිට මහනුවරට වැඩමවා මාලිගාවක් සාදවා එහි තැන්පත් කොට පෝයමළු විහාරයේ හා අස්ගිරි විහාරයේ භික්ෂූන් වැඩමවා පුදපූජා පැවැත්වූ අකාරය ද මැනවින් සඳහන් වේ.

ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනය වැඩි දියුණු කළ වැලිවිට සරණංකර හිමියන් ඇතුළු මහා විහාරයීය භික්ෂූන් වහන්සේ සියම් රටෙන් උපසම්පදාව වැඩම වූ උපාලි හිමියන් ඇතුළු භික්ෂූන් වහන්සේත් සතර දේවාල පෙරහර බලන අවස්ථාවේ දී දළදා වහන්සේ උදෙසා ද මෙවන් පෙරහරක් පැවැත්වීම සුදුසු යැයි යෝජනා කළහ.

ඒ අදහස් ද, කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාට ඉදිරිපත් කළෙන් රජතුමා අසීමිත සතුටට පත්ව පෙරහරක් සංවිධානය කරවා සතර දේවාල පෙරහරට පෙරටුව වීදි සංචාරය කිරීමට සැලැස් වීය.

දළදා වහන්සේ උදෙසා මෙවන් පෙරහරක් ක්‍රි.ව.112 දී ගජබා රජතුමා සොළීන් විසින් පැහැරගෙන ගිය පාත්‍රා ධාතූන් වහන්සේ හා දේවාභරණත් සිංහලයන් 12000 ක් හා මැරෑ අය වෙනුවට ගෙනා සොළීන් 12000 යන 24000 ක් ගෙනවුත් පුද පෙරහැර පැවැත් වූ ආකාරය පූජාවලිය, රාජාවලිය හා පැරකුම්බා සිරිතේ සඳහන් වේ.

එකී ගජබා රජතුමා විසින් ක්‍රි.ව. 112 දී සෝමාවතියේ පිහිටුවා ඇති සෙල්ලිපියේ සඳහන් අයුරින් එම විජයග්‍රහණයෙන් සතුටු වූ භික්ෂූන් වහන්සේ "යුද්ධ ජයග්‍රාහක" යන ගෞරව නාමය එකී රජතුමාට පිරිනැමූ ආකාරය එම සෙල්ලිපියේ සඳහන් විය. රජතුමා රාජකීය ඇළක් කප්පවා එම ප්‍රදේශය මණිඅගිය හෙවත් සෝමවතී විහාරයට පිදූ බව සඳහන් වේ.

මේ අයුරින් වර්ෂ 1700 ක් පමණ කාලයක් මුළුල්ලෙහි පවත්වාගෙන ආ මෙම පෙරහර බ්‍රිතාන්‍ය පාලකයන් නැවැත් වීය.

එකල දැඩි නියඟයක් ඇති විය. මෙයට හේතුව පෙරහර නොපැවැත් වීම නිසා යැයි භික්ෂූන් වහන්සේ හා බෞද්ධ ජනතාව ප්‍රකාශ කළ බවත්, එසේ නම් පෙරහර පවත්වා වැසිවස්සන ලෙස බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා අභියෝග කළේ ය. මල්වතු අස්ගිරි විහාරයීය භික්ෂූන් වහන්සේත් බෞද්ධ පිරිසත් එකතුවී චාරිත්‍රානුකූලව පෙරහර පටන්ගෙන දෙවන දිනයේ ම දැඩි නියඟය අවසන් කරමින් මහා වැසි ඇද හැලී මහා ගංවතුරක් ඇති වූ ආකාරය දළදා වතුර නම් ග්‍රන්ථයේ සඳහන් වේ.

ඉංග්‍රීසීන්ට යටත් වීමෙන් පසු වසර කීපයක් පෙරහර නොපැවැත්වූ අතර, ක්‍රි.ව.1828 මැයි 29 වැනි දින සර් ඇඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරතුමාගෙන් අවසර ලබාගත් රදලවරුන් විසින් මුලපටන් ම පවත්වාගෙන ආ පැරැණි සම්ප්‍රදායනුකූලව ම පෙරහර පැවැත්වූ බව ඒ පිළිබඳ සඳහන් විස්තරය තුළින් මනා අවබෝධයක් ලබා ගත හැක.

එම පෙරහරේ දී සංඝයා වහන්සේට වැඩ විසීමට දිග අඩි 239 හා පළලින් අඩි 60 ක මණ්ඩපයක් ද තැනවූහ. ආණුඩකාරතුමා ඇතුලු ඉංග්‍රීසි මහත්වරුන්ට හිඳීමට දිග අඩි 30 හා පළල අඩි 08 ක් සහිත මණ්ඩපයක් තැනවීය. උඩ පාත දෙරට රඳලවරුන්ට සිටීමට දිග අඩි 100 ක් හා පළළ අඩි 30 ක් සහිත මණ්ඩපයක් ද පත්තිරිප්පුව ලග සාදවා මණ්ඩප වටේ තොරන් 53 ක් බැඳ නොයෙක් සැරසිලිවලින් අලංකාර කළහ. මහමලුවේ සතර කෝරළේ දිසාව, සත්කෝරළේ දිසාව, මාතලේ දිසාව කොඩි හා ධජ පතාක නංවා සුදුවැලි ඉස සරසා වීදි ද සැරසූහ.

දර්ශනීය පෙරහරකින් ආණ්ඩුකාරතුමා මාලිගාවේ දළදා වහන්සේ වැඩවසන කුටියට පමුණුවා පෙරහරේ වැඩමවන කරඬුව එතුමා අතට දී ගෙනවුත් සරසා ඇති ඇතාපිට රන්සිවිගෙහි තැන්පත් කරන ලදී. ඊටපසු පල්ලෙ ගම්පහ නිලමේ සහ රදලවරුනුත් මලුවට අවුත් මහනිලමේ විසින් පෙරහර සූදානම් කිරීමට උපදෙස් දුන් සැටි දැක්වේ.



සෝමවතිය රජමහා විහාරාධිපති
මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ
මල්වතු මහා විහාර පාර්ශ්වයේ
ලේඛකාධිකාරී
**පහමුණේ සුමංගල නා හිමි**

# මහනුවර ඇසළ මංගල්‍යය ශ්‍රී ලාංකේය අභිමානය ලෝකයට ගෙන යන

# ප්‍රබලතම සංස්කෘතිකාංගයක්

## දියවඩන නිලමේ ප්‍රදීප් නිලංග දැල

හෙළයේ විචිත්‍රවත් ම කලා මංගල්‍යයයෙහි ලා සැලකෙන මහනුවර ඇසළ පෙරහර මංගල්‍යය පෞරාණික චාරිත්‍ර ගරුකරමින් විචිත්‍රවත්ව පවත්වා අවසන් කිරීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේ මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ තුමන්ට ය.වසර 2005 දී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ධූරයට පත්ව නිල කාලය අවසන් වූ පසු 2015 වසරේ දී යළිත් එම තනතුරට පත්වූ ප්‍රදීප් නිලංග දැල මහතා මෙවර මහනුවර ඇසළ පෙරහර සංවිධානය කරන්නේ 18 වැනි වරට ය.පාස්කු ප්‍රහාරය හා කොවිඩ් තත්ත්වය හේතුවෙන් පසුගිය වසර තුනේ දී ම ජන සහභාගිත්වයකින් තොරව පැවැත් වුණු මහනුවර ඇසළ මංගල්‍යය මෙවර නැරඹීමේ අවස්ථාව මහජනතාවට ලැබී තිබේ. පැරැණි රජ දවස පටන් රාජ්‍ය අනුග්‍රහය මත සංවිධානය කෙරුණු පෙරහර මංගල්‍යය අද පවත්වන්නේ රාජ්‍ය උත්සවයක් ලෙසිනි. මෙවර පෙරහරේ සංවිධාන කටයුතු සම්බන්ධව දියවඩන නිලමේ තුමන් සමඟ කළ සාකච්ඡාවකි මේ...



**පසුගිය වසර දෙකේ දී ම මේ රටේ ජනතාවට කොප්පරා පන්දම්වල උණුසුම බලමින් වීදිවලට රැස්ව පෙරහර නැරඹීමට අවස්ථාව ලැබුණේ නැහැ නේද?**

කෝවිඩ් ව්‍යාප්තිය එක්ක පෙරහර නැරඹීට සඳහා මහජනතාවට අවස්ථාව ලබා දීමට සෞඛ්‍ය අංශ එකඟ වුණේ නැහැ.මහනුවර ඇසළ පෙරහර නැරඹීමට ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් පිරිසක් මහනුවර නගරයට එකතු වෙනවා.කෝවිඩ් ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා සෞඛ්‍ය අංශ ලබා දුන් නිර්දේශ ඒ අනුව ම ක්‍රියාත්මක කරමින් මේ ජනතාව හැසිරවීම කළ නොහැකියි. මේ නිසා තමයි සෞඛ්‍ය අංශ මඟින් දැනුම් දුන්නේ ජන සහභාගිත්වයකින් තොරව පෙරහර පවත්වන්න කියලා. මේවන විට කොවිඩ් අවධානමෙන් අපි සෑහෙන දුරට මිදිලා ඉන්නේ. පාස්කු ප්‍රහාරය නිසා ආරක්ෂක හේතූන් මත අපි 2019 වසරේ දී පෙරහර මංගල්‍යය පැවැත්වූයේ ජන සහභාගිත්වයක් නැතිවයි. ඒ නිසා පෙරහර නරඹන්න අවුරුදු තුනකට පස්සේ ජනතාවට අවස්ථාව ලබා දෙන්න මෙවර හැකි වුණා. තාමත් අපේ රටින් කොවිඩ් තුරන් වෙලා නැහැ. මේවන විටත් රෝගීන් දෛනිකව වාර්තා වෙනවා. ඒ ගැනත් සැලකිලිමත් ව පෙරහර මංගල්‍යය නරඹන්න එන්න කියලා මම සැදැහැවතුන්ට කියනවා.

**ශ්‍රී දළදා මාලිගාවේ දී දළදා වහන්සේ වෙනුවෙන් වාර්ෂිකව පවත්වන සිව් මංගල්‍යයන් අතරින් දළදා පෙරහර සුවිශේෂි වනවා නේද?**

දළදා මාලිගාවේ අලුත් සහල් මංගල්‍යය, අලුත් අවුරුදු මංගල්‍යය, කාර්තික මංගල්‍යය හා ඇසළ පෙරහර මංගල්‍යය ලෙසින් වසරක දී මංගල්‍යයන් හතරක් පවත්වනවා.දළදා වහන්සේ වෙනුවෙන් පවත්වන මේ සියලු මංගල්‍යයන් අතරින් ජනතාවගේ වැඩිම අවධානය දිනා ගන්නේ ඇසළ පෙරහරයි. විදේශ රටවල ජනතාව පවා පෙරහර මංගල්‍යය ගැන අවධානයෙන් සිටිනවා. ශ්‍රී දළදා මාලිගාවේ පෙරහර සමඟ පිළිවෙළින් නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන දේවාළ පෙරහර දින 11 ක් පුරා වීදි සංචාරය කරන්නේ කලා කරුවන් දහසකට වැඩි පිරිසක් සමඟයි. ලෝකයේ කොහේවත් මෙපමණ කලාකරුවන් පිරිසක් එක දිගට දින 11 ක් පෙළහර දක්වන උත්සවයක් නැහැ. ශ්‍රී ලංකාවේ අභිමානය ලෝකයට ගෙනයන ප්‍රබලතම අවස්ථාවක් ලෙස මහනුවර ඇසළ මංගල්‍යය පෙන්වා දෙන්න පුළුවන්.

**මහනුවර ඇසළ පෙරහර නැරඹීමට දෙස් විදෙස් ජනතාව දක්වන්නේ විශාල උනන්දුවක්. වාර්ෂිකව ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් පෙරහර නරඹනවා. දැන් අඛණ්ඩව වසර තුනක් පෙරහර සියැසින් දැක බලා ගැනීමේ අවස්ථාව ජනතාවට අහිමි වුණා නේද?**

පාස්කු ප්‍රහාරයෙන් පසුව 2019 දී ජන සහභාගිත්වයක් නොමැතිව පෙරහර කරන්න සිදුවුණා. ආරක්ෂක අංශවල උපදෙස් අනුව තමයි පෙරහර ඒ විදිහට සංවිධානය කළේ වසර තුනකට පසු මෙවර පෙරහර සියැසින් දැක ගන්න ජනතාවට අවස්ථාව ලැබෙනවා.

**නැඳුන්ගමුවේ රාජා මිය යාමත් සමඟ දළදා මාලිගා පෙරහරේ සධාතුක කරඬුව වැඩම කිරීමේ දී විශාල කාර්යභාරයක් පැවරෙන්නේ ඉන්දි රාජාට නේද?**

මම 2005 දියවඩන නිලමේ ලෙස පත්වුණාට පස්සේ මහනුවර පෙරහරට නැඳුන්ගමුවේ රාජා සම්බන්ධ කර ගත්තා.නැඳුන්ගමුවේ ඇතාගේ පැමිණීමත් එක්ක අපිට සධාතුක කරඬුව වැඩම කරන්න ලංකාවේ ඉන්න සුදුසුම ඇතුන් තිදෙනාගේ ම සේවය ලබා ගැනීමට අවස්ථාව ලැබුණා. අනෙක් ඇතුන් දෙන්නා වන්නේ කතරගම වාසනා හා මාලිගාවේ ඉන්දිරජා යි.

නැදුන් ගමුවේ ඇතාගේ මරණයත්, කතරගම පෙරහර, මහනුවර ඇසළ පෙරහරට සමාගාමීව පැවැත්වීමත් නිසා කතරගම වාසනා ඇතා එම පෙරහරට සම්බන්ධ වීමත් නිසා ඒ ඇතුන් දෙදෙනාගේ ම සේවය මෙවර අපට ලබා ගන්න හැකියාවක් නැහැ.මේ නිසා ඉන්දිරාජා ට වැඩි කාර්යභාරයක් පැවරෙනවා. කොහොම වුණත් දළදා මාලිගාවේ සිංහ රාජා, බුරුම රාජා හා මියන් රාජාත් සධාතුක කරඬුව වැඩම කළ හැකි අයයි.

**මහනුවර පෙරහරේ දී උඩරට වෙස් නැටුමට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක්.අදවන විට මේ පාරම්පරික කලා ශිල්ප අභාවයට යමින් තිබීම අනාගතයේ පෙරහර පැවැත්වීමට ගැටලුවක් වේවි නේද?**

මහනුවර ඇසළ පෙරහරේ සියලු නර්තන උඩරටට ආවේනික ඒවායි. පහතරට හා සබරගමු සම්ප්‍රදායට අයත් කිසිදු නර්තනයක් මේ පෙරහරට එකතු කරන්නේ නැහැ. ඒක සම්ප්‍රදායක්.පාරම්පරික කලා ශිල්පීන්ගේ පවුල්වල වර්තමාන පරම්පරාව මේ කලා ශිල්පවලින් ක්‍රමයෙන් ඈත්වන බවත් පෙනෙන්නට තිබෙනවා.

ඔවුන් ආර්ථික වශයෙන් ප්‍රතිලාභ ඇති වෙනත් රැකියාවලට යොමු වෙනවා. තවත් පැත්තකින් මේවාහි අගය තේරුම් ගත් අලුත් පරම්පරාවේ තරුණයින් උඩරට වෙස් නැටුම හදාරනවා. ඔවුන් පාරම්පරික කලා පවුල්වල අය නොවෙයි. නර්තනය වසරක්, දෙකක් හදාරලා වෙස් බඳින්න බැහැ. අද පාසල්වල මේක කෙරෙනවා. මම එය අනුමත කරන්නේ නැහැ.

දළදා මාලිගාවේ බෞද්ධ විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව උඩරට නර්තන පීඨයක් අපි ආරම්භ කළේ මේ රික්තකය පිරවීමටයි.

**මහනුවර ඇසළ පෙරහරට දළදා මාලිගාව සහ සතර මහා දේවාල නියෝජනය කරමින් සම්බන්ධ වන කලාකරුවන් අතරින් විශිෂ්ටයින් තෝරා ඔවුන්ට ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීම ජේ.ආර් ජයවර්ධන ජනාධිපතිවරයාගේ පටන් අඛණ්ඩව සිදු කෙරුණා. කොවිඩ් තත්ත්වය හේතුවෙන් පසුගිය වසර දෙකේ දී ම ජනාධිපති සම්මාන ප්‍රදානයක් සිදු කෙරුණේ නැහැ.මෙවර එය සිදු කිරීමේ සැලසුමක් තිබෙනවා ද**

ඔව්.මෙවර කලා ශිල්පීන් අගයමින් සම්මාන ප්‍රදානය කරනවා.පෙරහරට සම්බන්ධ වන කලා ශිල්පීන්ට ජනාධිපතිතුමන් අතින් ලබන මේ සම්මානය ඉතා වටිනවා. පෙරහරට සම්බන්ධ වන ශිල්පීන්ගේ කුසලතා නිරීක්ෂණය කිරීමට කණ්ඩායමක් යොදවනවා. ඔවුන් ස්ථාන කිහිපයක සිට ශිල්පීන්ගේ කුසලතා සඳහා ලකුණු ලබාදීමක් කරනවා. මේ වැඩපිළිවෙළ දියත් කරන්නේ පෙරහර භාරය මඟින්.

අසේල කුරුළුවංශ



# ජාතියේ උදරත්වය විදහා දක්වන හෙළයේ මහා කලා මංගල්ලය

**දළදා පෙරහර හෙවත් ඇසළ පෙරහර මංගල්ලය පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ විෂයයෙහි සිදු කෙරෙන වාර්ෂික සතර මංගල්ලයන් අතුරෙන් සුවිශේෂී පූජා මංගල්ලයකි. දළදා පූජෝපහාරය, සිවුමහා දේවාලයන්හි දෙවියන්ට භක්ති ප්‍රණාමය හා කලට වැසි ලබා සශ්‍රීකත්වය හා සෞභාග්‍යය ඇති කර ගැනීම අරමුණු කොට ගෙන මෙම උතුම් මංගල්ලය වාර්ෂිකව පැවැත්වේ.**

ව්‍යවහාර වර්ෂ 310 වැන්නේ කිත්සිරිමෙවන් රජු දවස පටන් වසර එක්වා දහස් සත්සිය පස්වසරක් සපුරන ජාතියේ ප්‍රෞඪත්වය හා බෞද්ධ සංස්කෘතියේ අනන්‍යතාවය විදහා දක්වන හෙළ මහා කලා මංගල්ලය සේ දෙස් විදෙස් ජනීජනයාගේ සිත්සතන් සැදැහැයෙන් පුරවන මෙම මංගල්ලය චිරාගත සාම්ප්‍රදායික පුදසිරිත්වලට අනුගතව සුභ නැකැත් මුහුර්තීන්ට අනුව පැවැත්වේ.

විසිතුරු ඇසළ පෙරහර මංගල්ලයේ මූලික කටයුත්ත වනුයේ පෞරාණික සිරිත් ප්‍රකාර පණස වර්ගයේ කිරි වෑහෙන ගසක එල නොදරන පුරුෂ ලිංගික කොස් පැළයක් තෝරා ගෙන එය වටා පිරිසුදු කොට වටතිර අදවා වියන් බඳවා සඳුන් දියර ඉස, දුම්මල අල්වා, පහන් දල්වා පේකර අලුත්නුවර පොරෝකරුවා දෙහි ඇඹුල් ගා ස්නානය කොට ස්තෝත්‍ර ගායනා මැද්දේ ගස කපා හෙළීමයි.

කැපූ ගසින් වියත් තුනක පමණ ප්‍රමාණයක් පිරිසුදු කරයි. එය සුදු රෙද්දකින් ඔතා පෙරහරින් ඇතකු පිටින් මහනුවර විෂ්ණු දේවාලයට රැගෙන ඒම සිරිතයි.

එහිදී නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන සිවුමහා දේවාලයන්ට කොටස් කර සතර දේවාලවල බස්නායක නිලමේවරුන් හමුවේ බෙදා දෙන අතර, ඒ ඒ දේවාලයන්හි කපුවන් විසින් කප රැගෙන සුදු රෙද්දකින් ඔතාගෙන ඇතකු පිට නැඟී පෙරහරින් වැඩමවීම සිදුකෙරේ.

කප සිටුවීමට දේවාලයේ නියමිත ස්ථානය පිරිසුදු කොට වට තිර වියන් බඳියි. ගොක් කොළ මලින් සරසා ඉන්ද්‍ර දෙවියන් සංකේතවත් කොට දෙපස පොල්ගෙඩි දෙකක් මත තැබූ පහන් දල්වා ස්තෝත්‍ර ගායනා මැද්දේ කප සිටුවීම සුභමුහුර්තියෙන් සිදුකෙරේ.

මෙවර එම කප් සිටුවීමේ මංගල්ලය වර්ෂ 2022 වැන්නේ ජූලි මස 29 වැනි කිවි දින පෙරවරු 3 පසුවී විනාඩි 03 ට උතුරු දිශාභිමුඛව සිරිත් පරිදි පේකොට තබන ලද පණස වෘක්ෂයේ ශාඛාවක් ගෙන මහනුවර සිවු දේවාල ප්‍රධාන කොට ඇති සියලු දේවාලයන්හි පූර්වාභිමත්ව ඇසළ කප සිටුවීමෙන් ඇරඹුණි.

එසේ කප සිටුවීමෙන් අනතුරුව ඒ ඒ දේවාලයේ දුන්න, ඊතලය සහිත දේවාභරණ කෙටි පෙරහරකින් වඩමවා කප වටා ප්‍රදක්ෂිණා කිරීම සිදුවේ. දේවාල අභ්‍යන්තර පෙරහර ඇතුලේ පෙරහර වශයෙන් ද භාවිත වේ. එය ඉතා කෙටි පෙරහරකි. පන්දම් විලක්කු ගෙන ප්‍රධාන කපුවා විසින් දේවාභරණ කප වටා වැඩමවීම එහි සිරිතයි.

මෙහි අරමුණ වන්නේ පෙරහර මංගල්ලය කිසිම උපද්‍රවයකින් තොරව සාර්ථකව පැවැත්වීමට හා සහභාගි වන කලාකරුවන් ඇතුළු සියලු දෙනාගේ ආයුරාරෝග්‍ය සම්පත්තිය හා සුභශාන්තිය වඩා වර්ධනය කර ගැනීම ය.

ඉන් අනතුරුව වීදි සංචාරය කෙරෙන කුඹල් පෙරහර පහක් ද, රන්දෝලී පෙරහර පහක් ද, අවසන් රන්දෝලි මහ පෙරහර අවසානයේ මධ්‍යම රාත්‍රියෙහි ගෙඩිගේ විහාරයට පෙරහර කරඬුව වැඩමවන පෙරහරක් ද, පසු දින දහවල් පෙරහරක් ද පැවැත්වීමෙන් පසු ගෙවැදී ඓතිහාසික සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්ලය සමාප්ත වේ.

අනතුරුව රටේ පාලක ප්‍රධානයා වන ගරු ජනාධිපතිතුමා වෙත පෙරහර සංදේශය පිළිගැන්වීම ද, ශ්‍රී විෂ්ණු දේවාලයේ පැවැත්වෙන වළියක් නැටුම ද යන සුවිශේෂී කරුණුවලින් පෙරහරේ කටයුතු සපුරා අවසන් වේ.

ඇසළ පෙරහරේ පළමුව ගමන් කරනුයේ ශ්‍රී දළදා මාළිගාවේ පෙරහරයි. වර්තමානයේ මෙම පෙරහරේ වැඩමවනුයේ දළදා වහන්සේ නොව සධාතුක ධාතූන් වහන්සේ තැන්පත් කළ පෙරහර කරඬුවයි. දෙවනුව නාථ, විෂ්ණු, කතරගම හා ශ්‍රී පත්තිනි දේවාල පෙරහර අනු පිළිවෙළින් ගමන් කරනු ලැබේ.

දළදා පෙරහර හෙවත් ඇසළ පෙරහර මංගල්ලය දෙස් විදෙස් නරඹන්නන්ගේ නෙත් සිත් ඇද බැඳ ගන්නා අසිරිමත් මංගල සම්මත පෙරහර මංගල්ලයකි. මෙකී පෙරහර ආරම්භ වූයේ කිත්සිරිමෙවන් මහරජු (ක්‍රි.ව 301-328) දවස දළදා වහන්සේ ලක්දිවට වැඩම වීමත් සමඟය.

මහාවංශයේ සඳහන් වන අයුරු

"රජ තෙමේ නව ලක්ෂයක් දන විසඳා දළදා මහ පෙරහර කළේයි. "අවුරුදු පතා අභයගිරි විහාරයට වඩා ගෙන ගොස් දන්ත ධාතුවට මෙබඳු පූජා කරවයි. "නියෝග කළේ ය යන්නෙන් එය සනාථ වෙයි.

පාහියංගේ දේශාටන වාර්තාවෙහි රජතෙමේ තුන් වන මස මැද දී (ඇසළ මස) බුදුරජාණන් වහන්සේගේ දළදාව පෙන්වනු ලැබේ. මෙයට දින දහයකට පෙරාතුව කීමෙහි බිනීමෙහි දක්ෂ මිනිසකු රජ ඇඳුම්, පැළඳුම්, හඳවා පළඳවා, මොනවට සැරසූ ඇතක්හු පිට නඟවා, නුවර හැවිද අණ බෙර ගසා මෙසේ කියන්ට සලස්වයි. "බෝසතාණන් වහන්සේ අසෙකි කපක් මහත් වැර වඩා, පෙරුම් පිරූ සේක. සිය සැප පහසු නොතකා සිය රජය ද, සිය බිසව ද, දරුවන් ද, දන් දුන් සේක. තමන් ඇස් උගුල්ලා එය ඉල්ලා ආවුනට දුන් සේක.

අද සිට දස දිනකින් ඒ බුදු රදුන්ගේ දළදාව එළියට වැඩමවා අභයගිරි වෙහෙරට පමුණුවනු ලැබේ. පින් කැමති සියල්ලෝ මඟ සම කෙරෙත්වා. කෝවේ, මහවේ සරසත්වා. පුද පිණිස මල් හා සුවඳ පිළියෙළ කෙරෙත්වා යනුවෙන් කෙරෙන විස්තරයෙන් එ දවස ඇසළ පෙරහර සංවිධානය වු ආකාරය කියවෙයි.

අනුරපුර රාජධානියෙන් අනතුරුව පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගඟසිරිපුර, කෝට්ටේ, සීතාවක යන රාජධානියන්හි ද නොකඩ කොට ඉපැරැණි චාරිත්‍රානුකූලව පෙරහර මංගල්ලයන් පැවැත්වූ අයුරු මූලාශ්‍රයන්ගෙන් හෙළිවේ.

ඇතැම් සතුරු උපද්‍රව සමයන්හි පෙරහර වීදිසංචාරය නොකළ ද මේ පෙරහර චාරිත්‍රයන් අඛණ්ඩව පවත්වාගෙන ඒමට අපේ රජවරු හා දියවඩන නිලමේවරු සමත්වූහ.

වර්ෂ 1592 දී පළමු වැනි විමලධර්මසූරිය රජු දවස ශ්‍රී දළදා වහන්සේ සෙංකඩගල පුර රාජධානියට වැඩම වීමෙන් අනතුරුව වර්තමානය දක්වා අඛණ්ඩව පවත්වාගෙන ආ බවක් දක්නා ලැබේ.

මහනුවර රාජාවලියේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව 1747 - 1781) දවස ක්‍රි.ව 1753 දී දළදා පෙරහර පෙරටු කොට නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි සිව් මහා දේවාලය අනුපිළිවෙළට ගමන් ගන්නා ආකාරයට ඇසළ පෙරහර මංගල්ලය පැවැත්වීම ආරම්භ විය. එතැන් සිට අද දක්වා ම මෙම පෙරහර මංගල්ලය චිරාගත සම්ප්‍රදායානුකූලව ශ්‍රී දළදා මාළිගාව පෙරටුකොට පැවැත්වීම සිරිතයි.

චිරාගත සම්ප්‍රදායානුකූල ව පවත්වා ගෙන ආ මෙම මංගල්ලය අපේ රජවරුන් හා ඔවුන්ගෙන් අනතුරුව දියවඩන නිලමේවරුන් විසින් ද නොකඩ කොට පවත්වාගෙන විත්, වර්තමානයට දායාද කොට ඇත.

දියවඩන නිලමේවරයකු සතු ප්‍රධානතම නිල කාර්යභාරයක් වන්නේ වාර්ෂික ඇසළ පෙරහර මංගල්ලය චිරාගත සම්ප්‍රදායානුගත පුදසිරිත්වලට අනුගතව ම පැවැත්වීමයි. වර්තමාන දියවඩන නිලමේතුමන්ගේ දසවසරක නිලකාලය තුළ චිරාගත සාම්ප්‍රදායික පුදසිරිත්වලට අනුගතව ම මුළු හෙළයම අසිරිමත් කරවන මෙම පෙරහර මංගල්ලය වඩාත් උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට තම දායකත්වය හා ඇපකැපවීම මැනවින් ලබා දීම ජාතියේ වාසනාවකි.

ශ්‍රී දළදා මාළිගාවේ
දේශීය බෞද්ධ කටයුතු කාර්යාංශයේ ලේකම්
**කේ. මීගහකුඹුර**

# දළදා සමිඳුට පූජෝපහාර පිදෙන ඓතිහාසික සෙංකඩගලපුර ඇසළ පෙරහර

**ක්‍රි.ව. 311 දී එනම් අනුරාධපුර රාජධානි සමයේ දී ලක්දිව රජ පැමිණි කීර්ති ශ්‍රී මේඝ වර්ණ මහරජතුමන්ගේ රාජ්‍යත්වයෙන් නවවැනි වර්ෂයේ දී දඹදිව කළිඟු රට ගුහසීව රජුගේ දියණිය වූ හේමමාලා කුමරිය සහ බෑණනුවන් වූ දන්ත කුමරු විසින් ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ වාම ශ්‍රී දංෂ්ට්‍රා ධාතූන් වහන්සේ ලංකා ද්වීපයට වැඩම කරවන ලදී.**

පන්සාළිස් වසක් මුළුල්ලෙහි තථාගතයන් වහන්සේ විසින් ලෝක සත්ත්වයා කෙරෙහි පතළා වූ මහා කරුණාවෙන් යුතු ව දේශනාකොට වදාළ සුවාසූ දහසක් වූ නිර්මල ධර්මස්කන්ධයෙහි පහස ලැබූ ඒ උතුම් දළදා වහන්සේ එකී කිත්සිරිමෙවන් මහරජු විසින් අපමණ ප්‍රීතිප්‍රමෝදයෙන් යුතු ව පිළිගනිමින් මහ පෙරහරින් රාජ මාළිගයට වැඩමවා විචිත්‍ර වූ ස්වර්ණමය කරඬුවක වඩා හිඳුවා මහත් වූ පුද පූජා පවත්වන ලදි. එපමණක් ද නොව එතුමන් විසින් එතැන් පටන් ලක්දිව රාජ්‍යත්වයට පත් වන සෑම පාලකයකු විසින් ම ශ්‍රී දළදා වහන්සේට සිදුකළ යුතු පුද සත්කාර නොකඩවා නිසි අයුරින් පවත්වා ගෙන යා යුතු බවට රාජ නියෝගයක් ද පනවන ලදි.

එතැන් සිට ලක්දිව රාජ්‍යත්වයට පත්වූ දෙවන ජෙට්ඨතිස්ස, බුද්ධදාස, දෙවන උපතිස්ස ආදී මහ රජවරු දළදා වහන්සේ ආරක්ෂා කිරීම හා පුද පූජා පැවැත්වීම තම පරම යුතුකම සේ සලකා නොයෙක් අයුරින් විවිධ පුද පූජාවන් මහත් භක්තියෙන් යුතු ව සිදුකළ බව දළදා වහන්සේගේ ඉතිහාසය විස්තර කරමින් පොළොන්නරු යුගයේ දී සම්පාදිත දාඨාවංසයෙහි දැක් වේ.

මේ අයුරින් ලාංකේය බෞද්ධ ජනයා විසින් අපමණ භක්ත්‍යාදරයෙන් යුතු ව දළදා වහන්සේ ජීවමාන බුදුරජාණන් වහන්සේ ලෙස සලකමින් විවිධ පුද පූජා පවත්වන්නට වූහ. කල් යාමේ දී මෙරට රාජ්‍යත්වයේ සංකේතය බවට ද දළදා වහන්සේ පත්වූහ. එ සමයෙහි දළදා වහන්සේ යම් පුද්ගලයකු සතු වී ද හෙතෙම, මෙරට පාලකයා ලෙස පිළිගැනීමට රටවැසියෝ උත්සුක වූ හ.

අනුරාධපුර යුගයේ සිට සිදුවූ රාජධානි ව්‍යාප්තියත් සමඟ දළදා වහන්සේ ද ක්‍රමක්‍රමයෙන් පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව. කුරුණෑගල. ගම්පොළ හා කෝට්ටේ ආදී රාජධානිවලට වැඩම වූහ. අතීත රජ දරුවන් විසින් අලංකාර දළදා මන්දිර ඉදිකර ඒවාහි මහත් ගෞරවයෙන් දළදා වහන්සේ වඩාහිඳුවා පුදසත්කාර පවත්වන ලදී.

එසේ ම විවිධ කාලවකවානුවල දී පරසතුරු ආක්‍රමණයන්ට රාජ්‍යය නතු වූ අවස්ථාවන්හි දී ශාසන මාමක මහ තෙරවරුන් වහන්සේ හා රාජරාජ මහාමාත්‍යාදීහු තම දිවි දෙවැනි කොට මහත් පරිශ්‍රමයක් දරා දළදා වහන්සේ ආරක්ෂා කළහ.

සෙංකඩගල තම රාජධානිය කර ගනිමින් ක්‍රි.ව. 1592 දී ලක්දිව රාජ්‍යත්වයට පත් පළමු වැනි විමලධර්මසූරිය මහ රජතුමන් විසින් පන්සාළිස් වසක් පුරාවට කුරුවිට දෙල්ගමු විහාරයෙහි කුරහන් ගලක සඟවා තිබූ දළදා වහන්සේ මහ පෙරහරින් මහනුවරට වැඩමවීය. විචිත්‍ර වූ දෙමහල් දළදා මන්දිරයක් ඉදිකරවා ස්වර්ණමය කරඬුවක වඩාහිඳුවා පෙර රජ දරුවන් සේ ම දළදා වහන්සේ උදෙසා සිදු කළ යුතු සියලු පුද පූජාවන් නිසි අයුරින් නොකඩවා පැවැත්වීම ආරම්භ කරන ලදී. එතැන් සිට මහනුවර රාජධානියෙහි අවසානය දක්වා රාජ්‍යත්වයට පත් වූ සියලු රජ දරුවෝ තම දිවි දෙවැනි කොට දළදා වහන්සේ ආරක්ෂා කළහ.

මෙලෙස ශ්‍රී දළදා වහන්සේ උදෙසා අතීතයෙහි සිට පවත්වා ගෙන එනු ලබන විවිධ වූ පුද පූජාවන් අතර සාම්ප්‍රදායික සතර මංගල්‍යයට අයත් වාර්ෂික ඇසළ පෙරහර මංගල්‍යය ප්‍රධාන වේ.

මෙකී ඇසළ මංගල්‍යය හෙවත් වත්මන් දළදා පෙරහරෙහි ආරම්භය අනුරාධපුර රාජධානි සමයේ සිට ම සිදුවූවක් බව මහාවංසය හා චීන දේශගවේෂක පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තා පිරික්සීමේ දී පැහැදිලි වේ.

කිත්සිරිමෙවන් මහ රජු දළදා වහන්සේ ලැබීමෙන් අපමණ ප්‍රීතියට පත් ව විසිතුරු පුද පෙරහරක් පවත්වා තම අසීමිත භක්ති ප්‍රණාමය දැක්වූ අතර වසරක් පාසා නොකඩවා පෙරහර පැවැත්වීමට නියම කළ බව ද ඉතිහාසයෙහි දැක්වේ.

පොළොන්නරු රාජධානි සමයෙහි දී මහා පරාක්‍රමබාහු මහ රජතුමන් මනහර වූ දළදා පෙරහරක් වාර්ෂික ව පැවැත්වූ බවත් සඳහන්ය. දඹදෙණි, කුරුණෑගල ආදී යුගයන්හි මඟතොට සුදුවැලි අතුරා. නගරය දෙව් විමනක් සේ සරසා, ධජ පතාකාදියෙන් වීථි අලංකාර කොට, තොරන් බැඳ, විචිත්‍ර නැටුම් ගැයුම් සහිත මනහර වූ පෙරහරක රජතුමා හා මැති ඇමති පිරිවර දළදා වහන්සේ වැඩම කරවූ බව වංශ කථා සාහිත්‍යයෙහි දැක්වේ.

සීතාවක රාජධානි සමයෙහි සිට මහනුවර රාජධානි සමය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ විටින් විට ඇතිවූ පරසතුරු ආක්‍රමණ, අභ්‍යන්තර දේශපාලන අර්බුධ හා ඇතැම් රාජ්‍ය පාලකයන්ගේ ශාසන විරෝධී ක්‍රියා පිළිවෙත් නිසා ලාංකේය සම්බුද්ධ ශාසනය අතිශය පරිහානියට පත්වූ බව නොරහසකි.

දහඅට වැනි සියවස මැද භාගය තුළ පහළ වූ බෝධිසත්ත්ව ගුණෝපේත වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ ශ්‍රී සරණංකර සංඝරාජයාණන් වහන්සේගේ අප්‍රතිහත ධෛර්යය නිසා ම අපමණ දුක් කම්කටොලු හා බාධක මැද වුව ද මෙලෙස පිරිහී ගිය ලක් බුදුසසුන නැවත ප්‍රකෘතිමත් කොට සුරක්ෂිත කිරීමට හැකි වූ බව ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.

දළදා වහන්සේ උදෙසා අතීතයෙහි පටන් සිදු කෙරුණු දළදා පෙරහර මංගල්‍යය ද මේ සමය වන විට දෙවියන් උදෙසා පැවැත්වෙන දිව්‍ය පූජෝත්සවයකට සීමා වී තිබිණ. කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමය වන විට යට කී දළදා පෙරහර පැවැත්වීම වෙනුවට ඇසළ මාසයේ දී සිව්දේවාලයන්හි දේව පෙරහර පැවැත්වීම චාරිත්‍රයක් විය. එ සමයෙහි හුදෙක් ඇසළ මංගල්‍යය ලෙස හඳුන්වනු ලැබුවේ මෙකී දේව පූජෝපහාරය පමණකි. මෙහි ඇති අනුචිත බව මැනවින් වටහාගත් වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජයාණන් වහන්සේ සියම් දේශයෙන් උපසම්පදාව රැගෙන මෙරටට වැඩම කළ ප්‍රවර උපාලි මාහිමියන් සමඟ ද සාකච්ඡා කොට කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජතුමන් හට ශ්‍රී දළදා වහන්සේ විෂයයෙහි දළදා පෙරහර මංගල්‍යය පැවැත්වීමෙහි වටිනාකම පැහැදිලි කොට දළදා පෙරහර පැවැත්වීම සඳහා අනුශාසනා ලබා දුන්හ.

එතැන් පටන් වත්මන් දළදා පෙරහර පැවැත්වෙන ආකාරයට දළදා මාළිගයේ පෙරහර පළමුවත්, සිව් දේවාලයන්හි පෙරහර ඉන් අනතුරුවත් වීථි සංචාරය කෙරෙන අයුරින් පෙරහර සකස් කරවූහ.

අතීතයෙහි "ඇසළ කෙළිය" නමින් හැඳින් වූ මෙම ඇසළ මංගල්‍යය විෂ්ණු දෙවියන්ගේ උපත සැමරීම උදෙසා සිදු කරන ලද්දක් බවත් එය දෙවියන් උපත ලද ඇසළ මස නව සඳ දිනයේ දී ආරම්භ කොට දෙවියන් විසින් අසුරයින් පැරදවීම අරමුණු කොට දින ගණනක් මුළුල්ලෙහි පැවැත් වූ බවත් වෙල්ලස්සේ මහදිසාව විසින් ඒ සම්බන්ධ ව වර්ෂ 1817 දී සිදු කර ඇති ඉපැරැණි විස්තරයක දක්වා තිබේ.

එහෙත් මෙකී ඇසළ මංගල්‍යය දළදා පූජෝපහාරයකට පරිවර්තනය වූ දා පටන් සම්පූර්ණ බෞද්ධ මුහුණුවරකින් යුතු ව ක්‍රියාත්මක වේ.

මහනුවර ඇසළ මංගල්‍යය කුඹල් පෙරහර පහකින් හා රන්දෝලි පෙරහර පහකින් සමන්විත වන අතර, පස්දිනක් මුළුල්ලෙහි මෙකී කුඹල් පෙරහර පැවැත්වේ. ඇසළ පෙරහර මංගල්‍යය සඳහා ශ්‍රී දළදා මාළිගයෙහි සහභාගිත්වය සිදුවන්නේ කුඹල් පෙරහරේ සිට ය.

ශ්‍රී දළදා මාළිගාවේ පෙරහර කරඬුව සහිත මංගල හස්තිරාජයා සුභ මොහොතින් මාළිගාවේ සඳගල මත පාතැබීමෙන් අරම්භ වන ශ්‍රී දළදා පෙරහර, සිව් දේවාල පෙරහර ද සමඟ මහනුවර වීථි පුරා වීථිසංචාරය කෙරේ. කුඹල් පෙරහර ඉතා චාම් හා සරල වූවකි. කුඹල් පෙරහර පහ පැවැත්වීමෙන් අනතුරු ව පසු දින පටන් රන්දෝලි පෙරහර ආරම්භ වේ. ඒදින අලුයම සිව්මහා දේවාලයන්හි සුභ මොහොතින් රන්දෝලි බෑමේ චාරිත්‍රය සිදුකිරීමෙන් අනතුරු ව එම රාත්‍රියෙහි පටන් රන්දෝලි පෙරහර වීථි සංචාරය කෙරේ.

කුඹල් පෙරහරට වඩා ඉතා විචිත්‍ර වූ රන්දෝලි පෙරහර එකිනෙකට වෙනස් විවිධ වූ සංස්කෘතිකාංගයන්ගෙන් සමන්විත වූ අති දර්ශනීය වූවකි. මෙකී පෙරහර මංගල්‍යය තුළ ශ්‍රී දළදා වහන්සේ වෙනුවට උතුම් වූ සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් රාජකීය පෙරහර කරඬුව, ශ්‍රී දළදා වහන්සේ උදෙසා සිදුකෙරෙන සියලු ගෞරව පුදසත්කාර සහිත ව දෑලේ ඇතුන් පිරිවරා මංගල හස්තිරාජයා මතින් වැඩමවනු ලබයි.

වර්තමානයේ මෙම මහා සංස්කෘතික මංගල්‍යය මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු අස්ගිරි උභය මහා විහාරයන්හි අතිගෞරවාර්හ ශ්‍රීමත් මහා නායක මාහිමිපාණන් වහන්සේගේ පූර්ණ අවවාදානුශාසනාවන්ට අනුව ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේතුමන්ගේ මඟ පෙන්වීම මත ඉතා විචිත්‍රවත් අන්දමින් සිදුකෙරේ.





මල්වතු මහා විහාරවාසී
ඓතිහාසික
ගඩලාදෙණිය ශ්‍රී සද්ධර්මතිලක
රාජමහා විහාරාධිපති
රාජකීය පණ්ඩිත
**වැලිවිට
සරණංකර හිමි**

# රෝග පීඩාවන්ගෙන් නිදහස් වන්නට භාවනාව පුරුදු කරන්න



බත්තරමුල්ල
සිරි සුදස්සනාරාම
සදහම් සෙනසුනෙහි
ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික
නා හිමි**

**වර්තමාන සමාජයෙහි බෞද්ධ භාවනාව පිළිබඳ ව පවතින්නේ මහත් උනන්දුවකි. මෙම භාවනා පුහුණු කිරීමට ඇති අවශ්‍යතාවඅංග දෙකක් ඔස්සේ විස්තර කළ හැකි ය.**

එක් පිරිසක් බෞද්ධ දර්ශනයට අනුව චතුරාර්ය සත්‍ය අවබෝධය ලැබීමට නිවන අරමුණු කරමින් සමාධිය වැඩීමට උත්සුක වෙති.

අනෙක් පිරිස නිවන හෝ අනිත්‍ය, දුක්ඛ, අනන්ත නම් වූ ත්‍රිලක්ෂණ අවබෝධය පිණිස නොව එදිනෙදා ජීවන පැවැත්මේ ගැටලුවලට මානසික සහනයක් ලැබීම හා ලෙඩ රෝග සුවකර ගැනීම් ආදී අභිමතාර්ථ ඉටුකරග ැනීම් පිණිස ක්‍රියා කරන පිරිස ය. මෙම කවර අරමුණක් මත පිහිටා වුව ද, සිත පිරිසුදු කිරීම් හෙවත් අරමුණක් ඔස්සේ චිත්ත සමාධිය වැඩීම අගය කළ යුතු ය. එයට හේතුව වන්නේ චිත්ත පාරිශුද්ධිය සමස්ත පරිසරයේ ම සාමකාමී පැවැත්මකට හේතුවන බැවිනි.

මෙම ලිපිය ආරම්භයේ දී ම මහා සතිපට්ඨාන සූත්‍රයෙහි සඳහන් හැඳින්වීම සිහිපත් කරන්නට කැමැත්තෙමි."

මහණෙනි, මේ සතර සතිපට්ඨානය චිත්ත පාරිශුද්ධිය පිණිසත්, ශෝක වැළපීම් ඉක්මවීමටත්, කායික මානසික දුක් දොම්නස් පහකිරීමටත්, ලෝකෝත්තර මාර්ග නුවණ ඉපදවීමටත්, නිවන අවබෝධ කිරීමටත් ඇති එකම මඟයි.

සතිය හෙවත් "සිහිය පිහිටුවීම" එනම් කායිකවූත්, මානසිකවූත් සියලු අවස්ථාවන්හි දී පවත්නා ක්‍රියාවට සිත යොමුකොට තබමින් ක්‍රියාකිරීම නිසා සත්වයා තුළ පාරිශුද්ධියක් ඇති කළ හැකි ය.

සාමාන්‍ය ජනයාට මෙම අවස්ථාව පැහැදිලි කොට දිය යුත්තේ සිහි නුවණින් කටයුතු කිරීම යනුවෙනි. සත්‍ය ලෙසින්ම සිහි නුවණින් යුතුව ක්‍රියා කිරීමෙන් තම සිත හා සිතුම් පැතුම් පිළිබඳ පරීක්ෂාකාරී සිටීමට (සති සම්පජඤ්ඤය) පුද්ගලයාට අවස්ථාව සැලසේ.

පරීක්ෂාකාරී ව සිටින පුද්ගලයා හොඳ නරක සොයා බලයි. තම සිත තුළ ඇතිවන සිතිවිලි, සමාජ සම්මතයට හා ආගමික දර්ශනයට ගැළපේදැයි විමසුම් නුවණින් කටයුතු කරයි. මේ අනුව කායික ක්‍රියාවලියේ දි ඔහුගේ හෝ ඇයගේ හැසිරීම් පිළිබඳ මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීමට ඔවුන්ට ම අවස්ථාව සැලසේ.

මෙම කායික ක්‍රියාවලිය බෞද්ධ දර්ශනයෙහි අවස්ථා හතරකට බෙදා ඇත. එනම් සතර ඉරියව්ව නම් වූ ගමන් කිරීම, සිටීම, හිඳගැනීම හා සයනය කිරීම යනුවෙනි.

මෙම සතර ඉරියව්වේ දී ම මනාව සිත පිහිටුවාගෙන ක්‍රියා කිරීම නිසා වැරැදි (පාප, අකුසල) අඩු කිරීමට හා නැති කිරීමටත් යහපත ( පින, කුසලය) වැඩි දියුණු කිරීමටත් පුද්ගලයා පෙළඹේ.


මෙහි ප්‍රතිඵල පිළිවෙළින් සතිපට්ඨාන සූත්‍රය ඉදිරිපත් කරයි. සිත පිරිසුදු වන විට සෝක කිරීම් පහවී දුක් දොම්නස් ඉවත්ව යයි. සචේතනික හා අචේතනික සියල්ලම අනිත්‍ය බව හෙවත් දිරාගෙන යාම, වෙනස්වීම, නැතිවීම අවබෝධය මඟින් දැනෙන්නට පටන් ගනී. යමක් වෙනස් වේ නම් එය දුක් සහගත බවත්, එම දුක් හටගන්නේ සංඛාර වස්තු කිසිවක් ස්ථිරව නොපවතින හා "මම – මගේ" යැයි නම් කරමින් සිතින් උපාදානය කර ගත නොහැකි නිසාත් ය. මෙය සියලු කායිකවූත්, මානසිකවූත් දුක්දොම්නස්වලට හේතුකාරක වූ "අල්ලා ගැනීම" හෙවත් තෘෂ්ණාව නැතිකිරීම පිණිසත් – නිවන් මඟ පිණිසත් උපකාරිවේ ම ය.

දෙවනුව අප විසින් විමසා බලන්නේ සාමාන්‍ය ලෝකයා විසින් භාවනාව හෙවත් සිත පුහුණු කිරීමෙන්, සිතිවිලි ව්‍යාකූල වන්නට අවස්ථාව නොදී සන්සුන් කර ගැනීමෙන් ප්‍රතිඵල ලෙස බලාපොරොත්තු වන අරමුණු පිළිබඳයි. මෙම ලෞකික, එනම් මේ ජීවිතයේ "එදිනෙදා" සුභ සිද්ධිය පිණිස හේතුවන මානසික සුවය හා ලෙඩ රෝග සුවපත් කර ගැනීමට පිළියමක් ලෙස භාවනාව උපයෝගි කර ගැනීම පිළිබඳවයි.

සිත සමාධිගත වීම නම් සිත, සිතිවිලි සමඟ වීසිර යා නොදී එක් අරමුණක් කෙරේ තැන්පත්වීමට සැලසීමයි. දිනය පුරා ඇස, කන, නාසය, දිව හා ශරීරය ඔස්සේ අනේකවිධ සිතිවිලි "කැමති හා අකමැති" ලෙසින් අරමුණු ගැනීම නිසා සිත වෙහෙසට පත්වෙයි. සිත ව්‍යාකූලත්වයට පත්වෙයි. කැමැති දෑ ලබා ගන්නට සිත වෙහෙසෙයි. විටෙක ඒවා ලැබෙයි. තවත් වරෙක නොලැබී යයි. තවත් අවස්ථාවක ලැබූ දැය වෙනස්වී අත්හැරී යන විට සිත දුකට පත්වෙයි. තමා අකමැති දෑ පංචඉන්ද්‍රියන් මගින් සිතට හසුවන විට තරහව, අමනාපය, වෛරය ඇතිවෙයි. මෙහි අවසානයක් නැති ප්‍රතිඵල නම් දුක හා වේදනාව ය,

මෙම අවස්ථාව සාමාන්‍ය ජනයා ප්‍රකාශ කරන්නේ "මගේ ඔළුව අවුල්වෙලා" යනුවෙනි. මෙය, මානසිකව පීඩාකාරී ලෙස අඛණ්ඩව බලවත්වන විට මානසික ආතතිය හා දොම්නස් ස්වභාවය දක්වා වර්ධනය විය හැකි ය. මින් අනතුරුව, මෙම මානසික ආතති හා දොම්නස් ස්වභාවයේ අතුරු ප්‍රතිඵල ලෙස තරහව හා වෛරය ද තමා තුළ ඇතිවන හීනමානය ද තනිකම හා පාළුව ද, කුසගින්න නොදැනීම ද ආරම්භ වීමට පටන් ගනී. මෙහි භයානක ප්‍රතිඵලය වන්නේ "මට ජීවිතේම එපා වෙලායි" කියන මානසිකව අසරණ ස්වභාවයට පත්වූ විට සිය ජීවිතයට හානිකර ගැනීම තරම් මානසික තත්ත්වයකට පත්වීමයි. මෙසේ ඇතිවී මානසික ව්‍යාධීන් තව දුරටත් ක්‍රියාත්මක වෙමින් කායික පීඩාවන් හෙවත් කායික ලෙඩ රෝග දක්වා ව්‍යාප්ත වෙන්නට පටන් ගනී.

මෙම කායික රෝග මෙසේ විස්තර කළ හැකි ය. මාංශපේශිවල වේදනාව හන්දිපත් අමාරුව, හිසේ කැක්කුම යම් යම් හමේ



රෝග, බඩේ අමාරුව සහ මළ පහ සිදුවීමේ වෙනස්කම් සහ අධික දහදිය වැගිරීම ආදි ලෙසිනි.

එමෙන්ම හෘද ස්පන්දනය අධිකවීම, හෘදයෙහි ක්‍රියාවලිය ඉක්මන්වීම, පපුවේ වේදනාව සහ බඩවැල්වල ගෙඩි හට ගැනීම ආදියට ගොදුරුවීමේ අවස්ථා වැඩිවනු ඇත.

ඉහත විස්තර කළ මනෝ විද්‍යාත්මක හා වෛද්‍ය විද්‍යානුකූල කරුණු අනුව, මනස පිරිසුදුව පවත්වා ගැනීම මඟින් සාමාන්‍ය ජීවිතයේ මුහුණ දිය හැකි බොහෝ ලෙඩ රෝග හෙවත් අසනීප වළක්වා ගත හැකි ය. පෙරදිග හෝ බටහිර වෛද්‍ය විද්‍යාවෙන් පැහැදිලි කොට එළි දක්වන එම විද්‍යාත්මක සාධක හේතු හා ප්‍රතිඵල බෞද්ධ දර්ශනයට අනුව නව සොයා ගැනීමක් නොවේ.

ලෝකය මත ජීවිතය පවත්වා ගැනීමේ දි අපගේ ඉන්ද්‍රියන්ට හසුවන සියලු සචේතනික හා අචේතනික ( සංඛාර) වස්තූන් පිළිබඳ පැවතිය යුතු ආකාරය බුදුරදහු, අවස්ථා තුනකින් පැහැදිලි කළහ. පංච ඉන්ද්‍රියයන්ගෙන් අරමුණු සිතට හසුවීමේ දී පළමුව එහි පවත්නා සම්මුතිය ලෙසින් ඇති හඳුනාගැනීම, ඒ අනුව දැනෙන කායික හා මානසික සුවය හෙවත් සතුට අවබෝධ කර ගැනීම ය.

මීළඟට එම වස්තූන්වල ගැබ්ව දිරායාම හෙවත් වෙනස් වීමත් සම්මුතිය වෙතින් ලැබූ කායික හා මානසික සුවය හෙවත් සතුට දුකකට හෝ වේදනාවකට පත්විය හැකි ආකාරය දැකීමයි. මෙය ආදීනව අවස්ථාවයි. මෙම දැකීම මඟින් ඇතිවන අවබෝධය, ලෞකික හා ලෝකෝත්තර ලෙස සුවය ලැබීමට මර්ගයක් කර ගැනීමයි. එනම් අරමුණු ලෙස සිතට හසුවන කිසිවක් වෙනස් නොවන දෙයක් හැටියට අල්ලා නොගැනීමයි එනම් සිතින් අල්ලා නොගෙන අත්හැරීමයි. අරමුණු සිතින් අල්ලා නොගෙන, ඒවායෙහි ඇතිවීම හා නැතිවීම අවබෝධයෙන් දැකීමට පුරුදුවන විට සිත සන්සුන් වන්නට ආරම්භ වේ.

"සිත නිවිලා" යැයි පැවසිය හැක්කේ මෙම අවස්ථාවේ සිට ය. නිවුනු සිතට මානසික ආතතිය හෝ දොම්නස පැමිණීමේ අවස්ථා දුර්ලභ ය. මේ නිසා ඉහත විස්තර කළ ලෙඩ රෝගවලින් නිවාරණයක් ඇතිකර ගැනීමට අවස්ථාව සැලසේ.

***මෙම ලිපියේ ඉතිරි කොටස නිකිණි අව අටවක පෝද (19) අන්තර්ජාල පුවත්පතේ පළවේ***

# පොතෙන් නොව ජීවිතයෙන් අත්විඳිය යුතු ධර්මය



**දිනක් බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණෙන එක්තරා පුත්‍රයෙක් තම පියා මියගිය බවත්, තම පියා සුගතියකට එළඹවීම පිණිස කටයුතු කර දෙන ලෙසත් උන්වහන්සේගෙන් ඉල්ලා සිටියේ ය.**

බුදුන් වහන්සේ එයට කැමැත්ත ලබාදුන් අතර, ඒ සඳහා පසුදින ගංගා නම් නදිය සමීපයට පැමිණෙන ලෙසත්, ඒ සමඟම ලබු කැට හා ගල් කැට කිහිපයක් රැගෙන එන ලෙසත් දැන්වූහ.

ඒ අනුව නියමිත දිනයේ බුදුන් වහන්සේ උක්ත ස්ථානයට වැඩම කළහ. පුත්‍රයා ද එම ස්ථානයට පැමිණ, තම පියාගේ සුගතිය සලසා දෙන ලෙස දැන්වීය.

එවිට බුදුහිමියෝ “රැගෙන එන ලද ගල් කැට ගංගා නම් නදියේ පා කරන ලෙසත්, ලබු කැට ජලයේ ගිල්වන ලෙසත්” ඔහුට පැවසූහ. එයින් විමතියට පත් එම පුත්‍රයා

“සාමාන්‍යයෙන් ගල්කැට ජලයේ පා කළ නොහැකි ය, ලබු කැට ජලයේ ගිල්විය නොහැකි ය, ගල්කැට වතුර යටට ගොස්, ලබුකැට ජලයේ පාවීම සාමාන්‍ය ස්වභාවයයි ඔබ වහන්සේ විසින් පවසන ලද්ද කළ නොහැක්කකි” යනුවෙන් පැවසී ය.

එවිට බුදුන් වහන්සේගේ පිළිතුර මෙ පරිදි විය.

“යම් හෙයකින් එය කළ නොහැක්කක් සේ ම, ඔබ විසින් මාගෙන් “ඔබ පියා සුගතියකට එළඹ වන ලෙස කරන ලද ඉල්ලීම ද එපරිදි ම කළ නොහැක්කකි” යනුවෙනි.

ඉන් ගම්‍යමාන අර්ථය වනුයේ කිසිවකුටත් ඔබ උසස් තත්වයකට හෝ පහත් තත්වයකට ඇද දැමිය නොහැකි බවත්, එය තමා සන්තකව ම පවතින්නක් බවත් ය.

මේ ගතවන වස්සාන සමය තමාගේ උසස් බව කෙරෙහි ඉවහල් කර ගැනීමට උත්සුක වන ලෙස මූලිකව ම දැක්විය යුතු ය.

විහාරස්ථානවල භික්ෂූන් වහන්සේ බහුල ව වැඩ වාසය කරන මෙම සමය ධර්මය කෙරෙහි වඩාත් සමීපවන කාලපරාසයක් කර ගැනීමට වෙහෙසිය යුතු ය. බෝධි පූජා, බුද්ධ පූජා, ධර්ම දේශනා හා පිරිත් දේශනා වැනි අනේකවිධ ආගමික වතාවත් තුළ සිත පිහිටුවා කුසල් වැඩීම ප්‍රමුඛාභිලාෂය කර ගත යුත්තේ වේ. මේ සියල්ල තුළ ධර්මය ප්‍රායෝගික ජීවිතයට ගලපා ගැනීම අනිවාර්ය වූවකි.

දානයක් දීමේ දී, එය අන් අයගේ මෙහෙයවීමකින් තොරව, තමාගේ ම සිත තුළ උපන් සිතිවිල්ලෙන් සිදුකෙරේ ද, එය අසංඛාරික සිතකි. අන් අයගේ මෙහෙයවීමෙන් සිදුවනුයේ සසංඛාරික නම්. බුද්ධ වන්දනාව, භාවනාව හා ධර්ම ශ්‍රවණය වැනි එදිනෙදා දිවියේ නිරන්තර සිදුකෙරෙන කුසල ක්‍රියාවන් තුළින් ඔබ අත්කර ගනුයේ අසංඛාරික හෝ සසංඛාරික කුසල් ද යන්න ඔබ ඔබෙන් ම ප්‍රශ්න කළ යුතු ය.

යමකු ධර්මය කොතරම් දන්නේ නමුදු, ධර්මානුකූලව ජීවත් නොවේ නම්, හේ අනුන්ගේ ගවයන් රකින ගොපල්ලකුවන් බව බුද්ධ දේශනාවයි. කෙතරම් දහම් දෙසුවත්, ශ්‍රවණය කළත්, කියෙව්වත් හෝ හැදෑරුවත් ප්‍රායෝගික ව ජීවිතය තුළින් ධර්මය අත්විඳිය නොහැකි නම්, එම ජීවිතය අවාසනාවන්ත වූවකි. මෙත්තා, කරුණා, මුදිතා හා උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ පිළිබඳ තරමක් සිතා බලන්න. දිනකට කී වතාවක් ඔබ එම ගුණාංග වඩන්නේ ද? දිනකට කී වරක් ද්වේශය, ඊර්ෂ්‍යාව හා වෛරය මත පදනම්ව කටයුතු කරන්නේ ද? උක්ත ද්වය ඇසුරෙන් ඔබ රැකියාවේ නිරත ආයතනය තුළ හෝ, නිවසේ දී හෝ වඩාත් ප්‍රගුණ කරනුයේ මොනවා ද? ධර්ම මාර්ගය ඔබේ ප්‍රායෝගිකත්වයේ සාර්ථක හෝ අසාර්ථක බව ඔබටම තීරණය කළ හැකි ය.

මෙතෙක් ඔබ අනුන්ගේ තීරකයා වූයේ නම්, අදම ඔබ ඔබේ තීරකයා වන්න. ඔබට මඟහැරුණු බොහෝ දෑ අවබෝධය පිණිස මඟ සැලසෙනු ඇත.

අම්මා කෙනකු දරුවකුට ආහාර පිසින්නේ මෛත්‍රිය හා කරුණාව ප්‍රමුඛ කොට ගෙන ය. එය මෛත්‍රියේ සංකේතයක් නම්, ඔබ අන් අය වෙනුවෙන් කරන ක්‍රියා තුළ එකී මෛත්‍රිය ගැබ්ව ඇත්දැයි සිතන්න.

උදාහරණයක් ලෙස, ඔබ යමකුට තේ ටිකක් සාදා දෙන්නේ ද? “බිවුවත් එකයි, නැතත් එකයි, මහ කරුමයක්” වැනි සිතිවිලි තුළ පිහිටා ඔබ එම කර්තව්‍යයෙහි නිරත වන්නේ නම්, ඔබ තුළින් මෛත්‍රිය ප්‍රායෝගික ව දැකිය හැකි ද? ලෝකයෙහි සැබෑ ජයග්‍රහණය ලබනුයේ සිත පිරිසුදු මිනිසුන් ය. සිත අපිරිසුදු මිනිසුන් ලබන ජයග්‍රහණයන් ඉතා තාවකාලික වෙති.

එක්තරා කාලයක දක්ෂ වඩුවෙක් වාසය කළේ ය. ඔහු ආයතනයකට අනුබද්ධ ව ප්‍රධානියකු යටතේ සේවය කළේ ය. ඔහු අතින් බොහෝ නිවාස මනරම් ව නිර්මාණය වුණි. වසර හතළිහක් පමණ මෙම කර්මාන්තයෙහි නිරත වූ මොහුට විශ්‍රාම ගැනීම කෙරෙහි සිත් පහළ විය. ඔහු තම ආයතන ප්‍රධානියා වෙත ගොස් තමාට විශ්‍රාම ගැනීමට අවශ්‍ය බව දැන්වීය. දැන්ම විශ්‍රාම නොගන්නා ලෙසත්, අවසාන වශයෙන් මා වෙනුවෙන් නිවසක් තනා දෙන ලෙසත් ආයතන ප්‍රධානියා ඉල්ලා සිටියේ ය.

“මෙතරම් කාලයක් මා වැඩ කළත්, මාගේ මහන්සිය, කැපවීම පිළිබඳ කිසිදු තැකීමක් නොකොට තවදුරටත් මාගෙන් වැඩ ගැනුමට මොහු උත්සාහ දරයි”

යනුවෙන් කල්පනා කළ මෙම වඩුවා එම නිවස ඉතාම ඉක්මණින් නිර්මාණය කොට නිම කළේ ය. ඒ අනුව, එතෙක් ඔහු විසින් නිර්මාණය කරන ලද කැතම නිර්මාණය එය බවට පත්විය.

අනතුරුව ආයතන ප්‍රධානියා වෙත ගිය මෙම වඩුවා තම කර්තව්‍යය නිම කළ වග දැන්වීය. එවිට ආයතන ප්‍රධානියා මෙලෙස පැවසී ය:

“ඔබ විසින් මා වෙනුවෙන් මෙතරම් කලක් බොහෝ සේවයක් ඉටු කරන ලදී, එයට කෘතගුණ ලෙස මෙම නිවස ඔබ වෙනුවෙන් නිර්මාණය වූවකි” යනුවෙනි. සිතන්න: මෙම නිවස එම වඩුවා වෙනුවෙන් නිර්මාණය කරන්නක් වග දන්නේ නම් ඔහු අතින් එය කෙසේ නිම වනු ඇතිද? එබැවින් තමා විසින් කරනු ලබන ඕනෑම කටයුත්තක දී අන් අය කෙරෙහි මෙත් සිත් පෙරදැරිව සිදුකිරීම වඩාත් ප්‍රයෝජනවත් ය. සැබැවින් ම මෛත්‍රිය, කරුණාව, මුදිතාව හා උපේක්ෂාව යන ගුණාංග දරුවන්ට, ඥාතීන්ට, මිත්‍රයන්ට පමණක් සීමා නොකොට සියල්ලන් කෙරෙහි ම පවත්වා ගැනීමට හැකි නම්, එය ධර්මය ප්‍රායෝගික ව ජීවිතයට ගලපා ගැනීමකි.

මෛත්‍රිය යනු සැම දෙනා කෙරෙහි ම මිතුරු බව පැතිරවීමයි. අන් අයගේ දුක දැක හද කම්පාවීම කරුණා නම්. අන් අයගේ දියුණුව දැක ඒ කෙරෙහි තුටුවීම මුදිතාවයි. දුකේ දී හා සැපේ දි කම්පා නොවීම උපේක්ෂාවයි (උදා- මවකට දරුවකු විසින් බැණ වැදුණත්, දරුවා කෙරෙහි වන සෙනෙහසින් ඇය එය දරා සිටී ධාර්මික හා වඩාත් ප්‍රබුද්ධ සමාජයකට මෙම ඉගැන්වීම් උපයෝගීකොට ගත යුතු ය.

අප කවුරුත් එළඹ සිටිනුයේ තාවකාලික නවාතැනකටයි. බොහෝ දෙනකු විසින් අමතක කොට ඇති හා පිළිගැනීමට අකැමැති සත්‍යය ද එයයි.

එක්තරා සෙන් කතාවකට අනුව, දිනක් වයසක පුද්ගලයකු ගමනක් යමින් සිටී. අඳුර වැටුණු හෙයින් ඔහුට නවාතැනක් සෙවීමට සිදුවුණි. එක් ගෙයක් සමීපයට පැමිණි ඔහු ගෙදර අයිතිකරුට අඬගැසුවේ ය. එවිට නිවසින් එළියට පැමිණි තරුණ අයකු

“ඔබ කවුද?, ඔබට අවැසි කිමද?” යනුවෙන් ප්‍රශ්න කළේ ය. එවිට වයසක පුද්ගලයා “අන්ධකාරය බැවින් අද රාත්‍රිය ඔබේ අම්බලමේ නැවතී සිට යා හැකි දැයි” විමසීය. එවිට තරුණයා “ඔබ කුමක්ද පැවසුවේ? මෙය අම්බලමක් කියා ද ඔබ කියන්නෙ?” යනුවෙන් විමසී ය. තවද, මෙය අම්බලමක් නොවන බවත්, මෙය මට පරම්පරාවෙන් ලැබුණු මාළිගාව බවත් ඔහු පැවසුවේ ය. එවිට වයසක තැනැත්තා - “ඔබට පෙර මෙහි වසන ලද්දේ කවුරුන්ද?” “මගේ තාත්තා”. ඔහු දැන් කොහිදැයි විමසූ විට, තරුණයා ඔහු මියගොස් ඇතිබව කීවේ ය. තාත්තාටත් පෙර වසන ලද්දේ කවුරු කවුරුදැයි ආදී ලෙස විමසන කල, පිළිවෙලින් ඔවුන් මිය ගොස් ඇති බව එම තරුණයා ප්‍රකාශ කළේ ය. එවිට වයසක පුද්ගලයා ප්‍රශ්න කරනුයේ “බොහෝ දෙනා මෙහි පැමිණ නැවතී සිට යන බැවින් මෙය සැබැවින් ම අම්බලමක් නොවන්නේ ද? යන්නයි. එබැවින් මේ සසරේ එක් නවාතැනක නැවතී තාවකාලික සැපයක් වෙනුවෙන් සසරේ සදාකාලික දුක් විඳින්නන් නොවන්නට අප වීර්ය කළ යුතු ය.

කකචූපම සූත්‍රය දක්වනුයේ යමකු කියතක් ගෙන තමාව දෙකට ඉරන්නේ නමුදු, එය කරවන්නන් කෙරෙහි ද්වේශ නොකිරීමට තරම් සිත පුරුදු කරන ලෙස ය. එය ලෙහෙසි වූවක් නොවුණ ද, එය අවසාන ඉලක්කය නම්, උක්ත පරිදි සිතිවිලි දැරීම ධර්මය ප්‍රායෝගික කොට ගැනීමක් ද යන වග තමාගෙන් ම විමසිය යුත්තකි.

බුදුන් වහන්සේ විසින් භික්ෂූන්ට දෙන ලද වටිනාම උපදේශයක් වේ. එනම්, “මහණෙනි, ඔබ වහන්සේ එකට එකතු වූ විට, ධාර්මික කතාවේ නිරතවන්න, නැතිනම් නිශ්ශබ්දව සිටින්න” යනුවෙනි. මෙය කායික

ක්‍රියා හා මානසික සිතිවිලි කෙරෙහි ද ගෙන “ධාර්මික දේ ම කරන්න, ධාර්මික දේ ම සිතන්න”. ලැබූ කෙටි මනුසත් දිවිය හිස් වූවක් කර නොගන්න. ගතවන වස්කාලයේ තමන් තුළ ඇති උක්ත අඩුපාඩු නිවැරැදි කර ගනිමින්, කුසල් වඩන ප්‍රායෝගික ජීවිතයක් කෙරෙහි ධර්මය නිවැරැදිව ගලපා ගන්නේ නම් ඉන් ඔබට වන යහපත වෙන කිසිවකුට අත්පත් කර දිය නොහැකි සුභසිද්ධියක් ලෙසම වටහා ගන්න.



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ,
සහකාර කථිකාචාර්ය,
**මොරවක සිරි ධම්මරක්ඛිත හිමි**

# වතුරකුඹුරේ ධම්මරතන නා හිමියෝ (නෙල්ලිගල හාමුදුරුවෝ)

## රත්නපුර මහ දිසාවේ අභිනව ප්‍රධාන සංඝනායක ධූරයෙන් හා ධර්ම කීර්ති ශ්‍රී මංගල ගෞරව නාමයෙන් පිදුම් ලබති



ශ්‍යාමෝපාලි වංශික මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ කර්මවාගාචාර්ය ඓතිහාසික කූරගල රාජමහා විහාරාධිපති නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානාධිපති, යටිහලගල රාජමහා විහාරාධිකාරි, අතිපූජ්‍ය වතුරකුඹුරේ ධම්මරතන නාහිමිපාණන් වහන්සේ අප අස්ගිරි මහා විහාර පාර්ශවයේ රාජ පූජිත මංගල උපෝසථාගාරයේ දී හයගිරි විජයසුන්දරාරාමාධිපති, ඓතිහාසික බදුලු මුතියංගන රාජමහා විහාරාධිපති ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශවයේ ශ්‍රීමත් මහා නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රමුඛ විංශත්වර්ගික කාරක මහා සංඝ සභාව විසින් ඒකමතික සම්මුතියෙන් රත්නපුර මහ දිසාවේ ප්‍රධාන සංඝනායක ධූරයට "ධර්ම කීර්ති ශ්‍රී මංගල" යන ගෞරව නාම සහිතව පත් කරන්නට යෙදුණේ ය.

අප අභිනව රත්නපුර මහ දිසාවේ ප්‍රධාන සංඝ නායක නාහිමිපාණන් වහන්සේට එම උත්තරීතර පදවිය හා ගෞරව නාමය පිරිනමනු ලැබුයේ උන්වහන්සේ විසින් මෙරට බුදු දහමේ හා සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් මෙන් ම සාමාජීය වශයෙන් සිදුකළ අනභිභවනීය මහා සේවාවට පිරිනමන ගෞරවයක් හා පළ කරන ඉමහත් ප්‍රසාදයක් ලෙස මෙන්ම එම කටයුතු ඉදිරියට කර ගෙන යාමට කරන දිරි ගැන්වීමක් වශයෙනි.

තමන් වහන්සේ කරන්නට යෙදුණු ශාසනික හා සාමාජීය කටයුතු කිසි විටකත් ප්‍රසිද්ධියට පත් කිරීමට හෝ ප්‍රසිද්ධියේ කීමට දැඩි අකැමැත්තක් දක්වන උන්වහන්සේ ඒ තුළින් ප්‍රසිද්ධිය, කීර්තිය නොපතන සම්භාවනීය යතිවරයෙකි.

එසේ වුවත් අප නාහිමියන් සිදුකළ කටයුතු මෙතෙකැයි කියා කීමට නොහැකි උනත් අප නාහිමියන්ට කරන ගෞරවයක් ලෙස උන්වහන්සේ එසේ සිදුකළ ශාසනික සේවාවන් රැසක් තුළින් ප්‍රධාන වශයෙන් දැක්විය හැකි පුණ්‍යකර්මයන් කීපයක් මෙසේ දැක්විය හැක.

දෙස් විදෙස් අත්‍යන්ත ගෞරවයට පාත්‍ර වූ නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය නිර්මාණය කිරීම.

ඓතිහාසික රාජපූජිත යටිහලගල රාජමහා විහාරය ප්‍රතිසංස්කරණය කොට සසුනට පූජා කිරීම.

රටට ජාතියට අභිමිවන්නට ගිය බලංගොඩ ඓතිහාසික කූරගල රාජමහා විහාරය විනාශ මුඛයෙන් බේරාගෙන අතීත ශ්‍රී විභූතියට හානි නොවන පරිද්දෙන් යුගයේ දැවැන්තම විහාර සංවර්ධන කර්මාන්තය දියත කොට සසුනට, ජාතියට දායාද කිරීම.

දඹාන ගුරුකුඹුර ආදිවාසී ගම්මානය අන්‍යාගමිකරණයෙන් ගලවා වෙහෙර විහාර තනවා ඔවුනට වන්දනාමාන කිරීමට ඉඩ ප්‍රස්ථා විවර කිරීම.

ලක්දිව සෑම ප්‍රදේශයක් තුළ ම නොයෙකුත් විහාරස්ථාන තුළ චෛත්‍ය, බෝධි මලු, දානශාලා, ධර්ම මන්දිර, ආවාස මන්දිර, විශ්‍රාම ශාලා ආදී විහාරාංග නිර්මාණය කිරීම.

එවන් ආකාරයේ ශාසනික සේවාවන් මුල් කොට ලක්දිව පුරා නොයෙක් අයුරේ ශාසනික සේවාවන් සිදු කරන්නට යෙදුණි. එමෙන්ම තවත් එවැනි සේවාවන්, පුණ්‍ය කර්මයන් සිදු කරමින් සිටී.

උන්වහන්සේ ශාසනික වශයෙන් මෙන්ම සමාජීය වශයෙන් සිදු කරන්නට යෙදුනු සේවාවන් රැසක් ද පවතී. ඉන් කිහිපයක් ලෙස දිවයිනේ නොයෙකුත් පාසල්, පිරිවෙන්, දහම් පාසල් මුල් කොට ගෙන දුවා දරුවන්ගේ අධ්‍යාපනය සඳහා අවශ්‍ය පොත් පත්, ඩෙස්, පුටු, කබඩ්, තූර්යවාදන භාණ්ඩ, ක්‍රීඩා භාණ්ඩ, පරිගණක ආදී අධ්‍යාපන ද්‍රව්‍යමය උපාංග හා අවශ්‍ය ගොඩනැඟිලි, ක්‍රීඩා පිට්ටනි ආදී භෞතික සම්පත් ප්‍රතිසංස්කරණය කිරීම හා නව භෞතික සම්පත් ගොඩනඟා පරිත්‍යාග කිරීම දක්වාලිය හැක.

අතිපූජනීය අභිනව අප ප්‍රධාන සංඝනායක නාහිමිපාණන් වහන්සේ තම ශාසනික දිවි මඟට පැමිණි නොයෙකුත් දුක් පීඩා මැද නොසෙල් වී සෘජු පටිපන්න ගුණයෙන් යුක්තව ඒ සියල්ලට ම තම ඥාන, ගුණ, සිල්වත් බවින් පිළිතුරු ලබා දී, මුහුණ දී අද වන විට ඒ සියල්ල ම පරාජය කොට මෙරට මෙන්ම විදෙස් රටවල බෞද්ධ ජනතාවගේ අත්‍යන්ත ඇගයීමට හා ගෞරවයට පාත්‍රව සිටියි.




ලක්දිව කීර්තිමත් සම්භාවනීය ස්ථානයක් වන රාජපූජිත ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ අත්‍යන්තර ප්‍රසාදයටත්, ඇගයීමටත් ලත් තම පින්වත් දිවි සැරියේ 36 වන වියේ දී මේසා විශාල ගෞරව නාම සහිත නායක පදවිය-කට පත්වීම ම උන්වහන්සේගේ කාර්යශූර භාවය හා ශාසනික මෙහෙය මෙන්ම සිල්වත් ගුණවත් භාවය ද මනාව ප්‍රකට වීමකි.

පත් වන්නට යෙදුණා වූ අභිනව උතුම් ප්‍රධාන සංඝනායක ධූරයේ භාර දූර ශාසනික කටයුතු කිරීමට ශ්‍රී නාථ, සුමන සමන් දිව්‍ය රාජයන් ප්‍රමුඛ සම්‍යක් දෘෂ්ටික දෙවියන්ගේ පිහිට ආරක්ෂාව ලැබේවා.

මල්වතු මහා විහාරවාසි, කර්මවාගාචාර්ය
ගණේගොඩ ශ්‍රී සුමන පිරිවෙන් නියෝජ්‍ය
පරිවෙනාධිපති

**වතුරකුඹුරේ ඥාණවිමල හිමි**

# මහලකොටුවේ විමලධම්ම නාහිමි

## ශ්‍රී සිද්ධාර්ථ පියදස්සි රතනසාර යන ගෞරව නාමය සහිත මාතලේ මහ දිසාවේ ප්‍රධාන සංඝනායක ධූරයෙන් පිදුම් ලබති



මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල උඩසියපත්තුවේ මහලකොටුව නම් ග්‍රාමයේ 1957 ඔක්තෝම්බර් මස 14 වැනි දින ඒකනායක මුදියන්සේලාගේ දම්මන්තොට ගෙදර මුදියන්සේ නිලමේතුමාට හා රත්නින්දේ මහ පන්සලේ ගෙදර කෝනාර මුදියන්සේලාගේ කළුමැණිකේ යන මව්පියන් දෙපළට දාව ජන්මලාභය ලබා ගත් මේ කුල කුමරුවා වන්නේ ඒකනායක මුදියන්සේලාගේ දම්මන්තොට ගෙදර කිරිබණ්ඩා ඒකනායක ය.

ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ මාතලේ මහ දිසාවේ සංඝනායක,රාජකීය පණ්ඩිත මහලකොටුවේ රතනසාර නායක මාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1966 සැප්තැම්බර් මස 7 වැනි දින " මහලකොටුවේ විමලධම්ම" නමින් උඩුපිහිල්ල , හේනේපොල වෙහෙරගොඩ පුරාණ විහාරයේ දී උතුම් පැවිදි භූමියට පත් විය.

මහලකොටුවේ රතනසාර නායක මාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් 1981 ජුලි මස 5 වැනි දින මහනුවර මල්වතු මහා විහාරයීය මංගල උපෝසථාගාරයේ දී උතුම් අධිශීල සංඛ්‍යාත උපසම්පදා සීලයෙහි පිහිටුවන ලදී.

විමලධම්ම හිමියන් කුඩා කාලයේ පටන් ධර්ම දේශනා කිරීමට ඉතාම දක්ෂ ය . මනා කථිකත්වයකින් යුක්ත ය.මේ නිසා ම පළාතේ ගිහි පැවිදි දෙපාර්ශවයේ ම ජන ප්‍රසාදයට පත්විය.

උන්වහන්සේ හැකියාවන්ගෙන් යුක්ත වූ නිසාත්, අනතිමානී ගුණයෙන් යුක්ත වූ නිසාත් පළාතේ මහා සංඝරත්නය පමණක් නොව ජනතාව ද ඇසුරු කිරිමට, කතා බහ කිරීමට රුචිකත්වයක් දක්වයි. එකල මාතලේ ප්‍රදේශයේ කොටුවේගෙදර, බැබිළේවෙල, හේනේපොල ,තැන්න ,වැලිකොටුව ආදි ගම්වල ආගමික කටයුතුවලට වැඩම කරන නිසා දායක දායිකාවන් අතර උන්වහන්සේ ඉතාම ජනප්‍රිය භික්ෂූන් වහන්සේ නමකි. කොටුවේගෙදර ජනතාවගේ බලවත් ඉල්ලීම මත 1992 මැයි මස 14 වන දින " ශ්‍රී සුධර්මෝදය " නමින් විහාරස්ථානයක් උන්වහන්සේගේ විහාරාධිපතීත්වයෙන් පොල් අතු සෙවිළි කළ පිටලෑලි ගැසු ආවාසයකින් ආරම්භ කරන ලදී.

මෙම විහාරස්ථානය වර්තමානය වන විට සියලු විහාරාංගයන්ගෙන් සමන්විත, පැමිණෙන පින්වතුන්ගේ සිත් සනසාලන ආකර්ශනීය පූජනීය පුදබිමකි.

ළමුන් සුළු ප්‍රමාණයකින් ආරම්භ කළ දහම් පාසල ක්‍රමයෙන් දියුණු කළ අතර වර්තමානය වනවිට ළමුන් 300 වඩා අධික ප්‍රමාණයක් අධ්‍යාපනය ලබයි.දහම් ගුරුවරු 16 දෙනකුටත් වඩා සේවය කරන මෙම දහම් පාසලේ ස්වාමින් වහන්සේලා පස් නමක් ද පාසල් ගුරුවරුන් කිහිප දෙනෙක් ද දහම් ගුරුවරු වශයෙන් සේවය කරති.

මාතලේ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ හා මාතලේ දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ප්‍රධාන ලේඛකාධිකාරී ධූරය ද වසර 10 වඩා හොබවා ඇත.

විමලධම්ම හිමිපාණන් වහන්සේගේ ගුරුදේවයන් වහන්සේ වූ මහලකොටුවේ රතනසාර නායක මාහිමිපාණන් වහන්සේ අපවත් වීමෙන් පුරප්පාඩු වූ නායක පදවිය " ශ්‍රී සිද්ධාර්ථ රතනසාර" යන ගෞරව නාමය සහිතව ශ්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශවයේ මාතලේ මහ දිසාවේ සංඝ නායක පදවියට මහලකොටුවේ විමලධම්ම හිමිපාණන් වහන්සේ පත් කරන ලදි.විමලධම්ම හිමිපාණන් වහන්සේ මේ වන විට අවුරුදු 65 ගත කරන අතර එයින් පැවිදි දිවියට වසර 56 ගත වී ඇත.


නායක පදවි ප්‍රාප්තියට පත් මහලකොටුවේ විමලධම්ම නායක නාහිමිපාණන් වහන්සේගේ ඉදිරි ආගමික හා ශාසනික කටයුතු තව තවත් සාර්ථකව කරගෙන යාම සඳහා දළදා සමිඳු සරණින් උන්වහන්සේට නිදුක් නීරෝගී චිර ජීවනය ලැබේවා.

කොළඹ නාලන්දා විද්‍යාලයේ විශ්‍රාමලත්
ධර්මාචාර්ය, අධ්‍යාපනවේදී ,ශාස්ත්‍රපති

**උඩුපිහිල්ලේ විමලබුද්ධි හිමි**

# බෝසත් දරු පිරිසක් ජාතියට දායාද කිරීම දහම් පාසලේ අරමුණයි

**දහම් පාසල් දිනය යෙදී තිබුණේ පසුගිය 3 වැනිදාටය. 2022 අවුරුද්දට දහම් පාසල් ආරම්භ කර අවුරුදු 127කි. අපේ දහම් පාසල් සේවාවේ ආරම්භය සනිටුහන් වන්නේ 1895 අගෝස්තු මස 03 වැනි දිනය. ඒ ගාල්ලේ වැලිවත්තේ ශ්‍රී විජයානන්දාරාමයේ දී සර් හෙන්රි ස්ටීල් ඕල්කට් මැතිතුමා හා බ්ලැවැට්ස්කි මැතිනියගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළ දහම් පාසලයි.**



සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල මහා ලේඛකාධිකාරී හා ලෝක තරුණ බෞද්ධ සංඝ සභාවේ මහ ලේකම්
**මුගුණුවෙල අනුරුද්ධ නා හිමි**

වර්ෂ 1895 අගෝස්තු මස 03 වැනි දින ගාල්ල වැලිවත්ත විජයානන්ද විහාරස්ථානයෙහි ඇහැලේපොළ ජිනෝරස ස්වාමින් වහන්සේගේ මුලිකත්වයෙන් ඇරඹි විජයානන්ද දහම් පාසල විහාරස්ථානයක ආරම්භ වූ සංවිධානාත්මක ප්‍රථම දහම් පාසල වන බව මූලාශ්‍ර අනුව පැහැදිලි ය. ඒ අනුව දහනව වැනි සියවසේ අග භාගයේ දී හා විසිවැනි සියවසේ ප්‍රථම භාගය වන විට දිවයින පුරා ඉරුදින බෞද්ධ දහම් පාසල් ව්‍යාප්තිය සිදු වී ඇත.

වර්ෂ 1889 දී ශ්‍රීමත් ඩි. බී. ජයතිලක මැතිතුමාගේ සහභාගිත්වයෙන් ඇරඹි, කොළඹ තරුණ බෞද්ධ සංගමය මෙරට දහම් පාසල් අධ්‍යාපනයේ උන්නතිය උදෙසා සුවිශේෂී පුරෝගාමී මෙහෙවරක් ඉටුකර ඇති බව මේ මොහොතේ සිහිපත් කළ යුතුව ඇත.

1920 වර්ෂයේ දී දහම් පාසල් විභාග පැවැත්වීම ආරම්භ කිරීම හා දශක 05 කට ආසන්න කාලයක් දහම් පාසල් විභාග පැවැත්වීම, දහම් පාසල් අධ්‍යාපනයට අවශ්‍ය පෙළපොත් සම්පාදනය කර ලබා දෙමින් ඉටුකළ මෙහෙය අතිමහත් ය.

එසේම අතිපූජනීය මහා සංඝරත්නයේ හා එවකට ජීවත්ව සිටි උදාරතර මිනිසුන්ගේ ස්වෙච්ඡා වගවීමත්, බහුතර ජනයාගේ කැපවීමත් දහම් පාසල් අධ්‍යාපනය නොනැසී රැඳී පැවත්මට බෙහෙවින් ඉවහල්වී ඇත.

වර්ෂ 1956 දී සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ආරම්භ කිරීමත් සමඟ බෞද්ධ දහම් පාසල් සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබීමට හේතු විය. එවකට පැවති සියලු දහම් පාසල් සංස්කෘතික දෙපාර්තමේන්තුව ලියාපදිංචි කර, දහම් පාසල් පද්ධතියේ සම්පූර්ණ වගකීම සංස්කෘතික දෙපාර්තමේන්තුවට පවරා, එවකට ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාස හෙවත් මේවන විට ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම් කර ගනිමින් ප්‍රාදේශීය සාසනාරක්ෂක මණ්ඩල පිහිටුවා, දහම් පාසල් ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩලවලට අනුයුක්ත කර දහම් පාසල් අධ්‍යාපනයට ඵලදායිතාවක් උදාකර දීමට හැකි වී ඇත.

2002 වර්ෂයේ දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල ඒකාබද්ධ කර, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය ස්ථාපිත කර බුද්ධ සාසන අමාත්‍යංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන් සදහා සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ උපදේශකත්වයෙන් ක්‍රියාත්මක කිරීම දක්වා වූ දහම් පාසල් පාලන හා පරිපාලන ව්‍යුහයේ විකාශනය මත අදවන විට සමස්ත දහම් පාසල් පද්ධතිය සුවිශේෂී සන්ධිස්ථානයකට පැමිණ ඇති බව සඳහන් කළ යුතු ය.

අද වනවිට නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ. ඒ අනුව ජාතික අධ්‍යාපනය කොමිෂන් සභාව මගින් පොදු නිපුණතා 05 ක් හඳුන්වා දී ඇත.

සන්නිවේදන නිපුණතා
පරිසරයට අදාළ නිපුණතා
ආචාර ධර්මවලට හා ආගමට අදාළ නිපුණතා
ක්‍රීඩා හා විවේකය පිළිබඳ නිපුණතා
ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතා ඒ අතර වෙයි. එකී නිපුණතා දහම් පාසල් විෂය නිර්දේශවලට ද අදාළ කර ක්‍රියා කිරීම සිදුවේ.

බුදු දහම පදනම් කර ගෙන තමා හා තම, අවට පරිසරය පිළිබඳ නිවැරැදි අවබෝධයක් ඇති, එම අවබෝධයට අනුව හැසිරෙන සහ එසේ හැසිරීමේ ප්‍රතිඵල අද්දකින ගුණ නැණ බෙලෙන් යුතු බෝසත් දරු පිරිසක් සමස්ත ජාතියට දායාද කිරීම මෙරට බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන පරමාර්ථය වේ. එකී පරමාර්ථය පෙරදැරිව දහම් පාසල් අධ්‍යාපනයේ යෙදෙන දරුවාගේ ආකල්ප සංවර්ධනය සඳහා අපේක්ෂිත පොදු නිපුණතා දහයක් ද, බෞද්ධ විද්වතුන් විසින් හදුන්වා දී ඇත.

දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම හැඳින ගෙන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි.

බුද්ධ චරිතය හා වෙනත් ශ්‍රේෂ්ඨ චරිත හැඳින ඒවා චරිතායනය කරයි.

පන්සිල් සුරකිමින් සඟරුවනට හා ගුරු දෙගුරුන්ට ගරු බුහුමන් දක්වයි.

ධර්මය පිළිබඳ නිවැරැදි නිරවුල් දැනුමක් ඇතිව තමන්ටත් අනුන්ටත් හිතසුව පිණිස වන පෞරෂයක් ගොඩනඟා ගැනීමට ක්‍රියා කරයි.

කායික හා මානසික සෞඛ්‍ය පිළිබඳ සැලකිලිමත් වෙමින් විවේකය ඵලදායී ලෙස ගත කරයි.

දේශාභිමානයෙන් යුතුව ශාසනික උරුමය සහ බෞද්ධ සංස්කෘතික දායාද ආරක්ෂා කර ගැනීමට ක්‍රියා කරයි.

බෞද්ධ නිර්ණායක අනුව කළ යුතු හා නොකළ යුතු දේ ඇඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.


බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය හැඳිනගෙන ඊට අනුගත වෙයි.

බෞද්ධ සිරිත් විරිත් වත් පිළිවෙත් හා පරිසරය හැඳිනගෙන ඊට අනුරූපී ව ක්‍රියා කරයි.

පාලි භාෂා කුසලතාව සහ අභිධර්මය පිළිබඳ මූලික දැනුම ඇති කර ගැනීමට ක්‍රියා කරයි.

මෙම නිපුණතා පදනම් කර ගනිමින් අධ්‍යයන කටයුතුවල නිරතවන ළමයා සමාජ හා පරිසර හිතකාමී අයකු වශයෙන් සමාජගත වේ. එය වර්තමාන සමාජයට අතිශයින් වැදගත් වේ. මේ අනුව දහම් අධ්‍යාපනය ලබන ළමයාගේ දැනුම, ආකල්ප, නිපුණතා සංවර්ධනය වී යහපත් පුරුදුවලින් හෙබි යහපත් සමාජයක් ගොඩ නඟා ගැනීම සදහා ඔහු මැදිහත්කරුවකු වන බව තරයේ විශ්වාස කරමි..

එමෙන්ම දහම් පාසල් අධ්‍යාපනය නැංවීම වෙනුවෙන් ඇප කැප වී කටයුතු කරන දහම් පාසල් ආචාර්යවරුන්ට මෙන් ම ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරී හිමිවරුන්, සභාපති හිමිවරුන් හා නිස්සරණාධ්‍යාශයෙන් කටයුතු කරනු ලබන අනෙකුත් සියලු දෙනාට සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලයේ ප්‍රණාමය ද හිමි වේ.



## නික්මයෑම

උලලේනිය හැඬු මහ රෑ යාමේ
වන ඇතුගේ පා පහරින් දිවි පිදු
අපෙ අප්පොච්චී සිහිවන විටදී
කඳුළින් තෙත් වේ මගේ කසාවත

පුතේ කසාවත කොයිදැයි කියලා
අහන්න එපා මගෙ පින්බර අම්මේ

තුන් තිස් පැය නිදි වැරුවත් අඳුරේ
අලි වැට බිඳ අලි මිදුලට එනවා
හුළු අතු දල්වා උන් එළවන්නට
වෛර දැරුව ද එය ඵල නැත අම්මේ

බවුන් වඩන්නට බැහැ සිත එකඟව
බුදු හිමි පාමුල තබා කසාවත
නා සමිඳුගෙ පා වැඳ අවසර ගෙන
ගෙදර බුදුන් රැකුමට මා එනවා

**ආචාර්ය රත්නපාල වික්‍රමසිංහ**



# සරල පැවතුම් සහිත ආර්ථික රටාවකට හුරුවීම වැදගත්

උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ

**මහා විහාර වංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ දක්ෂිණ ලංකාවේ ද්විතීය අධිකරණ සංඝනායක සද්ධර්ම කීර්ති ශ්‍රී සුමංගල බේමානන්ද ශාස්ත්‍රපති**

## හෑගොඩ අස්සජි නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.




**ප්‍රියසම්භාවනීය විශිෂ්ට සේවාවක නියුතු ධර්ම විනයධර බහුශ්‍රැත භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් ප්‍රකට ඔබ වහන්සේ කුඩා අවධියේ ගුරු හාමුදුරුවරුන්ගේ ආශ්‍රය නිශ්‍රය ලබපු ආකාරය ප්‍රකාශ කරමින් සාකච්ඡාව ආරම්භ කරමු නායක හාමුදුරුවනේ,**

1958 වර්ෂයේ ජුලි මස 28 වැනිදා ගාල්ල දිස්ත්‍රික්කයේ හෑගොඩ නමින් හඳුන්වන බොහොම රමණීය ගැමි පරිසරයක තමයි මගේ ජන්මෝත්පත්තිය සිදු වුණේ. මගේ පියාගේ පියා විලියම් චාර්ලිස් අප්පුහාමි ශ්‍රද්ධාවන්ත උපාසක මත්මයෙක් නිසාම මා පැවිදි වෙනවා දැකීමට බොහොම ආසාවෙන් සිටියා. ඒ වගේම සංසාරගත පුණ්‍ය ශක්තියක් නිසාදෝ පුංචි කාලයේ සිටම මටත් පැවිදි වීමට විශාල ආසාවක් තිබුණා.

ඒ අනුව නානායක්කාරවසම් ලොකු වෙල්ලාලගොඩගේ මානිස් අප්පුහාමි මහෝපාසකතුමා අමුගොඩ රුහුණගේ පිනදරහාමි මහෝපාසිකා මාතාව යන සද්ගුණවත් ශ්‍රද්ධා බුද්ධිසම්පන්න මව්පිය දෙපළගේ ආශිර්වාදය ඇතිව අපවත් වී වදාළ කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේ උප ප්‍රධානාචාර්ය පුංචි බොරැල්ල බෞද්ධ මධ්‍යස්ථානාධිපති දෛවී වාග් විශාරද කීර්ති ශ්‍රී සුමංගල රාජකීය පණ්ඩිත හෑගොඩ ධම්මින්ද්‍රාභිධාන කොළඹ නවකෝරළයේ ප්‍රධාන අධිකරණ සංඝනායක ස්වාමින් වහන්සේ, කොළඹ මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේ උප ප්‍රධානාචාර්ය හෑගොඩ නිග්‍රෝධාරාමය, ගිංතොට සෝමාරාමය, යන උභය විහාරාධිපති රත්මලාන ධර්ම පර්යේෂණාලයේ අධ්‍යක්ෂ ථේරවාද දර්ශන විශාරද රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හෑගොඩ බේමානන්දාභිධාන බස්නාහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක ස්වාමීන් වහන්සේ, අම්පාර දිගාමඩුල්ල ශ්‍රී විද්‍යානන්ද පරිවේණාධ්‍යක්ෂ මහාවාපී මහා විහාරය, ලාහුගල නීලගිරි රාජමහා විහාරය ඇතුළු විහාරගණයේ අධිපති සද්ධර්මවාගීෂ්වර ශ්‍රී සුමනතිස්ස හෑගොඩ ඉන්ද්‍රසාරාභිධාන නැගෙනහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝ නායක ස්වාමින් වහන්සේ වැනි සාර්වභෞම ගරු සම්භාවිත ආචාර්යපාදෝත්තමයාණන් වහන්සේගේ ආචාර්යත් වයෙන් ඉඳුරුව කටුකොළිහේ සද්ධර්මෝදය විශ්ව විද්‍යාල පිරිවෙන් ප්‍රධානාචාර්ය ගෞරව ශාස්ත්‍රවේදී රාජකීය පණ්ඩිත සද්ධර්මවාගීශ්වර විනයාචාර්ය ශ්‍රී ඥානවිමල ගල්බඩ නන්දාරාමාභිධාන ගාලු පළාතේ ද්විතීය සංඝ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් 1975 වර්ෂයේ ජනවාරි මස 27 වැනි දින හෑගොඩ ශ්‍රී නිග්‍රෝධාරාම පුරාණ විහාරස්ථානයේ දී උත්තරීතර පැවිදි ජීවිතයට එළඹුණා.

අනතුරුව ඉඳුරුව කටුකොළිහ සද්ධර්මෝදය පිරිවෙන, කොළඹ මාළිගාකන්ද විද්‍යෝදය මහා පිරිවෙන, ගාල්ල ශ්‍රී පුඤ්ඤසාර මහ පිරිවෙන, නුගේගොඩ ශ්‍රී සුභද්‍රාරාම මහ පිරිවෙන යන සසුන්කෙත බැබළවූ දීප්තිමත් පරිවේණාස්ථානයන්හි වැඩ සිටි ධර්ම විනයධර ශ්‍රද්ධා සම්පන්න ආදර්ශවත් සුපේශල ශික්ෂාකාමී ශාස්ත්‍රඥයන් වහන්සේගේ මඟපෙන්වීමෙන් ශාසනානුලෝමී හැඟීමෙන් ධර්ම ශාස්ත්‍රෝන්නතිකාමිත්වයෙන් යුතුව ශාස්ත්‍රීය ශික්ෂණය ලබා ගැනීමට තරම් පුණ්‍ය ශක්තිය බලවත් වුණා. ඒ වගේම හෑගොඩ බේමානන්ද නාහිමි, හෑගොඩ ධම්මින්ද නාහිමි, හෑගොඩ ඉන්ද්‍රසාර නාහිමි වැනි ලංකා ශාසනාම්බරය ආලෝකවත් කළ නිවැරැදි ශාසනික ප්‍රතිපදාව අනුගමනය කරමින් සුපේශල ශික්ෂාකාමී අර්ථ චර්යාවෙන් සම්භාවනාවට පාත්‍ර වූ ගුරුදේවෝත්තමපාදයන් වහන්සේගේ අභාසය පුණ්‍යවන්ත පැවිදි ජීවිතය සම්භාවනාවට පාත්‍ර වීමට හේතු වුණ බවත් කෘතවේදීව සිහිපත් කළ යුතුයි. නිසි වයස් සම්පූර්ණ වීමත් සමඟ පූර්වෝකෘත පුණ්‍ය මහිමයට අනුව 1980 වර්ෂයේ දී උතුම් අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශීලයට පත් වීමට තරම් භාග්‍යවන්ත වුණා.




උසස් පෙළ විභාග ප්‍රතිඵල අනුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඇතුළත් ව ශාස්ත්‍රවේදී උපාධිය හැදෑරුවා. අනතුරුව පාසල් ආචාර්යවරයකු වශයෙන් සේවය කළ කාලපරිච්ඡේදයේ දී ශාස්ත්‍රපති උපාධිය, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ලබා ගැනීමට කටයුතු කළා.

**පන්ති සාමාර්ථයක් සහිතව විශ්වවිද්‍යාල උපාධිය දිනා, වියත් භික්ෂුවක් වශයෙන් ස්වකීය විහාරස්ථාන කේන්ද්‍රකොට සාමාජික ආගමික වශයෙන් සංවිධානාත්මක ව සිදු කරන සේවාව පැහැදිලි කරන්න අපේ හාමුදුරුවනේ.**

මම විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමටත් පෙර වයස අවුරුදු 18දී විතර විහාරස්ථානය ප්‍රතිසංස්කරණ කරමින් 300ක් 400ක් පමණ දරුවන් දහම් අධ්‍යාපනය ලබන දහම් පාසලට ප්‍රධානාචාර්ය වශයෙන් ප්‍රදේශයට සුචරිතවත් දරු පරපුරක් දායාද කිරීම ආරම්භ කළා. 1975 වර්ෂයේ සිට වසර 45ක් පුරා ප්‍රධානාචාර්යවරයා වශයෙන් කළ සේවය 1988 වර්ෂයේ සිට දහම් පාසල් ගුරු උපදේශකවරයකු වශයෙන් සුචරිතවත් සමාජයක් වෙනුවෙන් තවදුරටත් පුළුල් කළා.

අනතුරුව මූලික අධ්‍යාපනය ලැබූ ශාරිපුත්ත විද්‍යාලයේ ආචාර්යවරයකු වශයෙන් ගුරු සේවය ආරම්භ කරමින් විජයබා විද්‍යාලය, එගොඩ උයන සුනන්දෝපනන්ද විද්‍යාලය, කොළඹ 10 අශෝක විද්‍යාලය, ගාල්ල ගිංතොට මහා විද්‍යාලය ආදී පාසල්වල ආචාර්යවරයකු වශයෙන් දරුවන් වෙනුවෙන් අධ්‍යාපනය ලබා දෙමින් 2010 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සහකාර, නියෝජ්‍ය, විදුහල්පති ධූර දක්වා වගකීම් දරමින් දැයේ දරු පරපුර වෙනුවෙන් මහත් සේවයක් ඉටු කළා.

ඒ වගේම ගමේ සැදැහැවතුන්ගේ ආධාර උපකාර ලබා ගෙන අසූමහා ශ්‍රාවක චිත්ත සමාධි කංචුක චෛත්‍ය, සතර දේවාල, ලැගුම්ගෙය, නව විහාර මන්දිරය, දාන ශාලාව, බෝධිප්‍රාකාරය, විදුලිය හා ජල පහසුකම් ඇතුළුව හෑගොඩ නිග්‍රෝධාරාම විහාරස්ථානය සියලු විහාරාංගයන්ගෙන් සමලංකෘත දර්ශනීය විහාරස්ථානයක් බවට පත් කළා.

2013 වර්ෂයේ දී නැණසල පරිගණක මධ්‍යස්ථානය පිහිටුවීමටත්, නිග්‍රෝධාරාම මාවත කාපට් කිරීමටත් මූලිකව ක්‍රියා කළා. මහා හෑගොඩ නිග්‍රෝධාරාම පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති, අම්පාර ශ්‍රී සම්බුද්ධාලෝක විහාරයේ විහාරාධිපති, ගාල්ල ගිංතොට ශ්‍රී සෝමාරාම පුරාණ විහාරයේ විහාරාධිපති වශයෙන් විශාල ශාසනික කාර්යභාරයක් ඉටු කරනවා. 2014 වර්ෂයේ සිට හික්කඩුව දකුණු ශාසනාරක්ෂක මණ්ඩලයේ ගරු සභාපති වශයෙන් විශාල සමාජ මෙහෙවරක් සිදු කරගෙන යනවා.

ඉන්දියාව, තායිලන්තය, බුරුමය, ඩුබායි ආදී රටවල ධර්මදූත සේවාවක නියැළෙමින්.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය හා අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කළ සේවය ඇගයීමට ලක් කරමින් ස්‍යාමෝපාලි වංශික මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහා නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන සානුනායක කාරක මහා සංඝ සභාව වෙතින් සද්ධර්මකීර්ති ශ්‍රී සුමංගල බේමානන්ද ගෞරව නාමය සහිතව දක්ෂිණ ලංකාවේ ද්විතීය අධිකරණ සංඝනායක පදවියෙන් සම්භාවනාවට පාත්‍ර වුණා.

**ජාතික, ආගමික, සාමාජික වශයෙන් පැන නඟින ගැටලු පිළිබඳ ප්‍රබුද්ධ ලෙස බලන නායක ස්වාමින් වහන්සේ නමක් වශයෙන් ඒවා නිරාකරණය කිරීමෙහිලා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රවේශයකින් සාකච්ඡාව අවසන් කරමු නායක හාමුදුරුවනේ,**

අපි කෙතරම් ධර්ම දේශනා කළත්, බෞද්ධ ප්‍රතිපත්ති ප්‍රායෝගිකව පවුල් සංස්ථාව තුළ ගොඩනැඟී නැති නිසා අද සමාජය ගුණධර්මවලින් පිරිහීමට පත් වෙලා තිබෙනවා. වැඩිහිටියන් දරුවන්ට නිවැරැදි ආදර්ශ සපයමින් ළමා පරපුර ගුණවත් කිරීමට පුළුවන් තරම් උත්සාහ ගන්න අවශ්‍යයි. ප්‍රතිපත්ති ගරුක, විනයගරුක සාරධර්ම හොඳින් අනුගමනය කිරීමෙන් තමයි සමාජය යහපත් තැනකට ගන්න හැකියාව ලැබෙන්නේ. ඒ නිසා ආදර්ශවත් බව ඉතාම වැදගත්. බෞද්ධ ප්‍රතිපත්තිවල තිබෙන අල්පේච්ඡතාව, සුභරතාව ය, සැහැල්ලු ගති පැවතුම් යන ලක්ෂණ සමාජය තුළ ගොඩනැඟී නැති නිසා පුහු මානයෙන් කටයුතු කරනවා. එය ආර්ථික ම ය වශයෙන් බිඳ වැටීමට හේතුවක්. ඇති හැකි සෑම අවස්ථාවක දී ම සරල පැවතුම් සහිත ආර්ථික රටාවකට හුරු වීම වැදගත්.

ජීවන ගමනේ 65 වැනි වියට පා තැබූ නාහිම්පාණන් වහන්සේට තුනුරුවන්ගේ අනන්ත ගුණ බලයෙන් නිදුක් නීරෝගි චිරජීවනය ලැබේවා.

හේමමාලා රන්දුනු

## විනයධර ධර්මධර සංඝ පීතෘවර

# බලල්ලේ ශ්‍රී පඤ්ඤාලෝක නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ



වලස්සෑගල පුරාණ රාජමහා විහාරය, ගලයාය පුරාණ විහාරය, මහව ජයසුමනගම ශ්‍රී ඉන්ද්‍රසුමන පිරිවෙන් විහාරය, කිරිමැටියාව ඇඹුල්ගිරි රාජමහා විහාරය, ගල්ලෑව ශ්‍රී විසුද්ධාරාමය යන පංච මහා විහාරයන්හි අධිපති, වන්නි දෙමළ හත්පත්තු දෙකේ සංඝ නායක අතිගෞරවාර්හ විනය කීර්ති ශ්‍රී බලල්ලේ පඤ්ඤාලෝක නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ජූලි මස 11 වෙනි දින අපවත් වී වදාළහ.

බලල්ලේ පඤ්ඤාලෝක නායක නාහිමිපාණන් වහන්සේ මෙරට වැඩ විසූ විනයධර, ධර්මධර සංඝ පීතෘවරයෙකි. උන්වහන්සේ කළ ශාසනික මෙහෙවර අතිමහත් ය. බුද්ධ ශ්‍රාවකයකු වශයෙන් ශාසනයට ඉටුකළ සේවාව වචනයෙන් කිව නොහැකි තරම් ඉතා විශාල ය.

ශීලයෙන්, ගුණයෙන් පිරිපුන් උන්වහන්සේගේ චරිතය වර්තමාන සංඝ සමාජයට ද ආදර්ශයක් වන්නේ ය. සංඝයා වනාහි මුළු මහත් සංඝ සමාජයට ම පොදු වූ වස්තුවක් බැවින් උන්වහන්සේ පිළිබඳ කෘතගුණ දැක්වීම අප කාගේත් යුතුකමක් කොට සලකමි.

1945 අගෝස්තු 25 වැනි දින සසුන් කෙතට ඇතුළත් වූ උන්වහන්සේ පුංචි සමයේ පටන් ම මනා චරිතයකින් හෙබි කුඩා සාමණේර නමක් බවට පත් වූහ. භික්ෂුවක් සතු විනය ගරුක බව, සිල්වත් බව, නැණවත් බව මනාව ගොනුකර ගත් උන්වහන්සේ විෂයානුබද්ධ කරුණු ඔස්සේ අධ්‍යාපනය ද මනාව හැදෑරී ය.

රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙනෙන් මූලික අධ්‍යාපනය ලබා කුරුණෑගල මලියදේව පිරිවෙනෙන් උසස් අධ්‍යාපනය ලැබූ උන්වහන්සේ 1949 ජූලි මස 05 වන දින අධිශීල ශික්ෂා සංඛ්‍යාත උතුම් උපසම්පදා භූමයට පත්විය.

විහාරස්ථාන පහක විහාරාධිපතිත්වය දරමින් යාපහුව පුරවරය ඇතුළු දුර ඈත ගම් දනව් සිසාරා සැදැහැවතුන්ගේ දහම් පවස නිවාලනු වස් කළ මහඟු සේවාව පුණ්‍යානුමෝදනාවෙන් යුක්තව සිහිපත් කිරීමට කැමැත්තෙමි. තම සුපිරිසුදු පැවිදි ජීවිතයේ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ තිහකට ආසන්න සංඛ්‍යාවක් බිහි කොට බුද්ධ ශාසනයේ චිර පැවැත්ම උදෙසා කළ මහඟු සේවාව ඉතා අගනේ ය.

උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය රත්නය වන්නේ මහව උඩගම ශ්‍රී ඉන්ද්‍රසුමන පිරිවෙන් විහාරස්ථානයේ කෘත්‍යාධිකාරී එම විහාරස්ථාන පහේම වර්තමාන විහාරාධිපති රැකෝගම සිරිනිවාස නායක හිමිපාණන් වහන්සේ යි.

අපවත් වී වදාළ නා හිමියන්ගේ ශිෂ්‍යයින් අතර ඉපළෝගම විජිතවංශ හිමි වැඩ බලන කෘත්‍යාධිකාරී වශයෙන් ද, රැකෝගම සන්තින්ද්‍රිය හිමි පරිවේණාධිපති වශයෙන් ද, වර්තමාන විහාරාධිපති නා හිමියන්ට මහඟු අත්වැලක් සපයන්නේ ය.

රටට, ජාතියට, ආගමට හා සසුන් කෙතට ඉමහත් සේවාවක් කිරීමට හැකි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ රාශියක් දායාද කළ උන්වහන්සේ නිහතමානී ගුණයෙන් හා සැහැල්ලු දිවි පැවැත්මෙන් හෙබි සුපේෂල ශික්ෂාකාමී සංඝ පීතෘවරයෙකි.

විවිධ දක්ෂතාවන්ගෙන් පිරිපුන් චරිතයකින් හෙබි බලල්ලේ පඤ්ඤාලෝක නා හිමි සමාජමය වශයෙන් සිදු කළ සේවාව ඉතා විශාල ය. සතවර්ෂයකට ආසන්න කාලයක් ආයු වළඳා 2022 ජූලි මස 11 වැනි දින අපවත් වී වදාළ නා හිමිපාණන් වහන්සේ රූප කායෙන් අප අතරින් වෙන් වී ගිය ද, උන් වහන්සේගේ ගුණ සුවඳ සැමදා අප අතර පවතින්නාහ.

අපවත් වී වදාළ බලල්ලේ පඤ්ඤාලෝකාභිධාන නාහිමියන්ට අජරාමර නිවන් සුව හිමි වේවා'යි ප්‍රාර්ථනා කර සිටිමි.

---

මහව,උඩගම ශ්‍රී ඉන්ද්‍රසුමන මහ පිරිවෙන්හි
ප්‍රවීණාචාර්ය , ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛන ශාස්ත්‍රී
**ගලගෙදර රතනවංස හිමි**

# සසුනට ආලෝකයක් වූ

# මාදෝවිට පඤ්ඤාකිත්ති නාහිමියෝ

**හෝමාගම පුරාණ විහාරාධිපතිව හා සීනාදී සිවු කෝරළයේ ප්‍රධාන සංඝ නායක ධුරය හෙබවූ ගෞරවාර්හ මාදෝවිට පඤ්ඤාකිත්ති නාහිමියෝ අපවත් වී පසුගිය ජූලි මස 22 වන දිනට සිවු වසරකි. මෙම ලිපිය උන්වහන්සේට උපහාරයක් වශයෙන් පළ වේ.**



මීට සිවු වසරකට පෙර අපවත් වී වදාළ හෝමාගම පුරාණ මහා විහාරාධිපති ගෞරවාර්හ මාදෝවිට පඤ්ඤාකිත්ති නායක මාහිමියන් වහන්සේ විහාරාධිපතීන් වහන්සේ නමක් වශයෙන්,පිරිවෙන් හා පාසල් ආචාර්යවරයකු වශයෙන්,සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු වශයෙන්, ශාසනාරක්ෂක මණ්ඩල සභාපතිවරයකු,ලේඛකාධිකාරීන් වහන්සේ නමක වශයෙන්,නායක ස්වාමින්ද්‍රයන් වහන්සේ නමක වශයෙන්,හෝමාගම පුරවරය කේන්ද්‍ර කොට ගනිමින් සම්බුද්ධ ශාසනයේ චිර පැවැත්මට සිදු කළ මහඟු මෙහෙවර සුළුපටු නොවේ.

1941 මැයි මස 10 වැනි දින බදුල්ල දිස්ත්‍රික්කයට අයත් මාදෝවිට නම් සුන්දර ග්‍රාමවරයෙහි විසූ නවරත්න මුදියන්සේලාගේ කිරිබණ්ඩා හා නවරත්න මුදියන්සේලාගේ බණ්ඩාරමැණිකේ යන පින්වත් දෙමාපියන්ගේ පස් දෙනෙකුගෙන් යුත් පවුලේ කනිටු දරුවා ලෙස උපන් උන්වහන්සේ කලබුලුලන්ද මහා විද්‍යාලයෙන් ගිහි පාසල් අධ්‍යාපනය හදාරා සසුන් කෙත අස්වැද්දීමේ පුරාකෘත පින් මහිමය දායාද කොට උපත ලැබූ හෙයින් ම 1952 දී බිබිලිගමුවේ ගුණරතන ස්වාමින්ද්‍රයන් වහන්සේගේ හා මාදෝවිට පේමානන්ද ස්වාමින්ද්‍රයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් මාදෝවිට ශ්‍රී විජයාරාමයේදී පැවිදි දිවියට එළඹෙන්නේ මාදෝවිට පඤ්ඤාකිත්ති යන ශාසනික නාමයෙනි.

දියතලාව සුධර්මාලංකාර විද්‍යායතන පිරිවෙනින් මූලික පැවිදි අධ්‍යාපන කටයුතු ආරම්භ කළ උන්වහන්සේ පෑලියගොඩ විද්‍යාලංකාර මහා පිරිවෙනින් උසස් අධ්‍යාපනය ලබා 1964 වර්ෂයේ දී විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයට (වත්මන් කැලණිය විශ්වවිද්‍යාලය) ඇතුළත්ව ශාස්ත්‍රවේදී උපාධිය ද සමත් වූහ.

මාගම්මන සීලවිමල,මාගම්මන සීලාලංකාර, පිටිපන ඤාණිස්සර යන නායක ස්වාමින්ද්‍රයන් වහන්සේලාගේ ආචාර්යත්වයෙන් උන්වහන්සේලා අයත් කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රිධර්ම මහා සංඝ සභාවේ කෝට්ටේ රාජමහා විහාරස්ථ සිරි මංගල උපෝසථාගාරයේ දී උන්වහන්සේගේ උපසම්පදාව සිදුවිය. පැවිදි ආචාර්යයන් වහන්සේලාගේ පූර්ණ ආශිර්වාදය හා ආචාර්යත්වය ද ඇතිව එම උපසම්පදා පින්කම 1968 වර්ෂයේදී පැවති අතර අප කථානායකයන් වහන්සේගේ දිවි ගමනේ නව පරිච්ඡේදයක් පෙරළීමට එය සමත් වූහ.

අනතුරුව කුඩා පොල් අතු කුටියක් පමණක් පැවැති, බිත්තිවල කුඹුර පන්සල හෙවත් හෝමාගම පුරාණ විහාරයට වැඩම කළ උන්වහන්සේ ස්වකීය වාසස්ථානය වශයෙන් එහි වැඩ සිටිමින් අපවත් වන තුරු සුවිශාල මෙහෙවරක් ශාසනික, අධ්‍යාපනික, ජාතික හා සංස්කෘතික වශයෙන් ඉටු කළහ.

එදා පොල් අතු මඩුවක් පමණක් පැවති හෝමාගම පුරාණ විහාරය උන්වහන්සේ අපවත් වන විට පැවති අකාරය අධ්‍යයනය කිරීමෙන් පමණක් වුවත් උන්වහන්සේ ශාසනය වෙනුවෙන් ඉටු කළ මෙහෙවර කියා පායි.

පැවිද්දන් සිය දිවියෙන් වැඩි කොටසක් මිඩංගු කරමින් දර්ශනීය හා සුව පහසුකම් සහිත විහාරස්ථාන ගොඩනඟන්නේ තමන් වෙනුවෙන් නොවේ. සිය ලේ ඥාති පරපුර වෙනුවෙන් නොවේ.අනාගත සම්බුද්ධ ශාසනය භාර ගැනීමට සසුන්ගත වන පැවිද්දන් වෙනුවෙනි.

සතර පේරුවේ දායක දායිකාවන් වෙනුවෙනි.සමස්ත බෞද්ධ ලෝකයාම වෙනුවෙනි.

එදා මහත් දුක් ගැහැට විඳිමින් උන්වහන්සේ ඉදි කළ දර්ශනීය හෝමාගම පුරාණ විහාරය අද සමස්ත බෞද්ධ ලෝකයාට ම මහත් සෙවණක් සපයන මධ්‍යස්ථානයකි.

සිය අධ්‍යාපනික මෙහෙවර හෝමාගම විද්‍යාවර්ධන පිරිවෙනින් ඇරඹූ උන්වහන්සේ අනතුරුව එහිම පරිවේණාධිපතින් වහන්සේ වශයෙන් කටයුතු කරමින් අමිල මෙහෙවරක් කළහ.

1976 වර්ෂයේ දී පාසල් ගුරු සේවයට එක් වූ උන්වහන්සේ කළුපහන මහා විද්‍යාලය,ඕපනායක විද්‍යාකර විද්‍යාලය හා හෝමාගම මහා විද්‍යාල යන විද්‍යාලයන්හි ධර්මාචාර්යයන් වහන්සේ නමක ලෙස සුවිශාල අධ්‍යාපනික මෙහෙවරක නිරත වූ අතර 1988 වර්ෂයේ සිට බුද්ධ ධර්මය ගුරු උපදේශක තනතුරකටත්, අනතුරුව විශ්‍රාම දිවියට එළඹෙන තෙක් හෝමාගම අධ්‍යාපන කලාපයේ බුද්ධධර්ම විෂය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ලෙසත් අධ්‍යාපනික ක්ෂේත්‍රයට අමිල මෙහෙවරක් ඉටු කළහ.

කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රිධර්ම මහා සංඝ සභාවට අතිශය ලැදි යතිවරයන් වහන්සේ නමක වූ උන්වහන්සේ කෝට්ටේ රාජමහා විහාර පාර්ශ්වීය සිරි මංගල සංඝ සභාවේ සම ලේඛකාධිකාරීන් වහන්සේ වශයෙන් ඉටු කළ මෙහෙවර සුළුපටු නොවේ. උන්වහන්සේ අප මහා සංඝ සභාවටත්, පොදුවේ සසුනටත් ඉටු කළ මෙහෙවරට කෝට්ටේ මහා සංඝ සභාව මගින් 1993 වර්ෂයේ දී ශ්‍රී සද්ධර්මවාගීශ්වර ගෞරව නාමයත් , 2001 වර්ෂයේ දී සිනාදී සිවු කෝරළයේ ප්‍රධාන සංඝනායක පදවියත් පිරිනැමීමෙන් අගය කළහ.

ශිෂ්‍ය පුත්‍රයන් වහන්සේ කිහිප නමක් ම සසුනට ඇතුළත් කළ අතර උන්වහන්සේලා ද සුවිශාල සේවාවන්හි නිරත වීම උන්වහන්සේට උපහාරයක් ම වන්නේ ය.

මෙසේ විශිෂ්ට මෙහෙවරක් සසුන වෙනුවෙන් ද අධ්‍යාපනය හා සමාජය වෙනුවෙන් ද ඉටු කළ අපේ ගෞරවාර්හ මාදෝවිට පඤ්ඤාකිත්ති නාහිමියෝ සසර අනිස බව පසක් කරමින් 2018 ජූලි මස 22 වැනි දින අපවත් වූහ. උන්වහන්සේට ජාත්‍යාදී දුකින් නිදහස් වූ නිවන් සුව සැලසේවා.

---

කෝට්ටේ ශ්‍රී නාග විහාරාධිපති
කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රිධර්ම මහා සංඝ සභාවේ කර්මවාගාචාර්ය කෝට්ටේ සිරි පැරකුම්බා පරිවේණාධිපති
**මහියංගණයේ පඤ්ඤානන්ද හිමි**

# The Significance Of "Vas" Observance Of The Maha Sangha



The season of Vassana or the Vas retreat is a valuable period for all the Buddhist monks, nuns, and Buddhist lay devotees all over the world to engage in religious observances spiritually. Also, they can practice religious activities to accumulate merit.

All the monks who have received the higher ordination (upasampada) are eligible to observe Vas during the three months of the rainy season from the Esala Full Moon Day to the Vap Full Moon Day every year respectively. This three-month period is referred to in Pali as 'Vassana' (retreat or rainy season), and in Sinhala as 'Vas kalaya'. According to the Buddha's advice mentioned in the Vassupanaikakkanda of the Mahavagga Pali, the monks should observe Vas in two periods, namely 'Pera Vas' and 'Pasu Vas' either on the Esala Full Moon Day or the Nikini Full Moon Day. The latter Vas observance (Pasu Vas) takes place only for the monks who have not observed Vas on the Esala Full Moon Day due to a valid reason or reasons as mentioned in the Vassupanikakkhanda.

In general, the devotees of the temples and monasteries invite the monks to observe Vas on the Esala Full Moon Day. With their invitations, the monks observe Vas on the following day of the Full Moon. According to the disciplinary rules, if the monks are not invited for the observance of Vas, still they must observe Vas alone at their residencies during the rainy reasons. At present, it takes place in both temples and monasteries with the invitation of devotees in the presence of upasaka and upasika respectively.

The Buddha always listened to the opinions of the general public and honored them. Once, king Bimbisara made a kind request from the Buddha to reside in one place during the rainy season without traveling from place to place for Dhamma propagation. After considering this, and as an honor to the king's advice, the Buddha asked his disciples to remain in one place (in a sheltered place) to observe Vas, or the Rainy season retreat. Also, he further instructed the monks to assemble twice a month in the monasteries and recite the Patimokkha (the code of discipline) on the Amavaka and the Purapasolosvaka.

Thereafter, following the king's concern the Buddha promulgated and declared a disciplinary rule for the monks "Anujanami bhikkhave vassane vassam upagantum" (O monks, I hereby both (Bhikkhu and Bhikkhuni) request you and permit you to observe Vas (retreat) during the Vassana season." However, if a monk wanted to leave his residence due to a specific reason during that period, he had special permission to go out, but he should be back to the same place without exceeding seven days or within seven days (Sattahakarana).

According to the Mahavagga Pali in the Vanya Pitaka, the great teacher, the Buddha spent his first rainy season with his first five disciples at Isipatana in Banaras, India. After that, the Buddha spent the Vas seasons in different places during his first twenty years of Enlightenment such as Rajagaha, Vesali, Mankula Hill in Kodambi, Tavatimsa Heaven, Bhesakala Forest, Kosambi, Parileyyaka Forest, Ekanala Brahmin village, Veranja, Caliya Rock, Jetavana monastery, Kapilavatthu, the city of Alavi, Rajagaha, Caliya Rock and Rajagaha. For the remaining twenty-five years of his life, he spent the rainy season retreats at Jetavana monastery and Purvaramaya. For nineteen years, the Buddha spent Vas at Jetavana monastery built by his great supporter, Anathapindika, and other six years at Purvaramaya built by Vishaka, the chief benefactress.

However, while he was spending the rainy season retreats in the above-mentioned places like kingdoms, heavens, cities, hills and rocks, monasteries, and forests a lot of people had an opportunity to listen to the Buddha's doctrines and practice meditation as well. As a result of that, some lay devotees were able to release from suffering and eradicate all defilements in the cycle of existence. On the other hand, after listening to the noble doctrines of the Buddha, some Dhamma followers attained the first, second, and third sainthood, and eventually, they became Arahant.



Senior Lecturer, Pandit,
Faculty of Humanities and
Social Sciences
University of Sri Jayewardenepura
**Dr. Ven. Dodamgoda SumanasaraThero**

There were thousands of thousands of people who were often advised by the Buddha and lived as lay devotees in practicing the teaching of the Buddha with their family members. These lay people helped to build up monasteries and offered the four-fold requisites (sivpasaya) and other necessary objects to the monks with great reverence. Besides, the lay devotes were committed to protecting the Order throughout their lives honestly with great endeavor.

Today, in many temples and monasteries of Sri Lanka and other foreign Buddhist countries; Thailand, Myanmar, Cambodia, Laos, Vietnam, and India vivid religious activities are organized by the Dhamma followers such as meditation retreats, Dhamma preaching, Dhamma discussion, observing precepts, Bodhi puja, Buddha puja, Pirith chanting, offering alms to the monks, giving necessary objects to the poor people and so on to acquire merits in this rainy season.

However, in some rainy seasons, the Buddha and his disciples encountered difficulties due to having no alms or food. Though Veranja brahmin invited the Buddha and his disciples to spend the rainy season in his village, he forgot his Vas invitation and to offer alms and other objects to the Maha Sangha. But the Buddha and his disciples spent three months there with great compassion for the betterment of the villagers in Varanja throughout the Vas season.

At the beginning of the rainy season in Kosambi a dispute arose between two groups of monks. Therefore, the Buddha left those monks and approached alone the Parileyya forest for his retirement. In the forest, the Parileyya elephant and a monkey looked after the Buddha providing alms and shelter over the three months with honor and respect.

Overall, the rainy season retreat is very useful for both the Maha Sangha and the lay Dhamma practitioners to execute their religious practices, and further, they can strengthen the mutual relationship to acquire merit through engaging in meritorious deeds every year.

# අපවත් වී වදාළ කෝට්ටේ ශ්‍රී දේවානන්ද මා හිමි සමරා පින්කම්



**වර්ෂ 1918 පින්බර දුරුතු මස පළමු වැනි දින උපත ලද පුත් කුමරු කුරුවිටගේ ප්‍රේමදස නම් විය. ප්‍රේමදස කුමරු අධ්‍යාපනය ලැබුවේ කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ ය. සිංහල භාෂාව මෙන් ම ඉංග්‍රීසි භාෂාව හොඳින් උගත් මේ ශිෂ්‍යයා ඖෂධවේදී විභාගයෙන් සමත් ව ඖෂධවේදියකු වශයෙන් ජීවිකාව ආරම්භ කළේ ය.**

අසරණ මිනිසුන්ට පිහිට වෙමින්, උගත් ගිහි – පැවිදි පඬිවරුන් සොයා ගොස් එතුමන්ලාගේ ඇසුර පැතූ මොහු බුදු දහම ගැඹුරෙන් උගෙන ගැටලු නිරාකරණය කර ගැනීමට උත්සුක විය. එපමණක් ද නොව ඒ උගත් දේ භාවිතයට ගැනීමට මෙන් ම ඒවා තම ජීවිතයට සම්බන්ධ කර ගැනීමටත් මහත් අභිරුචියක් දැක්වී ය. කෝට්ටේ රාජමහා විහාරයත්, කැලණිය රාජ මහා විහාරයත් මොහුගේ ආගමික කටයුතුවල මුලස්ථාන බවට පත් කර ගනු ලැබිණ. පෙහෙවස් සමාදන් වීම සඳහා කැලණි පන්සලට යාමට පුරුදු වී සිටි හෙතෙම තමාට ඉතා ආසන්නයේ පිහිටි කෝට්ටේ පන්සල ද පෙහෙවස් සමාදන් වීමේ කේන්ද්‍රස්ථානයක් කර ගත්තේ ය.

සිය පියාණන් වූ ජෝන් ද සිල්වා මහතා 1949 ජනවාරි මස 30 වැනි දින අනපේක්ෂිත ලෙස අභාවප්‍රාප්ත විය. පියාගේ අභාවයෙන් අවුරුදු දහයකට පසු වර්ෂ 1959 දෙසැම්බර් මස 08 වැනි දින මව මෙලොවින් සමු ගත්තා ය. මව වෙනුවෙන් තුන් මාසේ දානය කල් ඇති ව දී නිම කළ ප්‍රේමදාස තරුණයා ගිහි ගෙය හැර දමා නික්මුණේ ය.

මෙසේ නික්මුණු මහතාණෝ, අම්බලන්ගොඩ, ගල්දූවේ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක කඩවැද්දුව ජිනවංශ නා හිමිපාණන් වහන්සේගේ අනුදැනීම සහිත ව එකී යෝගාශ්‍රම සංස්ථාවේ ශිෂ්‍යයකු ලෙසින්, වර්ෂ 1960 ජනවාරි මස පළමු වැනි දින අතුරුගිරියේ බෝධි රුක්ඛාරාමයේ දී පණ්ඩිත මුල්ලේගම සිරි සීලාලංකාර අධිකරණ නායක හිමිපාණන් වහන්සේ වෙත කෝට්ටේ දේවානන්ද නමින් පැවිදි බිමට පත් වූහ.

කෝට්ටේ දේවානන්ද සාමණේරයන් වහන්සේ වර්ෂ 1961 ජූලි මස 18 වැනි දින නිමලව අරණ්‍ය සේනාසනයේ ජල සීමා මාලකයේ දී අධිශීල සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ.

ඉනික්බිතිව තම පැවිදි ජීවිතය පරිපූර්ණත්වයට පත් කර ගැනීමේ පරමාධ්‍යාශයෙන් ඊට සුදුසු ස්ථානයක් සොයනුයේ කිරින්දේ පුහුල්වැල්ල ශ්‍රී රෝහණ ආරණ්‍ය සේනාසනය ගෝචර භූමියක් සේ සලකමින් එකී කාර්යය ඉටු කර ගැනීම වස් කලබලකාරී නාගරික පරිසරයෙන් බැහැර ව එහි වැඩම කළ හ. මේ කාලය වෙන විට කොළඹ ජර්මන් ධර්මදූත සංගමයේ පාලක මණ්ඩලය බෞද්ධාලෝක මාවතේ ජර්මන් ධර්මදූත මූලස්ථානය භාරගෙන කටයුතු කිරීම සඳහා යෝග්‍ය යතිවරයකු ලබා දෙන ලෙස කඩවැද්දුව ශ්‍රී ජිනවංශ නා හිමිපාණන් වහන්සේගෙන් ඉල්ලීමක් කළේය. තමන් වහන්සේගේ ශිෂ්‍ය රත්නයක් වූ කෝට්ටේ දේවානන්ද ස්වාමීන් වහන්සේ ජිනවංශ නා හිමිපාණන් වහන්සේගේ තෝරා ගැනීම විය. සසර දුක් කෙටි කර ගැනීම සඳහා නගරයෙන් බැහැර වනවාසී ජීවිතයට ඇලුම් කළ දේවානන්ද හිමියන්ට සිය ගුරුවරයාණන් වහන්සේගේ මේ ඇරයුම අභියෝගයක් විය. තමන් වහන්සේ ගරු කරන ගුරු දේවයාණන් වහන්සේගේ මේ ඉල්ලීම පැහැර හැරිය නොහැක්කක් බැවින් 1964 මාර්තු මාසයේ දී පුහුල්වැල්ලෙන් කොළඹට වැඩම කොට ජර්මන් ධර්මදූත ආශ්‍රමයේ කටයුතු භාරගත් සේක.

කොළඹ විජේරාම මාවතේ විපස්සනා භාවනා මධ්‍යස්ථානයේ අධිපතිව වැඩ විසූ මිරිස්සේ ගුණසිරි මාහිමිපාණන් වහන්සේ හදිසියේ අපවත් වූ නිසා, ඊට සුදුසු තෙර නමක් සොයා දෙන ලෙස කඩවැද්දුව ජිනවංශ මාහිමිපාණන් වහන්සේට යළිදු ආරාධනාවක් ලැබිණ. මේ සඳහා ද උන්වහන්සේගේ තේරීම වූයේ තම ශිෂ්‍ය රත්නයක් වූ කෝට්ටේ දේවානන්ද හිමිපාණන් වහන්සේ ම ය. අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම පීඨයේ අධිපතිව වැඩ විසූ ඉඳුරුවේ උත්තරානන්ද හිමිපාණන් වහන්සේ විසින් භාවනා උගැන්වීමේ ආචාර්ය ධූරයක් සඳහා ද උන්වහන්සේ තෝරා ගන්නා ලදී. වැටුප් ලැබීම ප්‍රතික්ෂේප කළ උන්වහන්සේ ඒ තනතුරු අතහැර දැමූ සේක. මේ සියලු තනතුරුවලට වඩා උන්වහන්සේ ගරු කළේ "භික්ෂුත්වය " නමැති තනතුරට ය.

රැකීමට ඇත්තේ භික්ෂුත්වය පමණක් බවත් පරිහරණයට ඇත්තේ පාත්‍රා සිවුරු සහ තල්පත පමණක් බවත් උන්වහන්සේගේ දර්ශනය විය.

අපගේ ගුරු දේවයාණන් වහන්සේ වෙනුවෙන් මේ දක්වා අංක 417, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ශ්‍රී කල්‍යාණ ධර්ම ආශ්‍රමයේ අනුශාසක මිරිහානේ නන්ද මාහිමි ප්‍රධාන විහාරවාසී භික්ෂූන් වහන්සේගේ මූලිකත්වයෙන් සැදැහැබර දායක පින්වතුන්ගේ දායකත්වයෙන් අපවත් වී වසර 31 ක් අඛණ්ඩව ගුණානුස්මෘති පින්කම් ඉතා උසස් ලෙස කර පුණ්‍යානුමෝදාන කර ඇත. 32 වන ගුණානුස්මෘති පුණ්‍යානුමෝදනාව මේ මස 14 වැනි දින සිදුවේ. මෙම ගුණ සමරු පින්කමෙන් ජනිත සකල පුණ්‍ය ශක්තිය අපගේ ගුරුදේව කෝට්ටේ දේවානන්ද මාහිමිපාණන් වහන්සේට ලැබේවායි අපි සියලු දෙනාම ප්‍රාර්ථනා කර සිටිමු.

# ලාංකේය බෞද්ධ පෙරහරට අභිමානයක් ගෙන දුන් මිල්ලන්ගොඩ ඇත් පරපුර

**අල්ලා අලි බබෙක් පුත්තලමේ කැළෙනි**
**කොල්ලා ලෙස හැදූ බව අප හට ඇසුණී**
**දිග දළ දෙකක් විත් අලියා ඇතෙක් වුනි**
**මිල්ලන්ගොඩ ඇතු රටට රන් තිළිණයක් වැනි**

සතර කෝරළයේ කෑගලු දිසාවේ මොළගොඩ ප්‍රදේශාසන්නයේ මිල්ලන්ගොඩ වලව්ව ප්‍රසිද්ධ වන්නේ ඇත් පරපුර නිසාවෙනි. එය ඉතා දීර්ඝ කතාන්දරයකි.

මිල්ලන්ගොඩ ඇත් පරපුරේ ආරම්භය ඇසිය යුතුම කතාවකි. 1943වසර වන විට මිල්ලන්ගොඩ ලොකු මහත්තයා තම පියාගෙන් ලද අනුහුරුව මත අලි ඇතුන් ඇල්ලීමෙහි නිපුණයකු වූයේ ඉතා ඉක්මනිනි.

හම්බන්තොට , අගුණකොළපැළැස්ස , බූන්දල දකුණු කොනේ ගහ කොළ සතා සීපාවා පවා කතා කළ හැකි නම් අඳුරන බව කියනු ඇතැයි සිතෙන තරමට ඔහු සොබාදහමට ළං වූවකු විය. එම ප්‍රදේශවලදී ද ඔහු අලි ඇල්ලීම පිළිබඳ පුහුණුවක් ලබා තිබේ. 1945 වසරේ දී ඉතා හුරුබුහුටි අලි පැටවකු හමු වී ඇත. හේ ඔහුට තුන් හතර මසක පොඩ්ඩෙකි. පෙනුමෙන් හුරුබුහුටි දඟයකු වූ මොහු මිල්ලන්ගොඩ පරපුරේ සිත් ආදරයෙන් තමා වෙත ළං කරගෙන තිබිණි. මොහු හැදී වැඩුණේ පවුලේ සුරතලා ලෙස ය.

කිතුල් අතු, ටොෆි ඔහුට පෙන්නන්නට බැරිය. පවුලේ ආදරය දිනා මෙහි හැදී වැඩුණ මෙම අලි පැටවා ගණන්කාර ඇත් රජකු බවට පත් වීමේ ලකුණු පහළ වුණි.

අලියකු ලෙස ගෙනා මොහු ඇත් රජකු වීමේ ආඩම්බරය මිල්ලන්ගොඩ පරපුරේ සියල්ලන්ට ම දැනෙමින් තිබිණි. එමෙන්ම මොහු ලොකුරාජා ලෙස නම් ලැබීය. ලොකුරාජා තේජස් පෙනුමක් ඇති හස්ති රාජයෙකි. ගමන ද ආකර්ෂණීයය. කල් යත්ම මොහු සතර දේවාල පෙරහරෙහි දේවාභරණ වැඩමවීමට වාසනාවන්ත විය.

ඉන් අනතුරුව මෙම රාජකීය හස්ති රාජ තෙමේ සධාතුක කරඬුව වැඩමවන හස්ති රාජයා බවට ද පත්විය. දිගින් අඩි 7 යි අඟල් 6 ක් වූ මනරම් දළ යුවළ ආසියාවේ දළ දිගම හස්ති රාජයා බවට අභිෂේක ගැන්වීය.

ගජසෙන් පරපුරේ අති දුර්ලභ වන්දනීය අවස්ථාවට හිමිකම් කියමින් ලාංකේය බෞද්ධ සංස්කෘතික ඉතිහාසයේ පරිච්ඡේද ගණනාවක් උසුලාගෙන විත් අනාගතයට බාර දී හේ යන්නට ගියේ ය. ඒ අවුරුදු 40 ක් පමණ කල් දළදා පෙරහරට බුහුමන් කිරීමෙන් අනතුරුව ය.

ලොකුරාජාගේ පාංශුකූල කටයුතු සඳහා භික්ෂූන් වහන්සේ 81 නමක් සහභාගී වූ අතර, එවක ජනාධිපති තුමන් ද පැමිණ බුහුමන් දක්වා තිබේ. ලොකු රාජා පිළිබඳ ආවර්ජනය කරන ආනන්ද මිල්ලන්ගොඩ මහතා

" මේ සත්ත්වයා ළඟ පුදුම තේජසක් තිබුණෙ. දකිනකොට බලන් ඉන්න ආස හිතෙන ගමනක් තිබුණා. පෙරහරේ ගියේ හරි කැමැත්තෙන්. පෙරහරේ යන වෙලාවටත් පැණිරස දෙන්න ඕන. හරියට අපේ දරුවෙක් වගේ. එයාගෙ අනුරුවක් වලව්ව ඉස්සරහ හදල තියෙනවා'යි පැවසුවේ ..."

ආඩම්බරයකිනි. මෙම පරපුරේ ඊළඟ අයිතිය හිමි කරගත්තේ ජයන්ති ඇතුය. පොඩිරාජා ලෙසද නම් ලැබූ මේ ඇතු ද ශාන්ත දාන්තය. ආඩම්බරය. හේ පින්වන්ත හස්ති රාජයකු බව ද ආනන්ද මිල්ලන්ගොඩ මහතා පැහැදිලි කළේ ය. සෙංකඩගල දළදා පෙරහරට අභිමානයක් එක් කළ ඇත් රජෙකි. මොහු ද මිල්ලන්ගොඩ ඇත් පරපුර තේජමාන කරන්නට සමත් විය.

පානබොක්කේ ඇතා ද මෙම ඇත් පරපුරේ වෙසෙස් පුරුකකි.

හෙළ සංස්කෘතියට අභිමානයක් එක්කරමින් මෙසේ නික්මී ඇත් රජවරුන්ගේ සේවය අලුත් කරවමින් මතක් කළ යුතු වටිනාකමක් ලෙස පෙන්වා දෙමි. ඇසළ පෙරහර මංගල්‍යයට සේවයෙන් කැප වුණු මෙවැනි ඇත් රජවරු රටට අභිමානයකි.

කැලණිය විශ්වවිද්‍යාලයේ
විශේෂවේදී සිව් වන වසර
(පාලි බෞද්ධ අධ්‍යනාංශය)
**කේ. ඒ ශෂී සඳලංකා ධර්මරත්න**



# ඉරණමට පිටුපා සතුට ලුහුබඳින වා ද?

**හැ**මෝගෙම ජීවිතයේ බොහෝ සැලසුම් තිබෙනවා. සැලසුම් මත පිහිටා ජීවිතය ගත කරන්නට අප පුරුදු පුහුණු වූයේ ළමා වියේ සිටම යි. කාලයත් සමඟ අපගේ සිතත් ගතත් මෝරා යද්දී ඒ සැලසුම් ඉලක්ක කරා ගෙන යන්නට අපි පුරුදු වුණා. මරණය තෙක්ම එය එසේ ම යි.

මේ මොහොතේ මිය යන සියලු දෙනා ද ජීවිත ඉලක්ක ඇතිව ඒවා අත්පත් කර ගන්නට මහත් වූ වෙහෙසක් ගත් පිරිසක්. ඒවා එසේ තිබිය දී ම ඔවුන්ට ජීවිතය අතහැර යන්නට සිදු වුණා. අපට උරුම ඊට වඩා වෙනස් ඉරණමක් නොවේ. නමුත් ඉරණම වසාගෙන සතුට ලුහුබඳිමින් අපි ජීවත් වෙනවා.

ජීවිතයේ ඇතැම් කල කළ කී දේ අපට මතක යි. සමහර දේ කොහෙත්ම මතක නැහැ. ජීවිතයේ ගෙවුණු සමහර කාල අපි දන්නවා. අප ගෙවා දැමූ, එහෙත් අපට මතක නැති ඇතැම් කාලත් අපගේ ජීවිත වටා තිබෙනවා.

## හීන ගොඩක්

අම්මාගේ කුසේ කළලයක් විදිහට අපි මෝරා ගියපු කාලයක් තිබුණා. එතකොට අපට අපේක්ෂා නැහැ. අපි ඉපදුණාට පස්සේ ඇස විවර වුණා. අපේ ඇස්වලට එබිලා අම්මා, තාත්තා ලොකු ලොකු හීන දැක්කා. ඒත් අපට ඒ කාලයේ ඒ කිසි දෙයක ඕනෑකමක් තිබුණේ ම නැහැ. මළ මුත්‍රා ගොඩේ හඬ හඬා අපි සිටියා. යන්තමට හිනා වුණා. පැත්තට පෙරළුණා. මුනින් අතට පෙරළුණා. බඩ ගෑවා. දත් ආවා. වචනය වචනය කියන්න පටන් ගත්තා. ටික ටික ලොකු වෙනකොට අපි කාටත් අපි කැමැති දේ තෝරා ගන්න සිදු වුණා. ප්‍රිය, අප්‍රිය විදිහට කෑම බීම, ඇඳුම් පැළඳුම් , සෙල්ලම් බඩු, වෙන් කර ගත්තා. කැමැත්ත වගේම අකැමැත්ත ප්‍රකාශ කරන්නට අපි පුරුදු වුණා.

## තරඟයක හැටි

අපි අකුරු ඉගෙන ගත්තා. පෙර පාසල්, පාසල් ගියා. ඔන්න අපට ඇසෙන්නට ගන්නා පන්තියේ පළමුවැනියා වෙන්න කියලා. අපි ඒ වෙනුවෙන් මහන්සි වුණා. එදා ඉඳලා මේ ජීවිතයට තිබුණේ ඉලක්ක පමණ යි. කයට, සිතට කෙතරම් වෙහෙස දැනුණත් සිහින තරගය කරා යන්න අපට තිබුණේ නොතිත් ආශාවක්. ඉලක්ක බොහෝ විට අපගේ ඉදිරියෙනුත්, තව විටෙක පිටුපසිනුත් සිට අප තල්ලු කළා. සාමාන්‍ය පෙළ, උසස් පෙළ, අපේ ජීවිතයේ කඩඉම්. පිරිසක් උසස් පෙළ සමත් ව විශ්ව විද්‍යාල අධ්‍යාපනයට ගියා. කොටසක් රැකියාවක් කළා. තව සමහරු රට අතහැර ගියා. ඉතිරි කොටස ඒ කාලයේ දී ම විවාහ වුණා.

දැන් ජීවිතයේ තවත් ඉලක්ක ගොඩක් අපි ඉදිරියේ. ඉඩමක් ගන්න, ගෙයක් හදාගන්න, වාහනයක් ගන්න සිතේ බලාපොරොත්තු ප්‍රාර්ථනා ගොඩක්. දිවා රෑ නොබලා මහන්සි වෙන්නේ ආර්ථිකය ශක්තිමත් කර ගන්නට, ලස්සනට අඳින්නට, හොඳට කන්න බොන්න සිත කැමැති වුණා. සිත ඉල්ලන ඉල්ලන තැන්වල අපේ ඉලක්ක නතර වුණා. එකක් අත්පත් කර ගන්නත් කලින් තව තවත් ඉලක්ක අපේ ජීවිතයට එකතු වුණා.

මේ අතරේ අපේ දරුවන්ගේ දෑසට එබිලා අපි ඒ අයගෙන් මහා දැවැන්තයෝ සෙව්වා. ප්‍රතිරූප ගොඩනඟා ගත්තා. හරියට ඒ කාලයේ අපි වගේම යි. නිතරම සිත ඉල්ලන දේ පස්සේ අපි හති දාගෙන දිව්වා. ජීවිතයේ වැඩිම වාර ගණනක් අප කළේ සිත කැමැති දේ යි.

## ජීවිතේ දිරනවා

අපේ තිබුණ ශක්තිමත් ශරීරය කාලයා විසින් ටික ටික උදුරා ගනිමින් සිටිනවා. "ඉස්සර වගේ දැන් මොනවත් කරන්න බැහැ" නිතරම කියනවා. ගෙවී ගිය ශරීර ශක්තිය වමාරා නැවත නැවත තව එකෙකු හා කතා කරමින් අද අපි කරන්නෙත් මේ සිත සතුටු කිරීම පමණක් නොවේ ද?

තව ටික කාලයක් යද්දී විනාඩියක් දෙකක් අරගෙන හෙමින් සිරුවේ අතගාලා පුටුවක වාඩිවෙන්න සිදුවෙනවා. පුටුවෙන් නැගිටිද්දීත් කිසිම පැකිළීමක් නැතිව නැඟිට ගන්න මේ ශරීර ශක්තිය නැති වෙලා යනවා. කාගේ හරි උදව්වක් ලැබෙන තුරු අපි බලාගෙන ඉන්නවා.

ටික ටික ඇස් පෙනීම දුබල වෙනවා. රස නොදැනී යනවා. දෙයක් පැවසුවොත් " ඒ දේ නැවත අහනවා. දැන් කියපු දේ දැන් මතක නැහැ. සියලු ඉන්ද්‍රියයන් අඩපණ වේගෙන එනවා. දරුවන්ගේ නොරුස්සන වචන අහන්න සිදු වෙනවා. ඒවා දරාගන්නත් වෙනවා. රෑරා වැටෙන කළුළු තමන්ට ම පිස ගන්නටත් සිදු වෙනවා.

මේ කය තරම් ආදරයෙන් රැක බලා ගන්නා වෙනත් දෙයක් නැති තරම්. වෙලාවට කවනවා. පොවනවා. සතපවනවා. ඉලීම්, පිරිමැදීම් ආදියෙන් පෝෂණය කරනවා. බොහොම පරිස්සම් කරනවා. එහෙම කයේ සිදුවෙන වෙනස අපට පෙනුණේ නැහැ. ඇයි එහෙම වුණේ.......? ඒ දේ හඳුනාගන්නට ඇයි බැරි වුණේ. ?

## ඇත්ත නොපෙනෙන හැටි

මේ සිදුවීම බුද්ධ කාලයේ වුණේ. සුන්දර රූපයක් තිබූ සමිද්ධ තෙරුන් වහන්සේ එදා තපෝදා නදියට උදේම වැඩම කොට ස්නානය කළා. සිරුරේ තෙත වියළවමින් ගං ඉවුරේ වැඩ සිටිද්දී එක් දෙව්දුවක් එතැනට පැමිණියා. තපෝදාව ආලෝකවත් කරගෙන එතැනට පැමිණි දෙව්දුව සමිද්ධ තෙරුන්ට මෙහෙම කිව්වා.

"පින්වත් භික්ෂුව කම් සැප නොවළඳා පිණ්ඩපාතය පමණක් වළඳනවා නේද? කම් සැපත් වළඳලා පිණ්ඩපාතයත් වැළඳුවොත් නරක ද? කම් සැපත් වළඳලා ම පිණ්ඩපාතයත් වළඳන්න. මේ වටිනා අවස්ථාව මඟහැර ගන්න එපා."

සමිද්ධ තෙරුන් වහන්සේ මෙහෙම වදාළා. "අවස්ථාව" මට ඒක තේරෙන්නේ නෑ. කාලය ආශාවෙන් වැසුණාම ඇත්ත පෙනෙන්නේ නෑ. ඒ නිසාම කම්සැප වළඳන්නේ නැතිව පිණ්ඩපාත විතරක් වළඳනවා. මට මේ උතුම් අවස්ථාව ඉක්ම වන්න එපා." (සමිද්ධ සූත්‍රය - සං. නි. 01)

අද අපට සිදු වූ දේයි, ඒ තෙරුන් වහන්සේ එදා පෙන්වා දුන්නේ. කාලය ආශාවෙන් වැහුණාම ඇත්ත පෙනෙන්නේ නැහැ.

ජීවිතයේ යථාර්ථය දවසින් දවස දිරායන, දවසින් දවස දුබල වන දෙයක්. එදත්, අදත් සිදු වන්නේ ඒ දේම යි. නමුත් අපට එය නොපෙනුනේ අපේ ජීවිත ආශාවන්ගෙන් වැහිලා තිබූ නිසයි. අපට අප ගැනත්, අපේ ජීවිතය හා බැඳුණු අනෙක් අය හා අනෙක් දේ ගැනත් තිබුණ හීනවලින් ජීවිතයේ ඇත්ත වැහිලා ගියා. අපි අපේක්ෂා සහිත වෙමින් සොයා යන්නේ ම ජරාවටත්, මරණයටත් අයිති දේ නොවේ ද? තමා උපදින ස්වභාවයෙන් සිට උපදින දේටත්, ජරාවට, පත්වෙන ස්වභාවයෙන් සිට ජරාවට පත්වෙන දේටත්, ලෙඩවෙන ස්වභාවයෙන් සිට ලෙඩවෙන දේටත්, මරණයට පත්වෙන ස්වභාවයේ සිට මරණයට පත්වන දේටත් ආශා කරනවා. එයම සොයනවා.

දුක තුළ ම සිට දුකට අයත් දේ සොයනවා. ඒ නිසාම තමාට සිදුවන දේ තමාට පෙනෙන්නේ නැහැ. මොහොතක් ජීවිතය දෙස නැවතී බලන්න. අපි වයසට ගිහිං. දිරා ගිහින් .දැන් මනුස්ස ලෝකයෙන් යන්න ළංවෙලා. දැන් තව උපතක් කරා යා යුතු වෙනවා. ඒ උපත සැපවත් උපතක් කරා ගෙන යන්න ඉලක්ක සම්පූර්ණ කර ගත්තා ද කියා අපි තනි තනිවම කල්පනා කළ යුතු වෙනවා.

නයනා නිල්මිණී

> අපේ තිබුණ ශක්තිමත් ශරීරය කාලයා විසින් ටික ටික උදුරා ගනිමින් සිටිනවා. "ඉස්සර වගේ දැන් මොනවත් කරන්න බැහැ" නිතරම කියනවා. ගෙවී ගිය ශරීර ශක්තිය වමාරා නැවත නැවත තව එකෙකු හා කතා කරමින් අද අපි කරන්නෙත් මේ සිත සතුටු කිරීම පමණක් නොවේ ද?





# ලෝකය කියවමින්

## ජීවිතය දකින්න

**විසිතුරු භාණ්ඩ රැසක් එක තැනක තිබෙන විට ඒ තැන හරිම සුන්දරයි. ලස්සනයි. මල් පිපුණු එක මල් ගසකට වඩා මල් පිපිණු ගස් රැසක් එකම තැන තිබෙනවා නම් එතැන මොනතරම් ලස්සනයි ද?**

මනුෂ්‍ය ජීවිතයත් මේ වගෙයි. මනුෂ්‍ය ජීවිතය ලස්සන කරන්නේ යහපත් ගුණ. එකම යහපත් ගුණයකට වඩා ගුණ රැසකින් සම්පූර්ණ වීමට හැකි නම් ජීවිතය ලස්සන වෙනවා පමණක් නොවෙයි, වටිනාකමත් වැඩිවෙනවා.

බුදුරජාණන් වහන්සේ වදාළේ මෙන්න මෙබඳු ගුණ කිහිපයක් මනුෂ්‍යයකු තුළ ඇත්නම් ඒ මනුෂ්‍යයා වටිනා බවයි. ඒ මනුෂ්‍ය ජීවිතය හරි වැදගත් බවයි. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව, කිසියම් වූ ශාස්ත්‍රයක් උගත් බව, "විනයොච සුසික්ඛිතො" නීතිගරුක බව "සුභාසිතා ච යා වාචා" ප්‍රිය මනාප ලස්සසන වචන කතා කිරීම ආදිය ජීවිතය හැඩකරන ආභරණයි. එම ආභරණ ළඟ තියෙන පුද්ගලයා ඉතා වටිනා මනුෂ්‍යයෙක් ලෙසයි හඳුන්වා දෙන්නේ.

"බාහු සච්චඤ්ච" නම් බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවයි. කුඩා දරුවෙක්, තරුණ දරුවෙක්, වැඩිහිටියෙක් වුණත් උගත්කම තිබිය යුතුයි. බුදුරජාණන් වහන්සේගේ දවස හා ඉන් පසු කාලයේත් පොත පත කියවා දැනුම ලබා ගත්තේ නැහැ. මේ කාල සීමාවේ පොත පත දුර්ලභයි. ඒ දවස ඉගෙන ගත්තේ අන් අයගෙන් අසා දැනගෙන. ඉගෙන ගත් පුද්ගලයා කියා දෙන දේ අසා ඒ දේ මතකයේ තබාගෙන ඒ තුළින් තමාගේ දැනුම වර්ධනය කර ගත්තා. එතැනයි ඔහුගේ බහුශ්‍රැත බව පෙන්නුම් කළේ.

බහුශ්‍රැත නම් බොහෝ ඇසූ පිරූ තැන් ඇති බවයි.

මේ ලෝකය පිළිබඳ කියවා ඉගෙන ගන්නට බොහෝ දේ තිබෙනවා. ඒත් සමහර ඇත්තෝ ජීවත් වන්නේ ළිදේ ඉන්නා මැඬියන් ලෙසයි.

අපේ කුඩා දරුවන් විතරක් නොවෙයි. තරුණ දරුවන් ද විශේෂයෙන් ම කල්පනා කර ගත යුතුයි. මනුෂ්‍ය ජීවිතයේ වටිනාකම වැඩි වන්නේ උගත්කම වැඩි වූ තරමට බව. ගේ - දොර, යානවාහන, මිල මුදල්වලට වඩා උගත්කම බබළන බව.

ඒ උගත්කම බබළන්න තවත් දෙයක් අවශ්‍යයයි. ඒ විනය, හික්මීම කියන දේ. මේ දේ දැනීම නිසා, අවබෝධය නිසා ගොඩනැගෙන දෙයක්. අපේ ජීවිතය ක්‍රමානුකූලව කිසියම් ශාස්ත්‍රයකින් ගොඩනැඟුණේ නැතිනම් ඒ ජීවිතය හරියට මැටි ගුලියක් වගේ කිසි හැඩයක්, ලස්සනක්, දැකුම්කළු බවක් නෑ. අපේ ජීවිත බොහෝ වටිනා ජීවිතයක් බවට පරිවර්තනය කර ගන්නට වුවමනායි. එහෙම කර ගන්නට බහුශ්‍රැත බව ඇසූ පිරූ තැන් ඇති පඬිවරයෙක් බවට පරිවර්තනය වන්නට අවශ්‍යයි.

එවිට ඔබ සමාජයට වටිනවා. ඒ විතරක් නොවෙයි. බුද්ධියෙන්, ඥානවන්ත බවින් පිරිපුන් ඔබ සදාකාලයේ ම බැබළෙනවා. අතීතයේ අපේ රටේ සිටි උගත් පඬිවරු, අද ජීවතුන් අතර නැතත්, ඒ අයගේ ගුණ සුවඳ අමරණීයයි. අද අපි ඔවුන් ගැන කතා කරනවා. මුළු ලෝකයක් ගරු කරනවා. මනුෂ්‍ය ජීවිතයේ බාහිර වශයෙන් තිබෙන සෑම වටිනාකමකට ම වඩා උගත්කම, බහුශ්‍රැත බව වටිනවා.

තිබූ තැනක සොර සතුරන් ගත නොහෙනා

උගත මනා ශිල්පය මයි මතු රැකෙනා

මනුෂ්‍ය ජීවිතයේ අනාගත සැපයට අන් කිසිම දෙයකට වඩා උගත්කම, බහුශ්‍රැතබව නිධානයක් සේ ඉතිරි වෙනවා. එය මහා ධනයක් වෙනවා. ඒ නිසයි බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෙක් වෙන්න කියා, බුදුරජාණන් වහන්සේ වදාළේ. බුද්ධිමත් පුද්ගලයාට සෑම ප්‍රශ්නයක් දෙස ම කල්පනාවෙන් බලා කටයුතු කිරීමේ හැකියාව පවතිනවා. අන්න ඒ නිසයි අපි උගත් බුද්ධිමත් විය යුත්තේ. බුද්ධිමතුන්ගෙන් පිරුණු තැනක් නම් ගෙදරත්, රටත්, ලෝකයත් ලස්සනයි.

"සිප්පඤ්ච - සෑම මනුෂ්‍යයෙක් ම කිසියම් වූ ශිල්පයක් ළඟා කරගත යුතු ය. කිසියම් වූ කර්මාන්තයක් කිරීමේ හැකියාව සෑම මනුෂ්‍යයකුටම තිබිය යුතුයි. තමාගේ අනාගත ජීවත්වීමේ ක්‍රමය මෙන්න මෙහෙමයි කියා ගොඩනඟාගෙන තිබේ නම්, එබඳු පුද්ගලයාගේ අනාගතය කවදාවත් වරදින්නේ නැහැ. ඒ නිසයි බුදුරජාණන් වහන්සේ වදාළේ සෑම මනුෂ්‍යයෙක් ම කළ යුතු කිසියම් ශිල්පයක් ඉගෙන ගත යුතුයි කියා. උගත් දෙයින් රට වෙනුවෙන් සේවය කළ යුතුයි. ඒක ජීවිතයට ආශිර්වාදයක්.

**කිසියම් වූ කර්මාන්තයක් කිරීමේ හැකියාව සෑම මනුෂ්‍යයකුටම තිබිය යුතුයි. තමාගේ අනාගත ජීවත්වීමේ ක්‍රමය මෙන්න මෙහෙමයි කියා ගොඩනඟාගෙන තිබේ නම්, එබඳු පුද්ගලයාගේ අනාගතය කවදවත් වරදින්නේ නැහැ.**

අපේ රටේ මොනතරම් දේශීය අමුද්‍රව්‍ය තිබෙනවා ද? ඒ කිසි දෙයකින් අප ප්‍රයෝජනයක් ගන්නේ දැයි සිතා බලමු.

"විනයොච" - විනය නම් නීතිගරුක බවයි. හික්මුණු බවයි. නීතිගරුක බව මේ බුද්ධ ශාසනයේ මොනතරම් අගය කළා ද? විනය නම් බුද්ධ ශාසනයේ ආයුෂයයි. අවුරුදු දෙදහස් ගණනක් මේ ශාසනය රඳා පැවතුණේ ද විනය මතයි. බුදුරජාණන් වහන්සේ සැරියුත් හාමුදුරුවන්ගේ යෝජනාවට දේශනා කර වදාළේ "ධම්මෝ ච විනයො ච " ධර්ම විනය දෙක මේ ශාසනයේ නායකයා බවයි. වෙනත් නායකයෙක් පත් කළ යුතු නැති බවයි. ගිහි සමාජයේත් විනයක් අවශ්‍යයයි. ගෙදරක වැඩකටයුතු එකිනෙකා බෙදාගෙන කළ යුතුයි. එකිනෙකා වැඩකටයුතු බෙදාගෙන, වෙලාවට කිරීමට නියමයක් පනවා ගත යුතුයි. ඒ වගේ ම පාසලේ දී, රැකියා ස්ථානයේ දී, පාරේ ගමන් කරන විට ආදී වශයෙන් විනයක් ඇති ව වැඩ කටයුතු කළ යුතුයි. කිසියම් නීතියකට, ක්‍රමයකට වැඩ කටයුතු කරනවා නම්, ඔබේ ජීවිතය හරි ම නිරවුල් . ඒ ජීවිතය හරිම ලස්සනයි. ඒ නිසා අප හැම කෙනකුට ම අවශ්‍ය කරන දෙයක් තමයි විනය, හික්මීම, සංවර භාවය නැතිනම් හැදිච්චකම.

"සුභාසිතා ච යා වාචා" අපේ ජීවිතයේ තිබිය යුතු වැදගත් ම මංගල කරුණ ප්‍රිය වචන, ලස්සන වචන කතා කිරීමයි. බුදුරජාණන් වහන්සේ වදාළා ප්‍රිය වචනයෙන් ඕනෑම දරදඬු පුද්ගලයෙක් වූ ව ද හික්මවා ගත හැකි බව ආදරණීය වචනයට සතා සිව්පාවා මෙන් ම ගහ කොළ ද කැමැතියි.

වචනයක් කටින් පිට කිරීමට පෙර එය හොඳ වචනයක් ද, නපුරු වචනයක් ද කියා සිතා බැලිය යුතුයි.

හොඳ, ප්‍රිය මනාප වචන කතා කරන්නෙක් වෙන්න. එවිට සමාජයට, ගෙදරට, රටට ආශිර්වාදයක් වේවි. බහුශ්‍රැතභාවය වැඩි කර ගන්න. බුද්ධිමතෙක් වන්න. හැම දෙනා ම විනයගරුක, ශික්ෂාකාමී පුරවැසියන් වන්න. නීතියට, වෙලාවට වැඩ කරන්න. ඉගෙන ගන්න. "සුසික්ඛිතෝ" හික්මුණු කයක්, හික්මුණු සිතක් ඇති කර ගන්න. සෑම මොහොතක ම ප්‍රිය වචනය කතා කරන්න. සමාජයේ අන් අයට යහපතක් වන ආකාරයෙන් ජීවත්වන්න.

**දීපා පෙරේරා**

## ආනන්ද හාමුදුරුවෝ

සම්බුදු පියාණන් මහ සඟ රුවන ඇමතුවා
තව තෙමසකින් පිරි නිවනට යන බව දෙසුවා
ආනන්ද හිමියන් ඉකි බිඳමින් වැළපෙනවා
අප තනි කර නොයනු මැනවි ඉල්ලා සිටියා

බුදුහිමි ලොවේ අනියත ගැන දම් දෙසුවා
ප්‍රියයන්ගෙන් වෙන් වෙන බව තේරුම් කෙරුවා
ආනන්ද හිමි සිත බුදු හිමි සැදුවා
ලොවේ සියලු දේ අනියත බව කීවා

ලොවම එළිය කළ පහන නිවුණා
ආනන්ද හිමියන් වීරිය වැඩුවා
උතුම් දහම් ගඟ අවබෝධ වූවා
අරහත් ධජයේ රහත් බව ලැබුවා

**හර්ෂ මෙවන් කිවිදු**
**දංකොටුව - දික්වෙල**

# පහන් සිතක කවි



**සංස්කරණය**
**දීපා පෙරේරා**

## මට නොකියම එයා ගිහිං

බවුන් වඩන්නට
ගියේ වෙහෙර ගෙට
දෝත් දෝවලා
පා වැසුම් ගලවලා

දැහැන්ගතව සිටි කාලේ
නිහඬතාව ඇති වේලේ
මගෙ දැහැනින් ඔබට ලැබුණ
එර්ධි බලය හරි පුදුමයි

**වැලිපත පඤ්ඤානන්ද හිමි**
**වළවේ ශ්‍රී දේවරක්ඛිතාරාමය**
**දම්වැල්ඕඩය**
**කොටවෙහෙරමංකඩ**
**බළන්ගොඩ**

## සැම සිත් සැනසේවා



බුදු ගුණ බලයෙන් කුස ගිනි කුස් සැනසේවා
දම් ගුණ බලයෙන් දන හද ගින්න නිවේවා
අරහත් සඟ ගුණ බලයෙන් සිත් සැනහේවා
තෙරුවන් ගුණ බලයෙන් ලක්මව වොරැඳේවා

**පසිඳු මිහිරාන්**
**රැටියල**

## දළදා පෙරහර

කස පුපුරණ හඬ
ඩෙංකුටු බෙර හඬ
ඇතාට පාවඩ
කරඬුව පිට උඩ

සෙංකඩගල පුර
ඒකාලෝක කර
සිත මන්මත් කර
දළදා පෙරහර

පුද දෙන දෙව් නර
දළදා ගම් බිර
සිත තැන්පත් කර
වඳිනෙමු පින් බර

පන්දම් ඇවිලෙයි
නිලමේවරු යති
කොඩි සේසත් ඇති
පෙරහර බැබළෙයි

**අජිත් වික්‍රමනන්ද වීරසූරිය**
**මොරගොල්ල**
**ඉඹුල්ගස්දෙණිය**



## නිකිණි පෝදා

සම්බුදු හිමිගෙ උපස්ථායක කමකින් ද
පුද ලැබ දහම් රස විඳගත් සිහිනෙන් ද
අද වැනි දිනක වටහා සදහම් කන්ද
අරහත් බවට පත්විය හිමි ආනන්ද

මහරජු අජාසත් පෙරමෙන් නොවුණි හොඳයි
දැන් දිවි ගෙවන්නේ ඉමිහිරි දහම මැදයි
සදහම රකින්නට ඔහු රජ බලය යොදයි
පළවැනි දහම් සංගීතිය තිබුණෙ අදයි

මේ ලක් දිවෙහි ඉතිහාසය බැලූ කල
හමුවුණි තොරතුරක් සදහම ළඟා කළ
ලලාට ධාතු තැම්පත් කර අමා බල
දාගැබ හැදුණු පින්බර සේරුවාවිල

අද වැනි පොහොය දිනයක් ගැන ඇත අදහස්
මහ සඟ රුවන සසරින් විය යුතු නිදහස්
මඟ හැරුණි නම් යම් හිමි නමකට පෙරවස්
අවසර ඇත සමාදන් වන්නට පසුවස්

පව් වැඩ කියන්නේ බැලුවම වස විෂය
පින්කම් කළොත් නැඟුමට හැක ජය ගොසය
වස්තුන් මාසය ම බොදු දනහට රසය
පුද දිය හැකි ය සඟ රුවනට සිව්පසය

**වේලිඔය සිරි වජිර හිමි**
**සිරිමහ මිහිඳු පිරිවන**
**වාද්දුව**

## පමාවේ බිය



දස සිල් ද අට සිල් ද පංචශීලය ද ගෙන
සිල්වතුන් සෑ මලුවෙ නිදිකිරා වැටෙන විට
මුහුකුරා ගිය තරම තුන් කුදුව සිටිනු දැක
කරුණක් සිත දැනුණි ප්‍රමාදයෙ දරුණු දුක

**ගාමිණි ජයලත් තැල්දෙන**
**හාලිඇල**

## උතුම් මොහොත

රන් හිරු මඬල පායා
ගයා හිස දිළුණා

දහම් රන් කෙළි
නැඟී විහිදී පෙනුණා
දස මරුන් පලා ගොස්
සැඟව වන වැදුනා

සැදැහැ සිත් ඇති
දෙව් බඹුන්
සමිඳු සිරිපා මත
විගස වැඳ වැටුණා
මහබෝ මලුව පාමුල
බුදු වදන් ඇසුණා

**මාස්පොත**
**ධම්මජෝති හිමි**
**මීරිගම**

## දසපෙරුම් දම් පුරා සසරේ



දසපෙරුම් දම් පුරා සසරේ
එළිය දුටුවා අවිදු අඳුරේ
තුන්ලොවක් දිනූ සෑසි සමිඳේ
මහිමි සිරිපා වඳිමි නිබඳේ //

සුපිපි සල්මල් ලුම්බිණී යේ
සත් පියුම් පිට වැඩිය දිනයේ
ලොවම ඒකාලෝක වූවා
ලොව්තුරා සම්බුදු පියේ //

නිමක් නොපෙනෙන සසර කතරේ
කෙලෙස් පරදා ජයක් ලැබුවේ
පහන් ටැඹ සම්බුදු සමින්දේ
එළිය විහිදූ සමිඳු වන්දේ //

**විශ්‍රාමික පාඨශාලාචාරිනී**
**ජේ.ඇම්. ඊ.සිරිවර්ධන මිය**

## මම සොත්තිය බමුණා වෙමි



සිත දුක් නිවාලන මඟ
කියාදෙන බුදු හිමියනේ
එදා බෝ මැඩ වෙතට
පිය නඟනා හිමි දෝතට
කුස තණ අට මිටක් දුන්න
ආජීවක මම වෙමි
දුකින් පෙළෙන ලෝසතුනට
පිහිට වන බවක් ඇසුවෙමි
සුනීත සෝපාක වගේ
අයටත් පිහිටක් වූවා
කුස තණ කපමින් දිව රෑ
මම තවමත් අතරමඟ ය
හදවත බෝමැඩක් කරමි
කුස තණ අතුරා සරසමි
දිව රෑ ඇරයුම් කරනෙමි
දම් රජුනේ වැඩිනු මැනවි,

**බිබිලේ ධම්මසිරි හිමි**
**කජුවත්ත ආරණ්‍ය සේනාසනය**
**දෙහිඅත්තකණ්ඩිය**

### බුදුසරණ පහන් සිතක කවි

BCC

**සම්පූර්ණ නම** :- ..............................................................................
**ලිපිනය** :- ..............................................................................
**දුරකථන අංකය** :- ..............................................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.



## මෙත් කරුණා ගුණ

සියලු කෙලෙසුන්
කෙරෙන් දුරු වූ සම්බුදුරදුන්
කෙලෙස් බැමි බිඳ සසර කතරින්
යන්න මඟ පෙන්නුවා කුලුණින්

පුදු පුතුන් සිය දහස් ගණනින්
නිවන් දොරටුව විවර කරමින්
සසර කතරින් එතෙරවෙත්

**වල්පල සුගුන නන්ද හිමි**
*3 වැනි ශ්‍රේණිය*
*චෛතියාරාම පුරාණ මහා විහාරය*
*ආඬිඅම්බලම*

## අසරණයන්ට පිහිට වෙමු

තනිව ජීවත් විය නොහැකි, අන් අයගේ ආධාර උපකාර අවශ්‍ය, රෝගී අය හා කාත් කවුරුත් නැති අය ද අසරණයෝ වෙති. මොවුනට කිසිවකුගේ හවිහරණක් ද නැත. ජීවත්වීමට ද මඟක් නැත. අපේ රටේ අපේ ම පුරවැසියන් පිරිසක් මෙසේ අසරණවීමට ඉඩදීම අපේ යුතුකමක් නොවේ. මොවුන් දෙස සානුකම්පිත ව බැලිය යුතු ය. මොවුන්ගේ සුභසාධනය අපෙන් සිදුවිය යුතු ය. අත පය වාරු නැති, වැඩක් පලක් කරගෙන ජීවත් විය නොහැකි මොවුහු කාගෙන් හෝ යැපෙන්නෝ ය. අප සැමගේ උදව් උපකාර නොලැබුණහොත් මොවුන් තවත් අසරණ වේ.
මෙලොවට බිහි කර ඇති දැඩි කළ මව්පියන් ගැනවත් සිතීමට අද දරුවන්ට විවේකයක් නැත. මෙය ඉතා කනගාටුදායක තත්ත්වයකි. කොතරම් අවිවේකී වුව ද අප අපගේ වගකීම් පැහැර නොහරිමු. ඒ වගේම යුතුකම් ඉටු කළ යුතුය. පින් කෙතක් වන් මේ බෞද්ධ රටේ ජීවත් වන අපි අසරණයන්ට පිහිට වෙමු. පරාර්ථකාමී වෙමු. අපට හැකි පමණින් ඔවුන්ට උදව් උපකාර කරමු.

**ඉමල්ෂා සමාධි**
*7 ශ්‍රේණිය*
*සුවිශුද්ධාරාම දහම් පාසල*
*වැල්ලවත්ත*

## සිල් සුවඳින් සැරසෙන්නේ



පින්වත් පුත් රුවනකි කුස තුළ ඉන්නේ
කෙලෙස් නසා සම්මා සම්බුදු වන්නේ
නම් තැබුමට පුතු සරසා ගෙන එන්නේ
සිදුහත් යැයි මේ නාමය ලැබ ගන්නේ

රම්‍ය සුරම් සුභ මාළිග තනා දී
උයන් සිරි දැකුම සඳහා ගිය විට දී
සතර පෙර නිමිති දුටුවා පෙර මග දී
සසර කෙරෙහි කළකිරුණා සිත පැහැ දී

නේරංජනා ගං තීරෙන් එතෙර වුණා
මුඩු කොට කෙස් කළඹ අසලට යොමු කෙරුණා
එක දා උපන් කන්ථක අසු දුක හිතුණා
පැලී ළය මිය ගිහින් දෙව්ලොව සැප ලැබුණා

**වටරැක ඤාණවංසක හිමි**
*2 ශ්‍රේණිය*
*ශ්‍රී ප්‍රඥානන්ද මහ පිරුවන - මහරගම*

## බුදුසරණ

පනස්හත් වසර පසු කළ බුදුසරණ
ළමා මනස සිතුවම් කළ බුදුසරණ
අපගේ කවි කතා පළ කළ බුදුසරණ
දින දින දියුණුව ම වේවා බුදුසරණ

**ඩී.ජී. සිනෙත්මා නේත්‍රාංජලී**
*8 ශ්‍රේණිය*
*ශ්‍රී බෝධිරුක්ඛාරාම දහම් පාසල*
*ඉහළ අත්තංගනය*



# සදහම් අරණ

සංස්කරණය - **නයනා නිල්මිණී**

## පැතුම



මම වසර පහක් ඉගෙනුම ලැබුවේ රාගම ඉහළගම ධර්ම රක්ෂිත කණිටු විදුහලේ. මම ශිෂ්‍යත්ව විභාගයෙන් කිසිදු අමතර පන්තියකට සහභාගි නොවී ලකුණු 166ක් ලබා ගත්තා. මම පාසලටත්, ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත් බොහෝ ගරු කරනවා. මම අලුත් පාසලට ගියා. ඒ තමා කොළඹ කොල්ලුපිටියේ මහානාම විද්‍යාලය. බොහෝ වෙනසක් මට දැනුණා. පුංචි ගමක, පුංචි පාසලක ඉගෙන ගත් මම කොළඹ නගරයේ මෙම පාසලට ආවේ ගුරුවරුන්ගේ වගේ ම මගේ ද උත්සාහය තිබූ නිසයි. මම හොඳින් අධ්‍යාපනය ලබා මගේ පාසල් දෙකට ම අභිමානයක් ගෙන දෙනවා. මගේ බලාපොරොත්තුව බෞද්ධ රටේ බෞද්ධ ස්වාමින් වහන්සේ නමක් වීමයි.

**දීත්ම සජාර ජයසිංහ**
*6 ශ්‍රේණිය*
*සිරි විමලසිරි ඉංග්‍රීසි දහම් පාසල -*
*පොල්පිටිමුකලාන*

## මගේ රටට ආදරෙයි

අම්මට මම ආදරෙයි
තාත්තට මම ආදරෙයි
මගෙ මල්ලිට ආදරෙයි
ගෙදර සැමට ආදරෙයි

ගුරුතුමියට ආදරෙයි
පාසලටත් ආදරෙයි
යහළුවන්ට ආදරෙයි
මගේ රටට ආදරෙයි

**සෙනුලි ලෙසන්සා කුරුප්පු**
*2 වසර*
*අනුලා විදුහල - නුගේගොඩ*

## මගේ තාත්තා

මගේ සතුට වෙනුවෙන්
ඔහුගේ ජීවිතය කැප කොට
මහමෙරක් දුක් ගිනි ඉසිලූ...
කෙතරම් වෙහෙස මහන්සිය දැනුණත්
මගෙන් සඟවා සිනාසී සිටී...
කොහේ කොතැනක ගියත්
මා නිවසින් පිටතට...
නැවත යළි එන තුරු
දොරකඩට වී මාවත බැලූ
මගේ ලොවේ රජු
ඔබයි මගෙ තාත්තා....


**ඩී.ජී. අනුපමා නෙත්සරණි**
*9 වසර*
*සුවිසුද්ධාරාම දහම් පාසල - වැල්ලවත්ත*

## දම් අමා ගුණ

නිකිණි පුන් සඳ රැසින්
ලක් දෙරණ බැබළුණා
දම් අමා ගුණ දමින්
ලෝ සතන් සිත් සැනසුණා

තුසිතයෙ දෙව් සැප හැරදා
මිනුලොව වාසෙට වැඩලා
තුන්ලෝ සිත් සනසන්නට
ලෝසත හට දම් දෙසුවා

**සෙතුමි ශේලක**
*7 ශ්‍රේණිය*
*සුදර්මාරාම දහම් පාසල -*
*කළගෙඩිහේන*



## රාහුල පොඩි හාමුදුරුවෝ



සිදුහත් කුමරුගේ හා යශෝධරා දේවියගේ පුතු වූයේ රාහුල කුමරු ය. පුත් කුමරු උපන් දින ම පියාණන් වූ සිද්ධාර්ථ බෝසතුන් ගිහිගෙය හැර යාම හෙවත් මහභිනික්කමන සිදු විය. සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ පසු එළඹි වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයේ කිඹුල්වතට වැඩි සේක. භික්ෂූන් වහන්සේ පිරිවරා බුදුරජාණන් වහන්සේ වඩිනු දුටු යශෝධරා දේවිය රාහුල පුතුට බුදුපියාණන් වහන්සේ හඳුන්වා දුන්නේ " පුතනුවණි, රන් නෙළුම් මලක හැඩය ඇති, රන්වන් පාද තලයක් ඇතිව මහ පොළොවට නොදැනෙන සේ මහ පොළොව මුළු පාදතලයෙන් ම සිප ගන්නා ආකාරයට වඩින්නේ ඔබගේ පියාණන් වහන්සේ ආදී වශයෙන් ගාථා නවයකින් බුදු සිරුර වර්ණනා කළා ය. නරසීහ ගාථා යනු ඒවා ය. අනතුරුව රාහුල මාතාව තම පුතු අමතා, " පුත රාහුල, ඒ ඔබේ පියාණන්ගෙන් ඔබට ලැබිය යුතු දායාදය ඉල්ලා ගන්න." යි පිටත් කර හැරියා ය. ඉතා කීකරු කුඩා රාහුල කුමරු අවුරුදු හතේ දී පැවිදි විය. පැවිදි වූ පසු ද වැඩිහිටියන්ගේ අවවාද ඇසීමට ප්‍රිය වූ උන්වහන්සේ නිවනින් නිවී සැනසී වදාළහ.

**පියරපන්දෝවේ උත්තමඥාන හිමි**
*1 ශ්‍රේණිය*
*ශ්‍රී ගැමුණු විහාරය - හඳපානාගල*

### බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

සම්පූර්ණ නම :- ..............................................................
පාසල /දහම් පාසල :- ..............................................................
ඉගෙනුම ලබන ශ්‍රේණිය :- ..............................................................
ලිපිනය :- ..............................................................
දුරකථන අංකය :- ..............................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක සතර පෝය දිනටම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.

# පෝදා පින්කම්

## කොබවක ශ්‍රී සුමනාරාම විහාරය



කොබවක ශ්‍රී සුමනාරාම මහා විහාරාධිපති දෙල්මැල්ලේ සුමනරතන හිමි (කොබවක පොඩි හාමුදුරුවන්) පැවිදි වී වසර 41 ක් පිරීම නිමිත්තෙන් නිකිණි මස පුර පසළොස්වක පොහොය දා දවස පුරා කොබවක ශ්‍රී සුමනාරාම මහා විහාරයේ දී පින්කම් මාලාවක් පැවැත්වේ. පෙරවරු 08.30 ට ධර්ම දේශනාව - බෝතලේ ශ්‍රී ඤාණිස්සර නාහිමි, 10.00ට සදහම් වන්දනාව - ආඳලුවේ සුබෝධනී මෙහෙණින් වහන්සේ, සවස 01.00ට ධර්ම දේශනාව - මොරපිටියේ ශ්‍රී ධම්මතිලක නාහිමි, පස්වරු 02.00ට භාවනාව - ශාස්ත්‍රපති වෑකඩ හද්‍රා මෙහෙණින් වහන්සේ, සවස 03.30 ට ධර්ම දේශනාව - නවඳගල චන්ද්‍රසිරි නාහිමි, සවස 04.30ට කාව්‍යමය ධර්ම දේශනාව ශාස්ත්‍රවේදී පණ්ඩිත නුගගොල්ලේ සෝමරතන හිමි. සවස 06.30ට, විශේෂ සුවඳ දුම් පූජාව සහිත ගිලන්පස බුද්ධ පූජා, බෝධි පූජා හා අටවිසි ගිලන්පස බුද්ධ පූජාව කාව්‍ය ශ්‍රී කාව්‍ය විශාරද ගෝවින්නේ සුබෝධි හිමි .

### ඓතිහාසික ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරය

පෙරවරු 06.00-06.30 සීලසමාදානය සහ උදෑසන බුද්ධ පූජාව ශ්‍රී කල්‍යාණි රාජමහා විහාරයේ කෘත්‍යාධිකාරී ශාස්ත්‍රවේදී රන්දිලිගම මහින්ද හිමි, 08.00-09.00 භාවනාව ශ්‍රී කල්‍යාණි උභය රාජමහා විහාරාධිපති, කැලණිය විශ්ව විද්‍යාලයේ කුලපති අග්ගමහ පණ්ඩිත, උපාධ්‍යාය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි, 09.00-10.00 ධර්ම දේශනාව දර්ශනපති කොබ්බෑවල මේධංකර හිමි, 10.00-11.00 ධම්ම පදයෙන් බිඳක් වත්තල වැලිකඩමුල්ල අභය විහාරාධිපති. කැළණියේ ශාසනවංශ හිමි, 11.00 -11.30 දිවා බුද්ධ පූජාව - ශ්‍රී ශාස්ත්‍රවේදී මාවුස්සාගොල්ලේ මුදිත හිමි, 02.00 - 03.00 වෛද්‍ය දේශනය,04.00 -05.00 පස්වරු ධර්ම දේශනාව දොඩම්පහළ රාහුල හිමි, 05.00 -06.00 භාවනාව කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත නාහිමි, 06.00 -07.00 ගිලන්පස බුද්ධ පූජාව ශ්‍රී කැලණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෙනියායේ පඤ්ඤාලෝක බුද්ධරක්ඛිත හිමි .

### යෝගියාන ශ්‍රී ධර්ම නිකේතනාරාමය

ලයනල් චාල්ස් ද පොන්සේකා පියාණන්ගේ 108 ජන්ම දිනය මේ මස 12 වැනි දිනට යෙදී ඇති බැවින් නිකිණි පෝදා මීගමුව, තිඹිරිගස්කටුව දොන් ඩේවිඩ් ජනපදයේ ශ්‍රී මහින්දාරාම බෞද්ධ මධ්‍යස්ථානයේ විහාරාධිපති දැවමොට්ටාවේ මහින්ද හිමියන් විසින් දංකොටුව , යෝගියාන ශ්‍රී ධර්ම නිකේතනාරාම විහාරයේ දී පෙරවරු 08.00 සිට 09.30 දක්වා ධර්ම දේශනාවක් පැවත්වනු ලැබේ. ඊට සමගාමීව කැලුම් මහතා විසින් ධර්ම දානය පිණිස බුදුසරණ පුවත්පත් බෙදා දීම සිදු කෙරේ.

### රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානය

සීදූව - රද්දොළුව ශ්‍රී අමර මහා විහාරස්ථානයේ විහාරාධිපති, සීදූවේ සුමනවංස නාහිමියන්ගේ මෙහෙයවීමෙන් හා අනුශාසනා පරිදි පෝදා පින්කම් පැවැත්වීමට කටයුතු සලසා ඇත.

අලුයම 5.00 ට ශ්‍රී දළදා වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා ප්‍රනීත කිරි ආහාර පාත්‍ර 32 ක් පූජා කිරීම, අලුයම 5.30 ට අෂ්ඨාංග උපෝසථ සීලයෙහි පිහිටුවීම හා අනුශාසනාව සීදූවේ සුමනවංස නාහිමි, උදෑසන 6.00 ට ආහාර බුද්ධ පූජාව හා තෙරුවන් වන්දනාව පෙරවරු 7.45 සිට 8.45 දක්වා ධර්ම දේශනාව දේශකයාණන් වහන්සේ:- ගෞරව ශාස්ත්‍රවේදී මීවැල්ලාවේ පඤ්ඤාරංසි තිස්ස හිමි 9.45 සිට 11.15 දක්වා ධර්ම සාකච්ඡාව මහාචාර්ය අශෝක් ප්‍රියදර්ශන මහතා, ශාස්ත්‍රපති නීල් ධර්මප්‍රිය බණ්ඩාර මහතා, ධර්මාචාර්ය කේ. ඒ. එස්. ආර්. දයානන්ද මහතා, ධර්මාචාර්ය කේ.එම්.ආර්. කුමාරසිංහ මහතා, 11.00 ට ව්‍යාංජන, පලතුරු, කැවිලි වර්ග 32 ක් ඇතුළු ශ්‍රී දළදා වහන්සේ, අටවිසි බුදුරජාණන් වහන්සේ උදෙසා මුල්තැන් බුද්ධ පූජා පූජා කිරීම, පස්වරු 12.00 සිට 12.30 දක්වා සක්මන් භාවනාව 01.15 සිට 2.15 දක්වා කාව්‍යමය ධර්ම දේශනාව - ශාස්ත්‍රවේදී රන්වල සරණසිරි හිමි. 2.45 සිට 3.45 දක්වා ධර්ම දේශනාව - ශාස්ත්‍රපති ඇල්ලේ ඉන්ද්‍රජෝති හිමි, 4.00 සිට 5.00 දක්වා ධර්ම දේශනාව - ශාස්ත්‍රවේදී මාදූවේ කෝලිත හිමි ප: ව: 5.30 ට ආශිර්වාද අටවිසි බුද්ධ පූජාව සහිත පහන් පූජා, බෝධි පූජා පින්කම සහ සැමට ආශිර්වාද කිරීම සඳහා පිරිත් සජ්ඣායනය

### සංඝමිත්තාරාමය – තලවතුගොඩ

අලුයම 5.30 අටවිසි බුදුරජාණන් වහන්සේලා අසූ මහා ශ්‍රාවිකාවන් වහන්සේ උදෙසා පවත්වනු ලබන ප්‍රනීත ක්ෂීරපායාස පූජාව සහ බෝධි පූජාව,

පෙරවරු 06.00-07.00 සීල සමාදානය සහ සම්බුද්ධ පූජාව, 8.00 -9.00 ධර්ම දේශනය පුහුල්වැල්ලේ සාරද හිමි, 9.30 -10.30 ධර්ම දේශනය රදාවඩුන්නේ ඥානවිමල හිමි, 2.00 -3.00 ධර්ම දේශනය - බොරැල්ලේ අතුල හිමි, 3.00 -5.00 ධර්ම දේශනය - සෝමපුර සිරිසුධම්ම හිමි 6.00 අටවිසි බුදුරජාණන් වහන්සේ අසූ මහා ශ්‍රාවිකාවන් වහන්සේ උදෙසා පවත්වනු ලබන ප්‍රනීත ගිලන්පස පූජාව සහ බෝධි පූජාව, එදින සිල් පිරිස සඳහා බුදුසරණ පුවත්පත බෙදා දෙන්නේ විමල් පීරිස් මහතා විසිනි.

## ශිෂ්‍යත්ව ප්‍රදානයක්



මෑත භාගයේ මෙරට බිහි වූ මුල් පෙළේ සමාජ සේවකයකු සහ මානව හිතවාදියකු වශයෙන් පිළිගැනෙන යූ.ඩබ්ලිව්. සුමතිපාල මහතා සිය ආයතනයේ කාර්ය මණ්ඩලයෙහි සුභ සාධනය හා ප්‍රගතිය වෙනුවෙන් මහත් කැප කිරීමක් කළ අයෙකි. එතුමන් අභාවප්‍රාප්ත වී හතළිස් තුන්වන ගුණානුස්මරණය යෙදුණු 2022 ජූලි 13 වැනි දිනට සමගාමීව ආයතනයේ දූ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් 18 වන වරටත් ශිෂ්‍යත්ව ලබා දීමක් සිදු කෙරිණි.


## රුහුණු කතරගම මහා දේවාලයේ වාර්ෂික ඇසළ මංගල්‍යය

ඓතිහාසික රුහුණු කතරගම මහා දේවාලයේ වාර්ෂික ඇසළ මංගල්‍යයේ සිව්වන දින පෙරහර අගෝස්තු (1) වීදි සංචාරය කෙරිණි. කඳසුරිඳුන්ගේත්, වල්ලි මෑණියන්ගේත් සරණ මංගල්‍යය සිහිකරනු වස් දුටුගැමුණු මහ රජුගේ අණින් කඩ නොකොට පවත්වා ගෙන එනු ලබන ඓතිහාසික රුහුණු කතරගම මහා දේවාලයේ 2022 වර්ෂයේ ප්‍රථම මඟුල් පෙරහර ඉකුත් 29 වැනිදා වීදි සංචාර කෙරිණි.

මෙම ප්‍රථම මඟුල් පෙරහර රන්කොත් මාලිගාවෙන් නික්මී මඟුල් වීදියෙන් වල්ලි මෑණියන්ගේ දේවාලයට පැමිණ නැවත එම වීදිය ඔස්සේම පැමිණ රන්කොත් මාලිගාවට ගෙවදිනි. මෙවර කතරගම ඇසළ මංගල්‍යයේ අවසාන මහා රන්දෝලි පෙරහර අද (11 වැනිදා) පැවැත්වෙන අතර, 12 වැනිදා මැණික් ගඟේ දියකැපීමෙන් පසු පෙරහර නිමාවට පත්වේ. උඩරට, පහතරට සහ සබරගමු සම්ප්‍රදායන්ට අයත් නැටුම් කණ්ඩායම් රැසකගේ සහභාගිත්වයෙන් අලි ඇතුන් සහිතව චාරිත්‍රානුකූලව උත්කර්ෂවත් ලෙස පෙරහර පැවැත්වීමට බස්නායක නිලමේ තැන්පත් ඩිෂාන් වික්‍රමරත්න ගුණසේකර මහතා පියවර ගෙන ඇත.


**ඩී.එස්. ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ**





## බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන

පෙරවරු 6.00 - 11.30 රූපවාහිනී පෝදා වැඩසටහන. පස්වරු 1.00 - 3.30 ධර්ම දේශනාව ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි, 4.00 - 5.00 ධර්ම දේශනාව සියඹලාගොඩ ධම්මින්ද හිමි, පස්වරු 5.00 සිල් පවාරණය රාත්‍රී 7.00 ට බෝධි පූජා පින්කම.




## රට්ඨපාල මහ රහතන් වහන්සේ

අසූ මහා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත කතා ග්‍රන්ථ රැසක් හා ධාතු විස්තරය නම් වූ ග්‍රන්ථය සම්පාදනය කළ ගයාන් චානුක විදානපතිරණ ලියූ "රට්ඨපාල මහ රහතන් වහන්සේ" බෞද්ධ ග්‍රන්ථය මේ මස 02 වැනිදා කොළඹ මරදානේ පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවතේ, දයාවංශ ජයකොඩි සහ සමාගමේ පොත් ප්‍රදර්ශනාගාරයේ දී නිකුත් කෙරිණි.

අසූ මහා ශ්‍රාවක චරිත ග්‍රන්ථ මාලාවේ විසිඅට වැනි ග්‍රන්ථය 'රට්ඨපාල මහ රහතන් වහන්සේ' නම් ග්‍රන්ථය යි. රට්ඨපාල මහ රහතන් වහන්සේ ගෞතම බුදු සසුනේ ශ්‍රද්ධාවෙන් පැවිදි වූ භික්ෂූන් අතරින් අග්‍රතැන් ලබා බුදුරජාණන් වහන්සේගේ අසූ මහ රහතන් වහන්සේ අතර විසිඑක් වැනි ස්ථානයේ වැඩ සිටි සේක.

# දුටුගැමුණු රජතුමා ආරම්භ කර තිබෙන්නේ ඓතිහාසික ගමනක්

දුටුගැමුණු මහ රජතුමා

75 කොටස

**අමිතා පැමිණ සමන්තී, බෝධිනාග දෙදෙනාට වැඳ පිළිගත්තා ය. සිරිනාගට ආචාර කර සිනාවෙන් සංග්‍රහ කළා ය. කවුරුත් ඇගේ රූපලාවණ්‍යයෙහි පැහැදුණහ.**

ශාලාවෙහි අසුන්ගත් පිරිස සිරිනාගට ඇහුන්කන් දීමේ කැමැත්ත පළකළහ.

"එළාර රජතුමාගේ ධර්මිෂ්ට පාලනය නිසා දැන් සිංහල මිනිස්සු හරිම පැහැදීමකින් ඉන්නේ. ඔවුන්ට දැන් ඉතිහාසයත් අමතක වෙලා. මහා විහාරයට රහතන් වහන්සේ මහ පෙරහරකින් වැඩම කරලා. එළාර රජතුමාගේ සාධාරණ පාලනයට කැමැත්තෙන් පැමිණි බවටයි ආරංචිය පැතිර ගොස් තිබෙන්නේ. ඒත් එදා විහාරස්ථානවල තිබූ ශ්‍රී විභූතිය දැන් නැහැ. විහාර කුටි කඩාවැටිලා. ලෙන් ජරාවාස වෙලා. මේවා නැවත නගාසිටුවන්නට සිංහල බෞද්ධ රජ කෙනකුම එන්නට ඕනෑ."

"දුටුගැමුණු රජතුමා ආරම්භ කර තිබෙන්නේ ඓතිහාසික ගමනක්. ඒ ගමන් මාර්ගයේ මාර්ග සටහන් තමයි මහා සංඝරත්නයට පිරිනැමෙන විහාරස්ථාන, මහජනතාවට පිරිනැමෙන පූජ්‍යස්ථාන, විහාරමහා දේවිය පෙරමුණේ ගමන් කරමින් සංඝයා වහන්සේ වැඳ පුදා ගනිමින් එන මේ ගමන වන්දනා ගමනක් මිස යුද්ධයක් නොවෙයි. මහියංගනයේ දී වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය සඳහා ටික කාලයක් රැඳී සිටිනවාලු."

"එය යුද්ධ උපායක් විය හැකියි."

"බෝධිනාගත් තානායමේ වැඩට අමතරව දැන් මහා පින්කමක යෙදෙනවා. වෙනම ආහාර ගබඩාවක් සූදානම් කරනවා. කාගේත් අවධානය යොමු වූයේ බෝධිනාග දෙසට ය. ජයනාථ මහ සිටුතුමා මේ කියන්නට යන්නේ කුමක් ගැන ද? බෝධිනාගගේ සිතට ඉවසිල්ලක් නැත".

බෝධිනාගට අපේ කුඹුරුවල ගොවියන් ඉතාම කැමැතියි. ඔහු සතියකට වතාවක් ගොවියන් හමුවෙනවා. ඔවුන්ට උපදෙස් දෙනවා. බෝධිනාග නිසා ඔවුන්ගේ ගොවිතැන් සරුසාර වෙලා. මෙවර නියමිත කාලයට අස්වැන්න ලබාගෙන පිරිසුදුව ගබඩා කළා. ගොවියන්ට අපේ භාණ්ඩාගාරයෙන් වියදම් ගෙව්වා. මේ පිරවූ ගබඩා සියල්ල හිස් කරන්නේ දුටුගැමුණු රජතුමා යුද්ධයෙන් දිනුවාම මඟුල් කන්න."

"සමන්තී ද පුරවාගත් සතුටින් සිටුදේවිය දෙස බැලුවා ය. ඇයගේ මුහුණේ බියට පත් වූ බවක් පෙනිණි.

"සමන්තී මේ අයට දැන් රහස් කථා නැහැ. මිත්‍ර මහ සෙනෙවි සිටියා නම් මෙහෙම කතා ප්‍රසිද්ධියේ අසන්නට ලැබෙන්නේ නැහැ. ඇය කීවේ සිය බියට හේතු දක්වමිනි."

"ඒ වෙනුවට දැන් සිරිනාග ඉන්නවා."

බෝධිනාග කීවේ විහිළුවට මෙනි.

සමන්තී සිරිනාග ළඟට ගොස් ඔහුගේ හිස අතගෑවා ය.

"මගේ පුතා ඊට වඩා වෙනස් කෙනෙක්."

සමන්තී පැවසූ දෙයින් වඩාත් සතුටට පත්වූයේ අමිතා ය. ඇය දීප්තිමත් දෙනෙතින් සිරිනාග දෙස බලා සිටියේ ය.

"අපි අතර කිසිම රහසක් නැහැ. ඒත් අපේ රහස් තව ටික කලක් රැක ගන්නට ඕනෑ. මහ සිටුතුමා කීය."

"අමුත්තන් වෙනුවෙන් ම සැකසූ තල කැරලි සහ මී පැණි දිවුල් යුෂ තිබෙනවා. කැමැති ආකාරයකින් සංග්‍රහය භුක්ති විඳීමට පුළුවන්." සිටු දේවියට කීවා ය.

සංග්‍රහය උද්‍යානයේ එළිමහනේ පැවැත්විණි. තිසා වැව දෙසින් හමා එන මඳ සුළඟ නිසා පරිසරය සිසිල් විය. පරිසරය විඳ ගැනීමේ ආසාවෙන් කවුරුත් නැඟී සිටියහ.

සේවිකාවෝ දෙදෙනෙක් කිරිගරුඬ පලකයක් මත කැවිලි බඳුනක් ගෙනත් තැබූහ. පලකය වටා තිබුණු අසුන්වල කවුරුත් හිඳ ගත්හ. තල කැරැල්ලක් අතට ගත් සිරිනාග දිවුල් යුෂ බඳුනක් අනික් අතට ගත්තේ ය.

"මහ සිටුතුමනි, අද මාගමින් රහස් තල්පතක් ලැබුණා. දුටුගැමුණු සේනාව ළඟදීම මහියංගන බලකොටුවට පහරදීමට ගමන් අරඹන බව කියා තිබුණා. කසාතොටින් ගඟ තරණය කර එන්නේ විජිතපුරයට. ජය ගැනීමට අමාරු බලකොටුවක්. ඉන්පසු තිබෙන්නේ මහේල, ගිරිලක බලකොටු දෙක එළාර සහෝදරයන් දෙදෙනකුගේ බලකොටු"

"විජිතපුර බලකොටුව බිඳ ගත්තොත් අනුරාධපුර රාජධානිය ජය ගත්තා හා සමානයි."

මේ සඳහා අපට කළ හැක්කේ උපායන් කිහිපයක් යෙදීම පමණයි. දීඝාභය, උපතිස්ස දෙදෙනා විජිතපුර බලකොටුවෙන් පිටතට ගත හැකි නම් අපට ලොකු ජයක් අත්පත් කර ගත හැකියි.

"අද රාත්‍රී භෝජන සංග්‍රහයට මම කුණ්ඩල බ්‍රාහ්මණතුමාටත් ආරාධනා කළා. ප්‍රමාද වී හෝ පැමිණෙන බව කීවා. මේ ගැන අපි ඔහුත් සමඟ කතා කරමු.

"අනුරාධපුර ආහාර ගබඩාවල වගකීම මහ සිටුතුමාට පවරන්නට අද රාජ සභාව තීරණය කළා. එය ප්‍රතික්ෂේප නොකර බාරගන්න. මම ආයුධ ගබඩා භාරකරු.

"හැමදේම වෙන්නේ හොඳටයි" කියමින් සිරිනාග සිනාසුණේ ය.

"රට පුරාම විසිරී සිටි භික්ෂූන් වහන්සේ දැන් අනුරාධපුරයට වැඩම කරලා. අතීතයේ තිබූ ආගමික ශ්‍රී විභූතිය නැවතත් මතු වෙමින් තිබෙනවා. මේ වාසිය තමන්ට ඈඳාගන්නට තරම් එළාර රජු කපටියි."

අපිත් ළඟදීම තුන්දහසක පමණ භික්ෂූන් වහන්සේ වැඩම කරවා සාංඝික දානයක් පිරිනැමීමට කටයුතු සූදානම් කරමින් සිටිනවා. භික්ෂූන් වහන්සේ ටික දෙනයි රජගෙදර දානයට වඩින්නේ. බොහෝ භික්ෂූන් වහන්සේ පිණ්ඩපාතයට වඩිනවා. ආරාධනාවක් ලැබුණොත් ගෙවල්වලට යනවා. සාංඝික දානය අවසානයේ සිදුකරනු ලබන පුණ්‍යානුමෝදනාව ගැන එළාර රජුට භයක් ඇතිවෙලාලු.

සිරිනාග නැඟී සිටියේ ය.


"කුණ්ඩල බ්‍රහ්මණතුමා එන්නට තව පැයක්වත් ගතවේවි. මම කැමතියි පුස්තකාලයට ගොස් පොත් කියවන්න. බෝධිවංශ කාව්‍යයෙහි බුද්ධ චරිතය ඇතුළත් කවි පන්තිය හරිම රසවත්. ආධ්‍යාත්මික ගුණයන් ඇති කරන එබඳු කවි සමාජ යහපත සඳහා යොදා ගන්නට පුළුවන්."

"සිරිනාග හෙළඅටුවා පොතක් දෙකක් කියවන්න. ඒවාත් කවි. එම ගී අසා අපේ භික්ෂූන් වහන්සේ හැට නමක් රහත් වූ බව අටුවා පොත්වල සඳහන් වෙනවා.

මහ සිටුතුමාගේ කියමනෙන් ඉඩ ලද සිරිනාග සිටු මැදුරට පැමිණ පුස්තකාල කුටියට ඇතුළු විය.

අමිතා මුළුතැන් ගෙට ගියා ය. ඇය පිළිබඳ කතාව ඇරැඹුවේ සමන්තී ය.

අයන්ති විතාන



## නායක පදවි ලබති



කොත්මලේ නව තිස්පනේ තිස්පනේ කන්ද ශ්‍රී සම්බෝධි විහාරාධිපති විශ්‍රාමලත් පරිවේණාචාර්ය ශාස්ත්‍රපති සිවුරුපිටියේ සිරි සීවලී හිමිවහන්සේට මහා විහාර වංශික ස්‍යාමෝපාලී මහානිකායේ අස්ගිරි පාර්ශ්වයේ අතිගරු මහා නායක හිමිපාණන් වහන්සේ ප්‍රධාන කාරක සංඝ සභාව මගින් කොත්මලේ පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක පදවිය පිරිනමා ඇත.

ගම්පොල නාරංවිට පුරාණ විහාරාධිපතිව වැඩ සිටි අපවත් වී වදාළ අඹන්වල ශ්‍රී වනරතන මාහිමියන්ගේ හා උඩපළාත ප්‍රධාන අධිකරණ සංඝ නායක වරකාපනේ ශ්‍රී සෝරත නාහිමියන්ගේ ද පැවිදි ශිෂ්‍ය හිමි නමක් වන සිරිසීවලී හිමියෝ දැන උගත් ශික්ෂාකාමී භික්ෂූන් වහන්සේ නමකි.

## කතරගම අභිනවාරාම පුදබිමේ ඉදිකළ දුටුගැමුණු මහසෑය



ඓතිහාසික කතරගම පුදබිමේ පිහිටි ශ්‍රී අභිනවාරාමයේ අභිනවයෙන් ඉදිකළ දුටුගැමුණු මහාසෑය සැදැහැවතුන්ගේ වන්දනාවට පසුගිය 02 වැනිදා විවෘත වුණි.

විහාරාධිපති රුහුණු මාගම්පත්තුවේ ප්‍රධාන අධිකරණ සංඝනායක කතරගම ශ්‍රී අභිනවාරාමාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත කපුගම සරණතිස්ස නාහිමිගේ ඉල්ලීමක් මත අධිපති මහානාම විදානගමගේ ප්‍රේමදාස මහතා සහ එම මැතිණියගේ පූර්ණ ධන පරිත්‍යාගයෙන් ඉදිකෙරිණි.

නව චෛත්‍ය රාජයාණන් වහන්සේ විවෘත කිරීම මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක ධූරන්ධර සාහිත්‍ය චක්‍රවර්ති නියංගොඩ විජිතසිරි අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අතින් සිදුකෙරිණි.

මෙම අවස්ථාවට ශ්‍රී රෝහණ සංඝ සභාවේ මහානායක ධූරන්දර සිත්තම්ගල්ලෙන රාජමහා විහාරාධිපති අගලබඩ පියසිරි හිමි, කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති මහරගම නන්ද හිමි,රුහුණු මාගම්පත්තුවේ ප්‍රධාන සංඝ නායක කිරිවෙහෙර රාජමහා විහාරාධිපති කොබවක මාගම්පත්තුවේ ප්‍රධාන සංඝනායක කිරිවෙහෙර රාජමහා විහාරාධිපති කොබවක ධම්මින්ද හිමි, පැපිලියාන සුනේත්‍රාදේවි පිරිවෙන් රාජමහා විහාරාධිපති මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි යන හිමිවරුන් ප්‍රමුඛ මහා සංඝරත්නය ද, ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ තැන්පත් ප්‍රදීප් නිලංග දෑල, රුහුණු කතරගම මහා දේවාලයේ බස්නායක නිලමේ තැන්පත් ඩිෂාන් වික්‍රමරත්න ගුණසේකර යන මහත්වරු ද සහභාගි වූහ.

**ඩී.එස්. ගුණතිලක ඌව වෙල්ලස්ස විශේෂ**

## උපසම්පද ලබති



ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායට අනුබද්ධිත ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාව විසින් සංවිධානය කරනු ලැබූ වාර්ෂික උපසම්පදා විනය කර්මය පසුගිය ජුනි 18,19,20 යන දිනයන්හි දී අම්බලන්ගොඩ ,කහව ,ගල්දුව ශ්‍රී ගුණවර්ධන යෝගාශ්‍රම මූලස්ථානයට අයත් ඉඩම්තොට උදකුක්ඛෙප සීමා මාලකයේ දී සිදු විය.මෙහිදී ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධාන අනුශාසක පහළවිටිගල ශ්‍රී ජනානන්දාභිධාන හිමියන්ගේ උපාධ්‍යායත්වයෙන් බුත්තල බුදුගල් ලෙන ආරණ්‍ය සේනාසනාධිපති උඩුවර ධම්මරක්ඛිත මාහිමිගේ ශිෂ්‍ය බක්මීරුප්පෙ සාන්තදස්සන සාමණේරයන් වහන්සේ අධි සීල සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි පිහිටවනු ලැබූහ.

**මාදම්පේ සමූහ-ඒ.පී.ගුණරත්න**

## යතිවර හරසර වන්දනා



අපවත් වී වදාළ උප ප්‍රධාන අධිකරණ සංඝනායක රාජකීය පණ්ඩිත , ශාස්ත්‍රපති ත්‍රිපිටක විශාරද, සිරි ධම්මරතන ත්‍රිපිටක ධර්මායතනයේ හිටපු විහාරාධිපති පුලියද්දේ සුධම්ම නා හිමියන්ගේ වර්ෂ පූර්ණ පින්කම සැප්තැම්බර් 03 වැනි දින පැවැත්වීමට කටයුතු යොදා ඇත. රාත්‍රී 7.00 ට පොළොන්නරුවේ අරියධම්ම හිමියන්ගේ ධර්ම දේශනාවක් ද, එදින රාත්‍රී 9.00 සිට 10.30 දක්වා සුධම් රාජ මන්දිරයේ මඟුල් බෙර හා හේවිසි ශබ්ද පූජාවක් ද පැවැත්වේ. පසුදින මහා සංඝරත්නය සියක් නමක් උදෙසා සාංඝික දානමය පින්කමක් පැවැත්වෙන බව සිරි ධම්මරතන ධර්මායතනයේ දායක සභාව දන්වා සිටිති.

## බෙල්ලන්විල ඇසළ මහා පුණ්‍යෝත්සවය සහ මහ පෙරහර

බෙල්ලන්විල රාජමහා විහාරයේ ඇසළ පුණ්‍යෝත්සවය හා මහ පෙරහර මංගලය අගෝස්තු 10 වැනිදින ආරම්භ වී 28 දින දක්වා පැවැත්වේ.

මේ මස 10,11,12 දින බෙල්ලන්විල ශ්‍රී සෝමරතන නාහිමි සහ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනුනාහිමි ගුණානුස්මරණ ධර්ම දේශනා මාලාව, 14 - පිරිත් දේශනය ආරම්භය, 19 - සූත්‍ර දේශනා, 20 - දොරකඩ අස්න අනුශාසනාව, දේවදූත පෙරහර සහ කුඹල් පෙරහර, 22 - මල් පෙරහර, 24, මල් පෙරහර, 26 පාවාඩ පෙරහර, 27 රන්දෝලි මහා පෙරහර, 28- දියකපන පෙරහර හා දේව දානය පැවැත්වේ.

## පිහිට පතයි

අංක 1/3 උඩවෙල, අගලවත්ත යන ලිපිනයේ පදිංචි ස්වර්ණලතා පෙරේරා (62) යන අය දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඇයට ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බව ද කියයි. පරිත්‍යාගශීලින් වේ නම් 0768117029, 0717647231 දුරකතනයට දන්වන ලෙස ඉල්ලීමක් කරයි.



බේරුවල බදනාගොඩ පදිංචි බේරුවල අරියවංශ මහා විදුහලේ ජාතික පාසලේ සේවයේ නියුතු එම්. ජේමසිරි මහතා දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව කියයි. ඔහුට ඒ හෝ ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කළ හැකි අයකු වේ නම් 0710581752 හෝ 0713027663 දුරකතන අංකයට දැනුම් දෙන ලෙස ඉල්ලීමක් කෙරේ.

### බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන වස්සාන සදහම් දේශනා

සෑම ඉරිදාවකම රාත්‍රී 7.00 - 8.00 දක්වා අගෝ. 14 දියතලාවේ පියදස්සි හිමි, අගෝ. 21 සෝමපුර සිරි සුධම්ම හිමි, අගෝ 28 බොරලන්දේ වජිරඤාන හිමි, සැප් 4 තලල්ලේ චන්දකිත්ති හිමි, සැප්. 11 හසළක සීලවිමල හිමි, සැප්. 18 අගලකඩ සිරිසුමන හිමි, සැප්. 25 ඉඳුරාගාරේ ධම්මරතන හිමි, ඔක්. 02 ආචාර්ය මිරිස්සේ ධම්මික නා හිමි.

දුක් දොම්නස්වලින් පිරි කාලයක දහමින් සිත් සුවපත් කරගන්නට සියලු දෙනාට ආරාධනා.

### සිරි වජිරඤාණ ධර්මායතනය - මහරගම

වැඩිහිටි සීල සමාදාන පෙ.ව. 06.00-07.00 සිල් සමාදන් කරවීම සහ බුද්ධ පූජාව පැවැත්වීම, පණ්ඩිත ලග්ගල අසම හිමි පෙ.ව. 08.00-09.00 භාවනාව - රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පූජ්‍ය හක්මණ සුමනසිරි හිමිපාණෝ පෙ.ව. 09.00-10.00 ධර්ම දේශනාව - මාලේවන ධම්මවිජය හිමි (පෙර අනගාරික ධර්මසේකර) පෙ.ව. 10.00-11.00 සූත්‍ර දේශනාව- රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති පානදුර පසන්න හිමි පෙ.ව. 11.00-11.15 බුද්ධ පූජාව - දඹුලුවන සෝභිත හිමි, පූජ්‍ය බුත්තල ධම්මකුසල හිමි.

පෙ.ව. 11.15-12.15 දහවල් දානයට විවේකය ප.ව. 12.15-12.20 විශේෂ නිවේදන හා පුණ්‍යානුමෝදනාව ප.ව. 12.20-01.00 පිරිත් හා තෙරුවන් ගුණ- නාහිත හිමි, තලංගල්ලේ ධම්මරතන හිමි. ප.ව. 01.00-02.00 ධර්ම සාකච්ඡාව - ත්‍රිපිටකාචාර්ය වේරදුවේ මහින්ද හිමි. ප.ව. 02.00-03.00 ධර්ම දේශනය - උඩහමුල්ල පඤ්ඤේධාරාම වාසී ශාස්ත්‍රපති වල්ගම සුමන හිමි. ප.ව. 03.00-03.45

ධර්ම දේශනාව- බොරලැස්ගමුව නාගරුක්ඛාරාමාධිපති ශාස්ත්‍රවේදී පණ්ඩිත පඟුරේ නන්දාරාම නාහිමි. ප.ව. 03.45-04.00 ගිලන්පස විවේකය ප.ව. 04.00-05.00

ධර්ම දේශනාව - රත්මලාන මල්ලිකාරාමාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත රණස්ගල්ලේ ඤාණවීර හිමි. ප.ව. 05.00-06.00 ධම්ම පදය- ශාස්ත්‍රපති පණ්ඩිත වතුරගම ධම්මජීව හිමිපාණෝ. ප.ව. 06.00-06.30 බෝධිපූජාව සහ සිල් අලුත් කිරීම, මෙහෙයවීම - රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති හක්මන සුමනසිරි හිමි


## වාද්දුව ශ්‍රී දළදවත්ත පුරාණ මහා විහාරය

වාද්දුව තල්පිටියේ ශ්‍රී දළදාවත්ත පුරාණ මහා විහාරයේ 89 වන ශ්‍රී දළදා පූජෝත්සවය මේ මස 16 වැනි දින රාත්‍රී 9.00 පවත්වනු ලබන අතර, මහා පිරිත් දේශනයෙන් එය ආරම්භ වේ. 17 වැනි දින රාත්‍රී තිස් පැය තුනේ පිරිත් දේශනය 18 අලුයමින් අවසන් වේ. 18 වැනි දින තෙසැත්තෑ ඤාණ පූජා පින්කම පවත්වන අතර 19 දින රාත්‍රී 7.00ට විශේෂ ධර්ම දේශනයකි. 20 වැනි දින රාත්‍රී 7.00 ට අලි, ඇතුන්, බෙර හේවිසි, පන්තේරු, වෙස්නැටුම්, ධජ පතාක සමන්විතව පවත්වනු ලබන මහා පෙරහර වීථි සංචාරය කෙරේ.

**වාද්දුව සංචාරක**

### වේප්පන්කුලම ශාක්‍යසිංහාරාමය

ත්‍රිකුණාමලය, මොරවැව, කිතුල්උතුව, වේප්පන්කුලම, ශ්‍රී ශාක්‍ය සිංහාරාම විහාරස්ථානයේ පැවිදිවීම පිණිස කුලදරුවන් කීප දෙනෙකුට විහාරාධිපති හිමි කාරුණිකව ඇරයුම් කරයි.



# කුරුන්දි විහාරයේ සංරක්ෂණයට යළි මඟ විවර කෙරේ

**කුරුන්දි අටුවාව ලියූ ස්ථානය කුරුඳුමලේ එහෙමත් නැත්නම් කුරින්දි විහාරය යි. කුරුන්දි විහාරයේ වටිනාකම නිසාම එහි විනාශ වී ගිය උරුමය යළිත් නඟා සිටුවීමට කටයුතු කෙරුණා.**

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට එම කටයුතු සිදු කරන්නට මූල්‍ය ප්‍රතිපාදන නිසි පරිදි නොමැතිවීම නිසා සංරක්ෂණ කටයුතු අඩපණ වන ලකුණු පෙනෙන්නට වුණා. එහෙත් අපේ දහම රැක ගන්නට වෙහෙසෙන බොහෝ පිරිස් අදත් අප අතර වනවා. එවන් පින් කැමැත්තෙක් මේ කාර්යයට දායකත්වය ලබා දුන්නා. ඒ අනුව කුරින්දි විහාරයේ සංරක්ෂණ කටයුතු සිදු කෙරුණත්, අපට පසුගිය දිනවල අසන්නට දකින්නට ලැබුණේ දුක සන්තාපය උපදවනා සිදුවීම් කිහිපයක්.

පසුගිය පොසොන් පුර පසළොස්වක පොහෝ දින කුරුන්දි විහාරයේ ධාතු නිදානෝත්සවය යෙදී තිබුණු දින යි. එදින මහා සංඝරත්නයේ ආශිර්වාද මැද සෙත් පිරිත් සජ්ඣායනා සිදු කර ධාතු නිධන් කිරීමට කටයුතු යොදා තිබුණේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ ද සහභාගිත්වයෙන්. එහෙත් එම කටයුතු සිදු කිරීමට පිරිසක් බාධා සිදු කළා.

ධාතු නිදානෝත්සවයෙන් බලාපොරොත්තු වූයේ වැළලී ගිය හෙළ උරුමය යළි ගොඩ නැංවීමයි. ආගමික වශයෙන් වන්දනා මාන කරන්නේ එක් ආගමිකයන් පිරිසක් වුව ද එම ස්ථාන රැක ගැනීම සියලු ජාතිකයන්ගේ ම වගකීමකි.

එහෙත් පටු අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කටයුතු කළ පිරිසක් නිසා එම අවස්ථාවේ ඇති වූ දැඩි උණුසුම් තත්ත්වය මත පුරාවිද්‍යා කොමසාරිස් ජෙනරාල් මහාචාර්ය අනුර මනතුංගයන් විසින් අදාළ පින්කම නවත්වා දැමීමට කටයුතු කළා.

අධිකරණ නියෝගයකට අනුව වසර දහස් ගණනක් පැරැණි කුරින්දි විහාරය ඩෝසර් කළ යුතුව තිබුණා. එහෙත් පුරාවිද්‍යා කොමසාරිස් ජෙනරාල් මහාචාර්ය අනුර මනතුංග නීතිපතිවරයා හමු වී සිදුවීම පැහැදිලි කළා. පසුව නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුරාවිද්‍යා කොමසාරිස් ජෙනරාල් අනුර මනතුංගයන් ද සමඟ මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණයට ගොස් ජූලි 20 වැනිදා මහේස්ත්‍රාත්වරයා හමුවේ කුරින්දි විහාරයේ පුරාවිද්‍යාත්මක කරුණු ගෙන හැර දැක්වූවා. එම කරුණු දැක්වීමෙන් පසුව මුලතිව් මහේස්ත්‍රාත් ආර්. සරවනරාජා මහතා විසින් තීරණය කෙළේ අදාළ ඉදිකිරීම් පරීක්ෂා කළ යුතු බවයි.

කුරුන්දි පුරාවිද්‍යා සංරක්ෂණ වැඩබිම හා අවට පරීක්ෂා කළ මහේස්ත්‍රාත්වරයා විසින් පසුව එහි ඇති නටබුන් මෙන්ම අනෙකුත් පුරාවිද්‍යා ස්මාරක ද හොඳින් පරීක්ෂා කළා. පුරාවිද්‍යා නිර්දේශ ද සලකා බැලුවා.

ඒ අනුව තමන් විසින් පෙර නිකුත් කර තිබූ කුරුන්දි විහාරයේ ඉදිකිරීම් නවතා එය කඩා ඉවත් කිරීමේ නියෝගය බලරහිත කරන්නට විනිසුරුවරයා කටයුතු කළා. එපමණක් නොව එහි කටයුතු පෙර පරිදි සිදු කරන්නට ද අවශ්‍ය කටයුතු සලසා දුන්නා.

අධිකරණ තීන්දුව ලැබුණේ ඉදිරි පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු නිසි ලෙසින් කරගෙන යාමට හැකිවන පරිදි යි.

පුරාවිද්‍යා කොමසාරිස් ජෙනරාල් මහාචාර්ය අනුර මනතුංගයන් පවසන්නේ කලකට පෙර ගොනු කළ නඩුවකට අනුව එහි ඉදිකිරීම් ඉවත් කරන්නට අධිකරණ නියෝගයක් ලැබුණ ද දෙපාර්තමේන්තුව කටයුතු කරන්නේ පුරාවිද්‍යා පනතට අනුව බවයි. කුමන බාධා පැමිණියත් පුරාවිද්‍යා සංවර්ධන කටයුතු නොනවත්වන බවද ඔහු පැවසුවා.

කුරුඳුමලේ විහාරයේ සංරක්ෂණයට වැඩි දායකත්වයක් ලබා දුන් බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල මහතා ද පැවසුවේ සමස්ත ජාතියම වෙනුවෙන් කුරින්දි විහාරය යළි පණ ගන්වන්නට ලැබීම සතුටක් බවයි. අධිකරණය විසින් ලබා දුන් තීන්දුව අධිකරණය විසින් ම වෙනස් කළේ ද පුරාවිද්‍යා පනතට අනුව සියලු ඉදිකිරීම් කර තිබූ නිසා බව ද ඔහු පෙන්වා දුන්නා.

කුරින්දි රාජමහා විහාරාධිපති ගල්ගමුවේ ශාන්තබෝධි හිමියන් පවසන්නේ කුරින්දි යනු සමස්ත ජනතාවගේ ම උරුමයක් බවයි. මෙරට එකම කබොක් ස්තූපය වන කුරින්දි රැක ගැනීම අප හැමගේ උරුමයක් බවත් උන් වහන්සේ පෙන්වා දෙනවා.



කුරුන්දි රාජමහා විහාරාධිපති ගල්ගමුවේ ශාන්තබෝධි හිමි



පුරාවිද්‍යා කොමසාරිස් ජෙනරාල් මහාචාර්ය අනුර මනතුංග මහතා



බෞද්ධාලෝක පදනමේ සභාපති ජගත් සුමතිපාල මහතා

✍ තාරක වික්‍රමසේකර

## කුරුන්දි විහාරය රැක ගත යුතු ඇයි?

මීට පෙර හමුව නැති පද්මාකාර හැඩයෙන් යුත් කබොක් ගලින් නිම කරන ලද කුරුඳු විහාරයීය දාගැබ අක්කර 75ක් වන භූමියක ස්ථාපිත ය.

ජනප්‍රවාදවලට අනුව බුදුරජාණන් වහන්සේගේ දෙවැනි ලංකා ගමනය වූ නාගදීපයට වැඩම කළ අවස්ථාවේ දී කුරුඳුමලේ විහාරය පිහිටි කඳු සහිත භූමියට වැඩම කොට ඇත. බල්ලාටනාග රජු විසින් ක්‍රි.ව. 100 -103 අතර කාලයේ දී කුරුන්දාවශෝක විහාරය තනා ඇති බවට පුරාවිද්‍යා සාක්ෂ්‍ය තිබෙන බව පුරා විද්‍යා චක්‍රවර්ති එල්ලාවල මේධානන්ද හිමියෝ පවසති.

කුරුන්දාවශෝක විහාරය කුරුන්දපාසක විහාරය නමින් ද මහා වංශයේ සඳහන් වන බවත්, පසුකලෙක පළමුවැනි අග්බෝ රජු හා පළමුවැනි විජයබාහු රජු එහි සංවර්ධන කටයුතු සිදු කර ඇති බවත් උන් වහන්සේ පවසති.

අඩි 68ක් දිගකින් හා අඩි 64ක් පළලින් යුක්ත ප්‍රාකාරයකින් වට වූ ස්තූපයේ උස අඩි 45කි. එහි විෂ්කම්භය අඩි 42කි. මේ සිද්ධස්ථානයට පිළිම ගෙයක්, උපෝසථාගාරයක්, සදකඩපහන ආදිය ඇතුළත් වන අතර, ජල අවශ්‍යතා සපුරා ගැනීම පිණිස පහළින් පිහිටි වැවට අමතරව කඳු මුදුනේ විශාල පොකුණක් ද ඉදි කර තිබේ.

සිවුවැනි උදය රජතුමා විසින් මේ සම්බන්ධව සොයා බැලූ බවට පැරැණි සාධක තිබෙන අතර ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ක්‍රිස්තු වර්ෂ 10 හෝ 11 පමණ දක්වා සංවර්ධනය වෙමින් පැවති ආගමික ස්ථානයක් ලෙස කුරින්දි විහාරය හඳුන්වා දිය හැකි ය.

මේධානන්ද හිමියන්ගේ මතයට අනුව අටුවා ලියන සමයේ කුරින්දි අටුවාව ලියූ ස්ථානය කුරින්දි විහාරය ලෙසින් හඳුන්වා ඇත. මෙහි රහතන් වහන්සේ මෙන්ම ත්‍රිපිටකධර ස්වාමීන් වහන්සේ වැඩ සිටි ස්ථානයක් බවට බොහෝ සාධක ඇති බව ද උන් වහන්සේ පවසති.

මෙවන් සාධක රැසකින් යුත් කුරුන්දි විහාරය ඉතා සුළු පිරිසකගේ උසි ගැන්වීම මත අකර්මන්‍ය වීමට සැලැස්වීම කිසිසේත් ම සුදුසු නොවේ. ඉදිරියේ දී පුරාවිද්‍යා පනතට අනුව එම භූමියේ සංරක්ෂණ කටයුතුවලට බාධා කරන අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කළ යුතු ය. එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කළ යුතුම කාර්යයකි. එසේ නොවුණහොත් ඉදිරියේ දී මේ ජාතිවාදී පිරිස් විසින් තම තමන්ට අවශ්‍ය පරිදි ඉතිහාසය ද වෙනස් කරමින් ජනතාව අතර වෛරය පැතිරවීමට කටයුතු කරනු ඇත. එය නැවත ජනතා අසමඟියක් ඇති කරවන්නක් විය හැකි ය.



**හක්මන ඇල්ලේවෙල ශ්‍රී අශ්වත්ථාරාම පුරාණ විහාරයේ අභිනව විහාර මන්දිරයේ පිළිම වහන්සේ සඳහා නේත්‍රා ප්‍රතිෂ්ඨාපනය කොට සැදැහැවතුන්ගේ වන්දනාමාන සඳහා විවෘත කිරීම මෙම මස 12 වැනි දින සිදු කෙරේ.**



# ඇල්ලේවෙල ශ්‍රී අශ්වත්ථාරාම පුරාණ විහාරය

**මාතර දිස්ත්‍රික්කයේ කන්දබඩ පත්තුවට අයත් ඇල්ලේවෙල ග්‍රාමයේ පිහිටි පෞරාණික බෝධීන් වහන්සේ ඇසුරෙහි ශ්‍රී අශ්වත්ථාරාම පුරාණ විහාරය ආරම්භ වී ඇත.**

දුරාතීතයේ ගැමියන්ගේ වන්දනාමාන, පුදපූජා හා බාරහාර කටයුතු සිදු කිරීමට යොදා ගත් මෙම ස්ථානයේ මහනුවර යුගයේ ගණින්නාන්සේලා වැඩ සිටි බව ජනප්‍රවාදගත ව පවතී.

ඇසතු බෝ රුක ඇසුරෙහි පිහිටි විහාරස්ථානය යන අරුත් දෙමින් අශ්වත්ථාරාමය වශයෙන් මෙම ස්ථානයේ විහාරස්ථානයක් ආරම්භ කරවන ලද්දේ මූලගිරි සඟ පරපුරට අයත් ඇල්ලේවෙල උපනන්ද මාහිමිපාණන් වහන්සේ විසිනි.

වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් දල්වාලූ ධර්ම ශාස්ත්‍රාලෝකයෙන් පහතරට ඒකාලෝක කිරීමට දායකත්වය ලබා දුන් මූලගිරි රාජමහා විහාරාධිපති වටරග්ගොඩ ධම්මපාල මාහිමිපාණන් වහන්සේ මූලගිරි සඟ පරපුරෙහි ආදි කර්තෘවරයාණන් වහන්සේ වෙති.

වටරග්ගොඩ මාහිමියන්ගේ සිව්වන ශිෂ්‍ය ගංගොඩගම දේවරක්ඛිත හිමියෝ ගුරු දේවයන් ඇවෑමෙන් මූලගිරි විහාරාධිපතීත්වයට පත් වූහ. හබරාදූවේ සෝභිත හිමියෝ ගංගොඩගම හිමියන්ගේ ද්විතීය ශිෂ්‍යවරයාණ වූ අතර කිරම සෝණුත්තර සහ කෝන්ගල සුමන හිමිවරුන්හට ආචාර්යවරයා වූහ. කිරමකෝන්ගල දෙහිමිවරුන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය වූවෝ ඇල්ලේවෙල උපනන්ද හිමියෝ ය.

ඇල්ලේවෙල උපනන්ද මාහිමියන්ට පසු තත්ශිෂ්‍ය බෙරුවේවෙල සරණතිස්ස හිමියන් හා නාරන්දෙණියේ ධම්මරතන හිමියන් මෙහි වැඩ සිටිමින් කාලානුරූපීව විහාරාංග ඉදිකරමින් විහාරස්ථානයකින් ඉටු විය යුතු ශාසනික කටයුතු සිදු කළහ.

නාරන්දෙණියේ ධම්මරතන හිමියන්ගේ ශිෂ්‍ය වූ ශාස්ත්‍රාචාර්ය, පණ්ඩිත කෝංගල පඤ්ඤතිස්ස හිමියන් විහාරස්ථානයේ නූතන නවෝදයේ ආදිකර්තෘවරයන් වහන්සේ වශයෙන් හඳුන්වා දිය හැකි ය.

මෙසේ සියලු විහාරාංග ඉදි කරවමින් විහාරස්ථානය සකලාංග පරිපූර්ණත්වයට පත් වෙමින් පැවතිය ද විහාර මන්දිරයක අඩුපාඩුව පැවතුණි.

පඤ්ඤතිස්ස මාහිමියන්ගෙන් පසු අශ්වත්ථාරාම පුරාණ විහාරය, බෙරුවේවෙල සෞගතාරාම පුරාණ විහාරය හා දෙනගම මුණසිංහාරාමය යන විහාරයන්හි ආධිපත්‍යයට පත් වූයේ කොළඹ ආනන්ද විද්‍යාලයේ සහකාර විදුහල්පති ධුරය හෙබවූ, දක්ෂිණ ලංකාවේ සමථබල සම්පන්න ප්‍රධාන අධිකරණ සංඝ නායක ශාස්ත්‍රපති අතපත්තුකන්ගේ ආනන්ද නාහිමිපාණන් වහන්සේ කොළඹ 06 සාමවිහාරය ගොඩනංවන අතර, මෙම විහාරස්ථානයන්හි අභිවෘද්ධිය පිණිස ද ක්‍රියාත්මක වූහ.

බෙල්ලන්විල රාජමහා විහාරස්ථානයේ වැඩ සිටිමින් ලද පන්නරය ඔස්සේ අතපත්තුකන්දේ ආනන්ද නාහිමිපාණන් වහන්සේ විසින් මුල් කාලයේ ප්‍රදේශවාසී සැදැහැති දායක කාරකාදීන්ගේ උපකාර මත ද ඉනික්බිතිව ස්වකීය හිතෛෂී දායකවරයකු වූ ව්‍යාපාරික විරාජ් පෙරේරා මැතිතුමාගේ සහ මධුවන්ති පෙරේරා මැතිණියගේ ධනව්‍යයෙන් ශාන් ලියනගේ නම් වූ නිර්මාණ ශිල්පියාගේ දක්ෂතා උපයෝගී කර ගනිමින් ඇල්ලේවෙල මහා විහාර කර්මාන්තයෙහි වැඩ ආරම්භ කළහ.

විහාරාධිපති නාහිමියන්ගේ අනුශාසනා පරිදි විහාරාධිකාරී වඳුරඹ රතනසාර හිමියන්ගේ මූලිකත්වයෙන් පඤ්ඤතිස්ස හිමියන් ඉදි කළ මන්දිරයේ බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදි කරවා ඊට අතිරේක වශයෙන් මෛත්‍රී බෝධිසත්ව ප්‍රතිමාවක් ද, සම්බුද්ධ ශාසනයේ ප්‍රථමයෙන් මාර්ගඵලලාභී වූ, චිරරාත්‍රඥයන් අතර අගතැන් ලද අඤ්ඤකොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේගේ ප්‍රතිමාවක් ඉදි කොට විසිතුරු මල්කම්, ලියකම් හා සිතුවම් නිර්මාණය කරවා අලංකෘත කොට ඇත.

බෙල්ලන්විල රාජමහා විහාරයේ බිතුසිතුවම්වලට සමාන වූ ශෛලියකින් මෙහි සිතුවම් නිර්මාණය කොට තිබීම විශේෂත්වයකි.

අභිනව විහාර මන්දිරයේ ප්‍රතිමා වහන්සේලාගේ නේත්‍ර ප්‍රතිෂ්ඨාපනය කොට අගෝස්තු මස 12 වැනි දින සියම් මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක, සාහිත්‍ය චක්‍රවර්තී, අග්ගමහා සද්ධම්මජෝතිකධජ, ආචාර්ය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ෂිත විජිතසිරි අනුනාහිමිපාණන් වහන්සේ විසින් නිරාවරණය කොට සැදැහැවතුන්ගේ වන්දනාමාන සඳහා විවෘත කිරීමට නියමිත ය.

**දිමුතු පුන්සර කොළඹගේ**



වර්ෂ 2022 ක් වූ අගෝස්තු 11 බ්‍රහස්පතින්ද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.